***2016 සැප්තැම්බර් මස 27 වෙනි අඟහරුවාදා දින***
***2016 செப்டெம்பர் மாதம் 27 ஆம் திகதி வியாழக்கிழமை***
***Thursday 27th September 2016***

ගරු සභාපති කංචන ජයරත්න මැතිතුමාගේ මූලාසනාරූඪත්වයෙන් පෙ.ව.10.00 ට සභාව රැස්විය.

கௌரவ தவிசாளர் - கஞ்சன ஜயரத்ன அவர்களின் தலைமை வகித்தார்கள் மு.ப. 10.00 மணிக்கு சபைக் கூடியது.

The Council met at 10.00 a.m Hon.Chairman Kanchana Jayarathna preside the Chair

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

-------------------------------------------------------------

සියළු දෙනාටම සුභ උදෑසනක් වේවා! ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, ගරු අමාත්‍යතුමන්ලා ගරු විපක්ෂනායකතුමා ප්‍රමුඛ ගරු මන්ත්‍රීතුමන්ලා සහ ගරු මන්ත්‍රීතුමියගෙන් අවසරයි. අද දිනට න්‍යායපත්‍රානුකූලව සභාවේ වැඩ කටයුතු ආරම්භ කිරීම සඳහා පළමුව තිබෙන්නේ,

**අභිනව මන්ත්‍රීවරුන්ගේ ප්‍රතිඥා හා දිවුරුම්දීම්:**

මේ යටතේ කිසිවක් නැහැ.

**ගරු ආණ්ඩුකාරතුමාගෙන් ලැබෙන සංදේශ:**

මේ යටතේ කිසිවක් නැහැ.

**ගරු සභාපතිතුමාගේ නිවේදන :**

මේ යටතේ කිසිවක් ලැබී නැහැ.

**නොපැමිණ සිටීමේ අවසර පිළිබඳ යෝජනා:**

කාටවත් නිවාඩු අවශ්‍ය නෑ. ස්තූතියි.

**ලිපි ලේඛන පිළිගැන්වීම :**

ආණ්ඩුකාරතුමාගේ කාර්යාලය, හා ප්‍රධාන ලේකම් කාර්යාලය ඇතුළත් අමාත්‍යාංශයක් යටතට ඇතුළත් නොවන විසර්ජන ශීර්ෂ සඳහා වන විස්තරාත්මක විගණකාධිපති වාර්තාව - පළමු කාණ්ඩය - 2015 යන විගණකාධිපති වාර්තාව,

සබරගමුව පළාත් සභාවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව,

සබරගමුව පළාත් සභාවේ විසර්ජන ශීර්ෂය - 820 දරන පළාත් මාර්ග සංවර්ධනය,ග්‍රාමීය යටිතල පහසුකම්, සංචාරක සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ පළාත් දෙපාර්තමේන්තු පිළිබඳ විස්තරාත්මක විගණකාධිපති වාර්තාව - හයවන කාණ්ඩය -

2014 යන විගණකාධිපති වාර්තා සභාගත කරනවා. ඒ විගණකාධිපති වාර්තා සියල්ලම පිටපත් ඔබතුමාට ලැබීමට සලස්වන අතරම ගිණුම් කාරක සභාව වෙත යොමු කිරීමට කටයුතු කරනවා.

**කාරක සභා වාර්තා පිළිගැන්වීම :**

කිසිවක් ලැබී නැහැ.

**පෙත්සම් :**

පෙත්සම් යටතේ කිසිවක් ඉදිරිපත් වී නැහැ.

**ප්‍රශ්න :**

ගරු අජිත් කුමාර මැද්දෙගම මැතිතුමා විසින් ඉදිරිපත් කර ඇති 6/1/2016/13 දරණ ප්‍රශ්නය සඳහා ගරු ඇමතිතුමා.

***ගරු අමාත්‍ය රංජිත් බණ්ඩාර මැතිතුමා.***
***கௌரவ அமைச்சர் ரஞ்ஜித் பண்டார***
*Hon. Minister Ranjith Bandara*
--------------------------------------------------------

ගරු සභාපතිතුමනි ලිඛිතව ඉදිරිපත් කරලා තියෙනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
--------------------------------------------------------

සමාවෙන්න ඕනේ ගරු ඇමතිතුමා දැන් ගරු සභාවේ සියළු දෙනාගේම ඉල්ලීම් කරනවා ප්‍රශ්න ඉදිරිපත් කරන කොට අපිට පැහැදිලිවම ඉදිරිපත් කරන්න වාචිකවද,ලිඛිතවද කියලා. දැන් සමහර වෙලාවට ඇමතිතුමන්ලා අපහසුතාවයට පත් වෙනවා වාචිකවද ලිඛිතවද කියලා නැති වුණහම එතුමන්ලා ලිඛිතව පිළිතුරු එවනවා. ඔබතුමන්ලා වාචිකව පිළිතුරු අහනවා. එතකොට මම අපහසුතාවයට පත් වෙනවා අනිත් පැත්තට.

***ගරු අමාත්‍ය රංජිත් බණ්ඩාර මැතිතුමා.***
***கௌரவ அமைச்சர் ரஞ்ஜித் பண்டார***
*Hon. Minister Ranjith Bandara*
--------------------------------------------------------

ගරු සභාපතිතුමනි මේකේ අහලා තියෙන්නේ ලිඛිත පිළිතුරු අපේක්ෂාවෙන්. වාචිකව අවශ්‍ය නම් මට දෙන්න පුළුවන්.

දුෂ්කර ගම්මානයක් තෝරාගෙන ඒ ගම්මානය සංවර්ධනය කරන ආකාරය පිළිබඳව අහලා තියෙන්නේ.

01. මෙම දිළිඳු ග්‍රාම නිළධාරී වසම් තෝරා ගැනීමේදී ඔබතුමාගේ නිළධාරීන් විසින් උපයෝගී කර ගන්නා නිර්ණායක මොනවාද? ඒකේ පැහැදිලිවම එකේ අපි පිළිතුරු දෙන්නේ පිවිසුම් මාර්ග අවම පහසුකම් යටතේ ජල පහසුකම්, සනීපාරක්ෂක

02. පහසුකම් ,බහුකාර්යය ගොඩනැගිලි සංවර්ධනය ,සුසාන භූමි සංවර්ධනය හා පෙර පාසැල් සංවර්ධනය කියන පිළිතුර.

03. එම ග්‍රාම නිළධාරී වසම් තෝරා ගැනීමේදී දේශපාලන බලපෑම් මත සිදු කර ඇති බව පිළිගන්නේද? නැත.

04. ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය මත හෝ වෙනයම් ක්‍රමවේදයකට ප්‍රදේශයේ දිළිදු හෝ සංවර්ධනය අඩු ග්‍රාම නිළධාරී වසම් තිබියදී, එම ස්ථාන තෝරා නොගෙන නගරයට ආසන්න හෝ අර්ධ නාගරික ප්‍රදේශ නියෝජනය කරන ග්‍රාම නිළධාරී වසම් තෝරාගෙන ඇති බව ඔබතුමා දන්නේද? එහෙම තෝරා ගෙන නැත.

05. එසේ කිරීමේදී අප පළාත තුළ සංවර්ධනය අඩු ප්‍රදේශවල ජීවත්වන ජනතාවට අසාධාරණයක් වන බව ඔබතුමා පිළිගන්නේද? එසේ තෝරාගෙන නොමැති නිසා නැත.

06. එසේ වැරදි තොරතුරු මත තෝරා ගෙන ඇති වසම් සංශෝධනය කරන්නේද? එහෙම පිළිතුරු නැත.

07. වැරදි තොරතුරු මත වසම් තෝරා ගෙන නැත. පරිපූරක ඇස්තමේන්තුවක් මගින් මෙම ව්‍යාපෘති සඳහා මුදල් වෙන් කරන නිසා මෙම ව්‍යාපෘති සංශෝධනය කළ නොහැකි. වර්ෂය අවසානයේදී අවිච්ඡේද කිරීමට නොහැකි නිසා මෙම වර්ෂයේ මේවා අවසන් කළ යුතුයි දෙසැම්බර් 31 වෙනිදා වෙන කොට. ඒ නිසා සංශෝධනය කළ නොහැකියි.

*ගරු මන්ත්‍රී අජිත් කුමාර*
*கௌரவ உறுப்பினர் அஜித் குமார*
*Hon.Member Ajith Kumara*

-----------------------------------------------------------

ගොඩකවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගම්මානය තෝරා ගැනීමේදී පළමුවෙන්ම තෝරා ගෙන තිබුණේ අපි දන්න විදිහට ඔබතුමාගේ අමාත්‍යාංශයේනුත් තොරතුරු අනුව තුම්මොල්ලිගොඩ කියන ග්‍රාමය. තඹගමුව ග්‍රාම සේවක වසම මම දන්න හැටියට. එය පසුව සංශෝධනය වෙලා තියෙනවා. දැන් ඔබතුමාගේ පිළිතුරේ හැටියට සංශෝධනයක් වෙන්න බැහැයි කියලා කිව්වත් ඒක සංශෝධනය වෙලා තියෙනවා. ඒ පළවෙනි ග්‍රාම නිළධාරී තුමා කැඳවලා සාකච්ඡා කරලා තියෙනවා. ඉතා දුෂ්කර තැනක් අපේ අතුල කුමාර රාහුබද්ධ ඇමතිතුමාත් දන්නවා තුම්මොල්ලිගොඩ. ඒක දැනට තෝරා ගෙන තියෙන්නේ . හැබැයි ඔබතුමා දිළිඳු ග්‍රාම සේවක වසමක් හැටියට තෝරා ගෙන තියෙන්නේ ප්‍රදේශයේ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාත් පදිංචි ඒවගේම අපේ ගරු පළාත් සභා මන්ත්‍රී අලගියවන්න මන්ත්‍රීතුමා පදිංචි වසම. තුම්මොල්ලිගොඩ ග්‍රාමය වසම තඹගමුව නැගෙනහිර වගේ මට මතක ඉතාම දුෂ්කර ගම්මානයක්. ගමට යන්න පාරවල් තුනක් තියෙනවා. එකකින්වත් යන්න බෑ. ග්‍රාමීය පාරවල්. පන්සල තියෙනවා බොහොම දුෂ්කරයි. ප්‍රජා ශාලාවක් නෑ. සුසාන භූමියක් නෑ. සකස් කරලා. මේක තෝරා ගෙන පළවෙනි සාකච්ඡාව කරලා ඔබතුමාගේ පිළිතුර

හැටියට සංශෝධනය වෙන්න බැහැ කියලා කිව්වත් නමුත් සංශෝධනය වෙලා

තියෙනවා. මම කියන්නේ ගොඩකවෙලට ආසන්නම තියෙන ග්‍රාම සේවක වසම අපි තෝරා ගත්ත එක හරිද. නැත්නම් තුම්මොල්ලිගොඩ මේකෙන් අයින් කර ගත්ත එක හරිද කියන එක තමයි තියෙන ප්‍රශ්නය.

***ගරු අමාත්‍ය රංජිත් බණ්ඩාර මැතිතුමා.***
***கௌரவ அமைச்சர் ரஞ்ஜித் பண்டார***
*Hon. Minister Ranjith Bandara*

----------------------------------------------------------------

මෙම වසම් තෝරා ගැනීමේදී රත්නපුර දිස්ත්‍රික්කයේ අපි තෝරා ගත්ත නිර්ණායක ග්‍රාම සංවර්ධන සමිති. මොකද මේ මුදල් පැහැදිලිවම අපි වෙන් කළේ ග්‍රාම සංවර්ධන සමිති හරහා තමයි ව්‍යාපෘතිං අපි ක්‍රියාත්මක කරන්නේ. බොහෝ කාලයක් අක්‍රිව පැවති ග්‍රාම සංවර්ධන සමිතිවලට උත්තේජනයක් හැටියට පළාත් සභාව මගින් ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය හරහා අපි මිලියන පහක මුදලක් වෙන් කළා මේ දුෂ්කර ගම්මාන අපි ඒ නිර්නායකයන් තුළ දැක්ක දෙයක් තමයි සමහර අපි දේශපාලනය කරන අපිට වැඩි හරියක් ඡන්දය තියෙන ප්‍රදේශයට වැඩි හරියක් සලකනවා. නමුත් මේ වර්තමාන රජයේ ගරු ජනාධිපතිතුමාගේත් ගරු රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යතුමාගේත් සංකල්පයක් වුණා සැමට එක හා සමානව සැලකීම කියන තේමාව අරගෙන තමයි අපි ග්‍රාම සංවර්ධන සමිති වලට තමයි මේ වසම් තෝරා ගැනීමේ අයිතිය ලබා දුන්නා සහ ඒ අයගේ ඉදිකිරීමේ අයිතියත් ඒ ග්‍රාම සංවර්ධන සමිතිය හරහා දුන්නා. එහෙම නැතුව වෙනත් සමිති වලට මේවා භාර දෙන්නේ නෑ. එතනදී යම්කිසි ග්‍රාමයක් තෝරාගෙන ඒ ග්‍රාම තෝරා ගන්නට අපි ග්‍රාම සංවර්ධන සමිතියට කිව්වහම ඒ සමිතිය නිළධාරීන් ඒ වසම් තෝරා ගන්න පටන්

ගන්නවා. ඒකෙදී අපිට මැදිහත් වෙන්න සිද්ධ වුණා නිළධාරීන්ට අවශ්‍ය දේ නෙමෙයි මහජනතාවට අවශ්‍ය දේ සිදු විය යුතුයි. එහෙම නිසා තමයි එහෙම දෙයක් සිද්ධ වෙලා තියෙන්නේ. ඒ නිසා අපි මේ සංවර්ධන ව්‍යාපෘතිය මේ වර්ෂයේ පමණක් නෙමෙයි ලබන වර්ෂයේත් ක්‍රියාත්මක කරනවා. ඒ නිසා අපිට ඒ සඳහා අපිට මේ සඳහා සැලකිල්ලට ගන්න පුළුවන් කියන කාරණාව මේ අවස්ථාවේදී මම සභාවට මතක් කරනවා.

***ගරු මන්ත්‍රී අජිත් කුමාර***
***கௌரவ உறுப்பினர் அஜித் குமார***
*Hon.Member Ajith Kumara*

----------------------------------------------------------------

ගරු සභාපතිතුමනි වැලිගෙපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තෝරා ගත්ත ගල්පාය කියන ග්‍රාම සේවක වසම ඔබතුමා ගිහිල්ලා ඒ අවශ්‍ය සංවර්ධනයට තෝරා ගෙන තියෙනවා. ඒ යෝජනාව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කරලා සුදුසුයි කියලා සම්මතයක් ගත්තා. හැබැයි මේ ගොඩකවෙල ප්‍රාදේශීය සේවා වසම කවුරුත් තෝරා ගෙන තිබුණේ නෑ. ඕපනායක නම් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට තෝරා ගෙන ඒකත් මොන විදිහ වෙයිද කියලා මම දන්නේ නෑ. වැලිගෙපොල නම් යෝජනාව ගෙනාවා අනුමත කර ගන්න. සම්බන්ධීකරණ කමිටු අනුමැතියට. එතුමා ප්‍රකශ කරන විදිහට ගරු ජනාධිපතිතුමාගේ සංකල්පයක් අනුව සහ වැඩ පිළිවෙල අනුව හැම ග්‍රාමයක්ම වෙනුවෙන් ප්‍රමුඛතාවය ඔබතුමාගේ අමාත්‍යාංශයෙන් දෙනවා නම් ඒ සඳහා දැනට පාවිච්චි වෙන ක්‍රමවේදය නම් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතියකින් තමයි ග්‍රාමයකට විදුලිය දුන්නත් ඒ විදුලිය කැවීම සඳහා අනුමැතිය ලබා දෙන්නේ. එතෙන්දී

වැලිගෙපොල එක ක්‍රමයකුත් ගොඩකවෙලදී එක ක්‍රමයකුත් ඒවගේම වැලිගෙපොල ප්‍රශ්නයක් වුණේ නෑ. ප්‍රදේශයක් ඔබතුමා

තෝරා ගෙන තියෙනවා. ගොඩකවෙල වෙනස් කරපු නිසාද ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීමට ආවේ නැත්තේ.

***ගරු අමාත්‍ය රංජිත් බණ්ඩාර මැතිතුමා.***
***கௌரவ அமைச்சர் ரஞ்ஜித் பண்டார***
*Hon. Minister Ranjith Bandara*
-------------------------------------------------------

ඒ යෝජනාව ක්‍රියාත්මක වෙන ආයතනය තමයි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. මේක ප්‍රාදේශීය ලේකම් හරහා ක්‍රියාත්මක වෙයි. ප්‍රාදේශීය ලේකම් හරහා ක්‍රියාත්මක වෙන නිසා මේක වහලා ගහන්න බෑ. ඒ නිසා මේකේ විනිවිදභාවය තියෙනවා ප්‍රාදේශීය ලේකම්තුමාගේ අධීක්ෂණය යටතේ සහ කාර්මික නිළධාරීගේ අධීක්ෂණය යටතේ තමයි මේ සියළුම යෝජනා ක්‍රියාත්මක වෙන්නේ. සබරගමු පළාත් සභාවේ අපේ අමාත්‍යාංශයේ ඇස්තමේන්තු සකස් කිරීමත් එහෙම නැත්නම් පළාත් සභාවේ අපේ අධීක්ෂණය තිබෙනවා නමුත් ඇස්තමේන්තුගත කිරීම සියල්ලක් සිදු වෙන්නේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා. ඒ නිසා ප්‍රාදේශීය ලේකම්ගේ කාර්යය භාරය සභාවට ඉදිරිපත් කරලා අවශ්‍ය කටයුතු සිද්ධ කිරීම.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
------------------------------------------------------------

ඔබතුමාට ප්‍රශ්නයට ඉඩ කඩ දෙන්න බෑ. මෙතුමා ප්‍රශ්නය ඇහුවානේ. ඉදිරිපත් කරලා තියෙන්නේ මෙතුමා. මෙතුමා ප්‍රශ්න දෙක

ඇහුවා මෙතුමාට ඉඩකඩ තියෙන්නේ. ඔබතුමාට ආයේ ඉඩකඩක් නෑ, ඔබතුමා ආයේ ඇහැලියගොඩ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න. මෙතුමාගේ ප්‍රශ්නයේදී ඒ ප්‍රශ්නය අල්ලගෙන තව කෙනෙකුට කතා කරන්න බෑ.

ස්තූතියි ගරු අමාත්‍යතුමනි. මීළඟට

**අමාත්‍යාංශ නිවේදන හෝ අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ :**

මේ යටතේ කිසිවක් ලැබී නැහැ.

**පෞද්ගලික ප්‍රකාශ කිරීම්:**

මේ යටතේ ඩබ්.සෝමදාස ගරු විපක්ෂනායකතුමා.

***ගරු විපක්ෂ නායක ඩබ්ලිව්.සෝමදාස***
***கௌரவ எதிர்க் கட்சித் தலைவர் டபிள்யு சோமதாச***
*Hon.Opposition Leader W.Somadasa*
----------------------------------------------------------

ගරු සභාපතිතුමනි පෞද්ගලික ප්‍රකාශ කිරීම් යටතේ මම ඉල්ලීමක් කලේ ඊයේ දවසේ. කෑගල්ල දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමේදී. පහුගිය මැයි මාසයේ සිදු වුණ හදිසි ආපදා තත්ත්වයෙන් හානියට පත් වුණා. කෑගලු දිස්ත්‍රික්කයේ මිනිස් ජීවිත දේපළ ,මාර්ග පද්ධතිය විනාශ වුණ බව අපි කවුරුත් දන්නවා. ඒ අවස්ථාවේ පළාත් ප්‍රාදේශීය සභා

බලප්‍රදේශවල මාර්ග විශාල ප්‍රමාණයක් හානියට පත් වෙලා තිබුණා. විශේෂයෙන් කෑගලු දිස්ත්‍රික්කයේ මාර්ග 300 ක් විනාශයට

පත් වෙලා තිබුණා. ඒ මාර්ග අලුත්වැඩියා කිරීමට සහ සංවර්ධනය කිරීමට පළාත් පාලන අමාත්‍යාංශය මුදල් වෙන් කළා. එතනදී පළාත් පාලන අමාත්‍යාංශයෙන් පළාත් සභාව හරහා ඒ මුදල් වෙන් කරපු ඒවගේම ප්‍රාදේශීය සභා වලින් ඇස්තමේන්තු කැදෙව්වා. ඒ ඇස්තමේන්තු මේ වෙන කොට කැඳවලා පළාත් සභාවට එවලා තියෙනවා. කොමසාරිස්තුමියගෙන්. කොමසාරිස්තුමිය ගෙන් පළාත් සභා පළාත් පාලන අමාත්‍යාංශයට මේ වෙන කොට මේ ලිපිය යවලා ඉවරයි. ඒ නිසා අද වෙන කොට දින 120 ක් වගේ කාලයක් වෙනවා මේ ආපදා තත්ත්වයට මුහුණ දීලා. ඒ පිරිසට ජනතාවට මාර්ග සකස් කර ගන්න පුළුන්කමක් නෑ. ඒ නිසා ඊයේ දවසේ මම වගේම පළාත් සභා මන්ත්‍රීවරු අපහසුතාවයට පත් වුණා. මාකද මේ ගැන කතා කරද්දී පළාත් සභාවෙන් කොමසාරිස්තුමියගෙන් එහාට පළාත් පාලන අමාත්‍යාංශයට දැනුවත් වෙලා නෑ කියන එක සම සභාපතිවරු ප්‍රකාශ කළා. ඒ නිසා මේ තත්ත්වය තියෙනවා නම් විශාල අසාධාරණයක් සිදු වෙලා තියෙනවා. මේ වැඩ ප්‍රමාදවීමෙන් ඒ ආපදාවට ලක් වුණ ජනතාවට අද ලොකු අපහසුතාවයට පත් වෙලා තියෙනවා. ඉතා ඉක්මනින් කඩිනමින් මේ පළාත් පාලන අමාත්‍යාංශයට යවන්න කියලා ඉල්ලීමක් කරනවා ඔබතුමා හරහා කියන එක මම ප්‍රකාශ කර සිටිනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
------------------------------------------------------------

ස්තුතියි ගරු විපක්ෂනාකතුමයි.

***ගරු ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත්***
***கௌரவ பிரதான அமைச்சர்***
*Hon.Chief Minister Mahipala Herath*
-------------------------------------------

ගරු සභාපතිතුමනි මම ගරු සෝමදාස විපක්ෂනායකතුමාගේ ප්‍රකාශයට උත්තරයක් දෙනවා නෙමෙයි. මේ ගැටළුව පළාත් සභා ,පළාත් පාලන අමාත්‍යාංශයෙන් විමසීම් කරලා තිබුණා. අපිට ලැබුණ ඒ සියළු යෝජනා අප පළාත් සභාවෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් අදාල පළාත් සභා පළාත් පාලන අමාත්‍යාංශයට යවලා තියෙන්නේ. ඒවේ දින වකවානුත් එක්ක මට අවශ්‍ය නම් ඊළඟ සභාවේ ඉදිරිපත් කරන්න පුළුවන්. ඒවා සමහරවිට අමාත්‍යාංශවල අස්ථානගත වෙලා තියෙනවා නම් ඒවා සොයා බැලුවොත් සොයා ගන්න පුළුවන් වෙයි. දෙවෙනි වරටත් ඒවා යැවීමක් කරලා තියෙනවා කියන එකයි මගේ පෞද්ගලික දැනීම. ඒක මම හරියාකාරව මේ පිළිතුර දෙන්නේ මමත් මේ ගැන විමසුවා කොමසාරිස්තුමියගෙන් ඒවගේම අදාල සහකාර ලේකම්වරයාගෙන් ඒවා යැව්ව බව තමයි ප්‍රකාශ කලේ. මම හොයලා බලලා මට අවශ්‍ය නම් අපේ ගරු විපක්ෂනායකතුමාට කරුණු ඉදිරිපත් කරන්න පුළුවන්. මේ සම්බන්ධීකරණ කමිටුවේ ප්‍රශ්න අහන කොට එකම දවසේ අමාත්‍යවරයා වශයෙන් මට ස්ථාන දෙකක පෙනී සිටින්න බෑ. ඒ නිසා මට ඊයේ රත්නපුර එකේ අත්‍යාවශ්‍ය ගැටළු කීපයක් සඳහා සමසභාපති ජෝන් සෙනෙවිරත්න ගරු අමාත්‍යතුමා පැමිණෙන්න කියපු නිසා මට ඒකට යන්න සිද්ධ වුණා. කෑගල්ල දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවත් එම දවසේමයි තියලා තිබුණේ. අපිට කිසිම දැනුම් දීමකින් තොරව. ඒ නිසා මේ ප්‍රශ්නය අපේ ගරු සෝමදාස විපක්ෂනායකතුමාට ඕනේ නම් ඒ විස්තර ලබා දෙන්නට පුළුවන්.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***

*Hon.Chairman Kanchana Jayarathna*

---

ස්තුතියි ගරු ප්‍රධාන අමාත්‍යතුමනි. මීළඟට සිරිල් පල්ලේපොල ගරු මන්ත්‍රීතුමා.

***ගරු මන්ත්‍රී සිරිල් පල්ලෙපොල***
***கௌரவ சிறில் பல்லேபொல***
*Hon.Member Cyril Pallepola*

---

ගරු සභාපතිතුමනි, ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, ගරු අමාත්‍යවරුනි, විපක්ෂ පක්ෂ මන්ත්‍රීවරුනි, මට පෞද්ගලිකව සිදු වූ සිදුවීමක් පිළිබඳව මම පෙරේදා ගියා රඹුක්කන මගේ නෝනලාගේ ගම් පැත්තේ. ගිහිල්ලා එන කොට අපේ සබරගමු පළාත් සභාවෙන් ප්‍රධාන අමාත්‍යතුමාත් දන්නවා අපේ ගම වැඩ සටහන යටතේ පින්නවල ඒ කරන ව්‍යාපාරයේ මම බලන්නත් අර ගමේ කෑම හැටියට තෝසයක් දෙකක් කාලා නෝනයි මායි තේ එකක් බීලා ඉන්න කොට ගරු සභාපතිතුමනි මේ තෝසේ හදන ඒ කෙනා තමයි මුදල් ගන්නේ. තෝසේ එක දෙන්නේත් ඒ අතින්. මුදල් දෙන්නේත් ඒ අතින්. මේ මුදල් කියන එක අපි දන්නවා අපි සමාජයේ ඉන්න කොට හැම කෙනෙකුටම මුදල් කොළේ ගැවසෙනවා. ඒක දුප්පත් අසරණ නැත්නම් හිඟමනේ යන කෙනා අතරත් මේක තියෙනවා. මේ මුදල තෝසේ එක දෙන අතින්ම අර මුදල ගන්නවා. අපි සෞඛ්‍ය පැත්තෙන් බැලුවොත් අන්තිම පිරිහීමකට පත් වෙනවා. ගරු ප්‍රධාන ඇමතිතුමනි ඔබතුමා දන්නවා ලොකු මුදලක් සබරගමු පළාත් සභාව වියදම් කරලා මේ කටයුතු කළේ. මට වුණ සිදුවීමක් ඒ විතරක් නෙමෙයි ගරු සභාපතිතුමනි මෙතන ගියා අර ටැප් ලයින් එකක් දාලා තියෙනවා කරාමයක් තිබුණ එක වැඩ කරන්නේ නෑ. අර බිමට නැමිලා බිම තියෙන ටැප් එකෙන් නෝනාට අත සෝදන්න සිදු වුණා. නමුත් මේවා අපි මහජනතාවක් හැටියට ඒ විතරක් නෙමෙයි මට කතා කළේ එයා අයියේ කියලා. අයියලා නෙමෙයි එතනට එන්නේ. මල්ලිලා නෙමෙයි එතනට එන්නේ. වෙළඳ කටයුත්තක් වෙන කොට මම කිව්වේ නෑ. පේපර් සර්වියට් එතන නෑ. ඉල්ලලා ගත්තේ. පේපර් සර්වියට් ළමයි නැති කරනවාලු. මම කිව්වා මමත් සබරගමු පළාත් සභා මන්ත්‍රීවරයෙක්. දුන්නා මගේ විසිටින් කාඩ් එක. දුන්නහම පොඩ්ඩක් එහාට මෙහාට ඇඹරුණා. ඒ නිසා මෙවැනි කටයුතු කරන කොට මම දන්නේ නෑ මුදල් එක එක්කෙනා මුදල් ගන්නේ. ආප්ප හදන එක්කෙනා ආප්ප වලට මුදල් ගන්නවා. වඩේ හදන එක්කෙනා වඩේ වලට මුදල් ගන්නවා. එතකොට සුදු ආප්ප හදන එක්කෙනා සුදු ආප්ප වලට මුදල් ගන්නවා. සුදු ආප්පෙත් දෙනවා. මුදලුත් අත ගානවා. මේ පිළිබඳව සබරගමු පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක් හැටියට මට වුණ සිද්ධිය නෙමෙයි ජනතාවටම විදේශ සංචාරකයෝ පවා මෙතනට ගැවසෙනවා. අපේ රටට විදේශ ආයෝජකයෝ ඇවිල්ලා මුදල් සම්පත් ගෙනත් දෙන අයට මේවා දැක්කොත් එහෙම අපේ ලංකාවට පවා අපකීර්තියට පත් වෙනවා. මේ ගැන විශේෂ අවධානය යොමු කරන්න කියන පනිවිඩය මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---

ස්තුතියි ගරු සිරිල් පල්ලේපොල මන්ත්‍රීතුමනි. ඔබතුමා විසින් ඉදිරිපත් කරන ලද කාරණාව පිළිබඳව ගරු ප්‍රධාන අමාත්‍යතුමා.

***ගරු ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත්***
***கௌரவ பிரதான அமைச்சர்***
*Hon.Chief Minister Mahipala Herath*
*------------------------------------------------*

ගරු සභාපතිතුමනි අපේ ගම ගැන මේ සභාවේ කතා කරපු එක ගැන මම ස්තූතිවන්ත වෙනවා. මම බොහොම සතුටු වෙනවා. ඔයත් පළාත් සභාවේ වැඩක්. ඔහොම කතා කරන්න හරි තමුන්නාන්සේලා එකතු වෙලා තමයි ඒක කරලා තියෙන්නේ. මේකේ අඩුපාඩු ඔහොම බලලා මෙතන කියනවා වගේම අදාල අදාල අමාත්‍යාංශ වලට ඒක කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් කරන්නේ ඒක දෙන්න ඉදිරිපත් කරන්න. හැබැයි මේ ගරු සභාපතිතුමනි මේ ක්‍රමය අහිංසක දුප්පත් ගැමි කාන්තාවන් පිරිසකට අපි රැකියාවක් දීලා තියෙන්නේ. දුප්පත් අය පුහුණු කිරීමක් කරලා ගන්නෝරුවේ ඇරලා මේ අලුත් විදිහක් කරලා තියෙන්නේ අඩුපාඩුකම් ඇති. අපේ පල්ලේපොල ගරු මන්ත්‍රීතුමාට තව පොඩ්ඩක් එහාට ගියා නම් රඹුක්කන නගරයේ ඉන්නවා ඔබතුමාගේ මස්සිනා හොඳට රසට කාලා එන්න තිබුණා. ඇයි ඔය අඩුපාඩුකම් තියෙන තැන්වලට යන්නේ. එක්කෝ අපේ ආනන්ද මිල්ලන්ගොඩ මන්ත්‍රීතුමාගේ ගෙදර තියෙනවා. සලකන්නේ නැද්ද. මං හිතන්නේ ඒ ගෙවල් දෙකෙන්ම මොකවත් දීලා නෑ. ඒකයි ඔබතුමා මෙතෙන්ට ඇවිල්ලා තියෙන්නේ. අපි මේ අඩුපාඩු ටික සකස් කරනවා. සකස් කරලා ඔබතුමාට නිසි පරිදි යන්නට සලස්වනවා. බොහොම ස්තූතියි මෙතෙන්ට ගියාට.

***ගරු මන්ත්‍රී සිරිල් පල්ලෙපොල***
***கௌரவ சிரில் பல்லேபொல***
*Hon.Member Cyril Pallepola*
*------------------------------------------------------------*

එතෙන්ට ගියා නෙමෙයි බොහොම සද්භාවයෙන් සබරගමු පළාත් සභාවට ආදරේ නිසාත් අපේ පළාත් සභාවේ මුදල් වෙන් කරලා කරපු නිසාත් මම මතක් කළේ.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
*------------------------------------------------------------*

බොහොම ස්තූතියි. ගරු සිරිල් පල්ලේපොල මැතිතුමනි. ගරු ප්‍රධාන අමාත්‍යතුමනි මීළඟට න්‍යායපත්‍රානුකූලව යෙදී තිබන්නේ සබරගමු පළාත් සභාවේ හිටපු ගරු අමාත්‍යතුමියක් හැටියට ඒවගේම රත්නපුර දිස්ත්‍රික්කය නියෝජනය කරපු ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරියක් හැටියට ඒවගේම සබරගමු පළාතට රත්නපුර දිස්ත්‍රික්කයට සුවිශාල දේශපාලනික සහ සාමාජීය සේවාවක් ඉෂ්ඨ කරපු ගරු සුරංගනී එල්ලාවල මැතිණිය වෙනුවෙන් මෙම ගරු සභාවේ ඉදිරිපත් කරන ලද ශෝක ප්‍රකාශ යෝජනාව සභාවේ සාකච්ඡාවට ගැනීමට අවස්ථාව. මේ සඳහා අප විසින් ආරාධනා කරපු ලැබුවා ගරු සුරංගනී එල්ලාවල මැතිණියගේ ආදරණීය දියණිය විශාකා එල්ලාවල මැතිණිය, සහ එතුමියගේ ඥාතීන් මේ අවස්ථාවට සහභාගි වෙලා සිටිනවා. එතුමියන්ලා සියළු දෙනාමත් සහභාගි වී සිටින සියළු දෙනාමත් අපි ඉතාම ගෞරවකපූර්වකව ගරු සභාව විසින් පිළිගන්නා බව මතක් කරමින් මෙම ශෝක ප්‍රකාශ යෝජනාව ආරම්භ කිරීම සඳහා ගරු ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත් මැතිතුමාට ගෞරවයෙන් ආරාධනා කරනවා.

***ගරු ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත්***
***கௌரவ பிரதான அமைச்சர்***

*Hon.Chief Minister Mahipala Herath*

*-------------------------------------------*

ගරු සභාපතිතුමනි දිවංගත මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර සුරංගනී එල්ලාවල මැතිණිය පිළිබඳ ශෝක ප්‍රකාශ කරන මේ මොහොතේ විශේෂයෙන්ම එතුමිය ගැන කතා කරන කොට අපිට අමතක කරන්නම බැරි චරිතයක් තමයි රත්නපුර දිස්ත්‍රික්කයට ජාතික වශයෙන් බිහි වුණ නන්ද සිඩ්නි එල්ලාවල චරිතය. එතුමා 1965 එතුමා රත්නපුර මහ නගර සභාවට නාගරික මන්ත්‍රීවරයෙක් වශයෙන් ඇවිල්ලා එතුමා 1970 පාර්ලිමේන්තුව ජයග්‍රහනය කරලා 1989 එලෙසම වැඩිම ඡන්ද සංඛ්‍යාවකින් රත්නපුර දිස්ත්‍රික්කය ජයග්‍රහනය කරපු මන්ත්‍රීවරයා ලෙස පාර්ලිමේන්තු ගියේ එතුමා. අපි සියළු දෙනාටම 1989 දෙසැම්බර් මාසයේ අහිමි වුණා. මේ කාලය තුළ 65 ඉඳලා ඉතිහාසය දිහා අපි බලපුවහම නන්ද සිඩ්නි එල්ලාවල මැතිතුමාගේ දේශපාලන චරිතය අභිමානවත් දේශපාලන චරිතයක් බවට පත් කරන්නට ඒ ගමන් මගේ සෙවනැල්ලක් සේ ඇවිල්ලා තියෙන්නේ සුරංගනී එල්ලාවල මැතිණියගේ ආදරණීය ප්‍රියාදර භාර්ාාව කියන එක අපිට මේ රත්නපුර ප්‍රදේශය නෙමෙයි දන්න හඳුනන හැම කෙනෙක්ගෙන්ම ඥාතීන්ගෙන් හැම කෙනෙක්ගෙන්ම ඇහුවත් ඒ හැම කෙනෙක්ගේම මුවඟ තියෙන්නේ ඒ වචනය ගරු සභාපතිතුමනි. එහෙම නන්ද් එල්ලාවල තම ආදරණීය ස්වාමි පුරුෂයා ජාතියෙන් ඒ දුන්න අයිතිය අවසන් කරලා ඒ ගමන් මඟේ අවසන් කරන කොට එතුමියගේ ආදරවන්ත පුත්‍රයා එතුමියට හිටපු සම්පත අපි කවුරුත් ආදරයෙන් කතා කරපු නාලන්ද මා සමඟ පාර්ලිමේන්තුවේ එකට එක පේළියේ ඉඳගෙන හිටපු නාලන්ද ගරු මන්ත්‍රීතුමාට එතුමිය එකඟතාවය දුන්නා තමන්ගේ ස්වාමිපුරුෂයාගේ හිඩස පුරවන්න. සබරගමු පළාත් සභාවේ ජනතා නියෝජිතයෙක් හැටියට පෙනී හිටියා . අපේ නාලන්ද සහෝදරයා 1993 මේ පළාත් සභාවේ ඉතාමත්ම ජනප්‍රිය තරුණ පළාත් සභා මන්ත්‍රීවරයෙක් වශයෙන් තේරී පත් වෙලා 94 මේ රටේ විප්ලවීය ජනතා ජයග්‍රහනයක් ලෙස සලකන්න පුළුවන් 94 ජයග්‍රහනයෙන් එදා පොදු පෙරමුණ ආණ්ඩුවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් ලෙස අප සමඟ එකතු වුණා. එල්ලාවල පවුල නාලන්ද එල්ලාවල මගේ පැරණි මගේ මිත්‍රයා. අපේ එක කණ්ඩායමක් හිටියා. නාලන්ද ඒවගේම සාලින්ද ,ඩිලාන් සහ මම අපි හතර දෙනා එක කණ්ඩායමක් හැටියටයි පාර්ලිමේන්තුවේ හිටියේ. ඒ නිසාම සුරංගනී එල්ලාවල මැතිණිය වැනි ආදරණීය මව්තුමියකගේ තුරුලේ හැදුණු තරුණ ජනතා නියෝජිතයෙක් සමඟ ඒ පවුලත් එක්ක මටත් ඇසුරු කරන්නට බොහොම සමීපතම අවස්ථාව ලැබුණා ගරු සභාපතිතුමනි. ඒ කාලය තුළ අපි දැක්කා අම්මා කෙනෙක් තුළ ,ගුරුවරියක් විදිහට ඒවගේම දේශපාලන ජ්‍යෙෂ්ඨ පරිනත දේශපාලන නායිකාවක් ලෙස එතුමිය තම පුතාට පමණක් නෙමෙයි අපිටත් එතුමිය සහෝදරියක් වගේ අපිට මේ දේශපාලන ගමන් මඟ ගැන අනන්ත අවස්ථාවල කරුණු පෙන්වමින් අපිට උපදෙස් දුන්නු වාර ගණන අපිට කියලා නිම කරන්න බැහැ ගරු සභාපතිතුමනි. ඒ නිසාම අපි හරි අපිරිමිත විදිහට ආදරයක් ඒවගේම අපි එතුමිය සමඟ ඒ මව්තුමිය නාලන්දගේ මව්තුමිය සමඟ අපි බොහොම සමීප සෙනෙහසකින් යුතු ලෙන්ගතු ආශ්‍රයකට අපි හැම කෙනෙකුටම අපේ දේශපාලන සමකාලීන මිතුරෝ හැටියට අපිට සම්බන්ධ වෙන්න පුළුවන් වුණා. මේ කාල වකවානුව තුළ නාලන්ද සහෝදරයා සමඟ එදා අපි එතුමියගේ සහෝදරිය ඇතුළු ඒ පවුලේ ඥාතීන් සමඟ අපිට ඒ නිවසේ යම් යම් අවස්ථාවල සහභාගී වෙන්නට ලැබුණ අවස්ථාවල අපිට සලකපු ආකාරය මවක සහෝදරියක ලෙස ඒ සලකපු ආකාරය අපිට දැනුත් ගරු සභාපතිතුමනි සිහිපත් වෙනවා. මේ කාලය තුළ තමයි එතුමිය කිසි දවසක නොහිතපු මේ රටේ ජනතා නායකත්වයක් කරා ගමන් කරනු ලැබූ තරුණ දේශපාලන නායක නාලන්ද එල්ලාවල මැතිතුමා 1997 පෙබරවාරි 11 වෙනිදා අපි කිසි කෙනෙක්

නොසිතූ විදිහට දැයෙන් සමු ගත්තා. මවක් මේක කොහොම උසුළගෙන ඉන්න ඇද්ද කියලා අපිට එදා හිතුණා. නමුත් තම ස්වාමිපුරුෂයා අකාලයේ දේශපාලනයේ නියැලී ජනතා සේවය කරද්දී මිය ගිය මොහොතේ ඒ දුක් සෝ සුසුම් මැද ඉවසපු මව මේ පුතාගේ අභාවයේදීත් මේ සියල්ල ඉවසාගෙන හිටපු ආකාරය අපි අතිශයින්ම ඉතාම දුකින් බලාගෙන හිටියා. මම හිතන්නේ මම මේ දේහය ළඟට ගිය වෙලාවේ මට මිනිත්තු ගණනක් යනකන් ඒ දේහය ළඟින් ඉවත් වෙන්නට හිතුණේ නෑ නාලන්දගේ. ඒ තරම් බැඳීමක් අපේ පවුල සමඟ ඇති වුණා. ඉතිං ගරු සභාපතිතුමනි මේ සියල්ලටම අපි දැක්කා නාලන්දගේ දේශපාලන ගමනේත් පසුපස හිටියේ නන්ද සිඩ්නි එල්ලාවල එතුමාගේ පියාගේ දේශපාලනයේ හිටපු තමන්ගේ මව මේ දේශපාලන ගමනේ සෙවනැල්ලක් සේ පුතාට හිටියා. අපි හිතුවා පුතාගේ අභාවයෙන් පස්සේ ,ස්වාමිපුරුෂයාගේ අභාවයෙන් පස්සේ මේ ලැබිච්චි සියළු අභියෝගයන්ගෙන් දුකට පත් වෙච්චි මවක් ලෙස බිරිඳක් ලෙස දේශපාලනයෙන් අයින් වෙයි කියන මට්ටමකට අපි හිතුවා යයි කියලා. නමුත් ජනතාව ඒකට ඉඩ දුන්නේ නෑ. එතුමියට නැවත නැවතත් එල්ලාවල පවුලේ රත්නපුර දිස්ත්‍රික්කයට රටට අවශයයි කියන කියමන සනාථ කරමින් එතුමිය මේ සබරගමු පළාත් සභාවේ සමාජ සේවා අමාත්‍යතුමිය ලෙස එතුමිය වැඩ භාර ගන්නට ජනතාව එතුමිය රැගෙන ගියා. ඒ ගිය ගමන නතර වුණේ මේ රටේ උත්තරීතර සභාව ගෞරවනීය සභාව පාර්ලිමේන්තුවේ 2000 වර්ෂයේ.

ඒ නිසා ගරු සභාපතිතුමනි සුරංගනී එල්ලාවල හිටපු ගරු ආණ්ඩුකාරවරිය මේ හැම කෙනෙක්ම සිහිපත් කරන්නේ. ඒ ගමනේ අපේ සුරංගනී එල්ලාවල මැතිණිය මේ සියළු අභියෝග මේ සියළු දුක් කම්කටොළු ඉවසාගෙන ජනතාව වෙනුවෙන් තම ස්වාමිපුරුෂයා තම පුතණුවන් මේ දිස්ත්‍රික්කයට කරගෙන ගිය ඒ සියළු දේශපාලන දායාදයන් මෙතුමිය ඉෂ්ඨ කරමින් කටයුතු කරන අතරවාරයේදී තමයි එතුමිය නැවත මධ්‍යම පළාතේ ආණ්ඩුකාරවරිය ලෙස එතුමියට වර්තමාන රජයේ අතිගරු ජනාධිපතිතුමාගෙන් ඒ ගෞරවනීය අවස්ථාව ලැබුණේ. ඒ කාලය තුළත් මම මතක් කරන්න ඕනේ මධ්‍යම පළාතේ හිටියාට එතුමියගේ හිත තිබුණේ ගරු සභාපතිතුමනි සබරගමු පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ විශේෂයෙන්ම. මේ ජනතාවට ආදරය කළා. මේ එල්ලාවල පවුල ජනතාවට ඒ කළ ආදරය දිගින් දිගටම ගෙන යැමේ කර්තව්‍ය සුරංගනී එල්ලාවල මැතිණිය සියළු කරදර බාධක අභිබවා ඉෂ්ඨ කළ බව අපි හැම කෙනෙක්ම මං හිතන්නේ පක්ෂ විපක්ෂ භේදයකින් තොරව අපි අනුමත කරන දෙයක් ගරු සභාපතිතුමනි. ඒ නිසා විශේෂයෙන්ම නන්ද සිඩ්නි එල්ලාවල අපේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා අභාවප්‍රාප්ත , නාලන්ද මාගේ මිත්‍රයා පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා. සුරංගනී එල්ලාවල හිටපු ගරු ආණ්ඩුකාරතුමිය මේ රටේ විවිධ තානාන්තර කැමැත්තෙන් ලබා දුන්නු හැම අවස්ථාවකම තම යුතුකම ඉෂ්ඨ කළ ඉතාමත්ම ඉහළම ශ්‍රේෂ්ඨ විශිෂ්ඨ නගයේ දේශපාලන චරිතයක් පමණක් නොව සමාජ සේවා වැඩ කටයුතු වලදී තම ඒ නිහතමානිත්වය තුළින් හැම කෙනෙකුටම එක හා සමානව සලකන්නට හුරු පුරුදු චරිතයක් ලෙස සුරංගනී එල්ලාවල මැතිණිය අතිශයින්ම හැම කෙනෙක් අතරම ජනප්‍රිය චරිතයක් බවට පත් වුණු චරිතයක් තමයි මේ අපිට අහිමි වුණේ. ඒ නිසා මේ අවස්ථාවේදී මා විශේෂයෙන්ම මම දකිනවා එතුමිය ඉතාමත්ම දයාබර බිරිඳක් ඒවගේම

එල්ලාවල පවුලේ සිඩ්නි එල්ලාවල ,නාලන්ද එල්ලාවල එවගේම එතුමිය ආපු දේශපාලන ගමන ජනතාවගේ අයිතීන් සඳහා ඉදිරිපත් වුණ පවුලක දේශපාලන ගමනක් ලෙසයි අද අපි ආදරණීය මවක්, ඒවගේම ජනතාවගේ ආදරණීය ජනතා නියෝජිතවරියක් මේ කටයුතු සියල්ලක්ම ඉතාමත්ම අවංකවත් සාධාරණවත් එවගේම තමන්ට කළ හැකි උපරිම ශක්තියෙනුත් ඉෂ්ඨ කරපු ඉතාමත්ම

ධෛරය වීරවන්ත මාතාවක් හැටියට තමයි අපි සුරංගනී එල්ලාවල මැතිණිය අපි දකින්නේ. මෙන්න මේ කාරණාව උඩ එතුමියගේ අභාවය අපි සියළු දෙනාටම අතිශයින් ශෝකයට කරුණක් ගරු සභාපතිතුමනි. මේ අපි හැම කෙනෙක්ම මේ ගරු සභාවේ ශෝක වෙන මොහොතේ එතුමිය වෙනුනේ මට වචනයක් කතා කරන්න අවස්ථාව සලසාදීම ගැන මම ඔබතුමාට ගරු කරන අතර අවසාන වශයෙන් සුරංගනී එල්ලාවල මැතිණියට මේ කරන ලද හැම පුණ්‍ය කර්මයක්ම හැම කුසල කර්මයක්ම තුළින් අපි හැම කෙනෙක්ම බලාපොරොත්තු වෙන අජරාමය අමා මහ නිවන් සුවය අප එතුමියට ප්‍රාර්ථනා කරන අතරම ගරු සභාපතිතුමනි අපගේ සබරගමු පළාත් සභාවේ අපි පක්ෂ විපක්ෂ අපි සියළු දෙනාගේම බලවත් වූ කණගාටුව ශෝකය අද මේ අවස්ථාවට පැමිණ සිටින එතුමියගේ ආදරණීය දියණිය ඇතුළු පවුලේ සියළු ඥාතීන් වෙත විශේෂයෙන් අපේ මොහාන් එල්ලාවල අපේ හිටපු ආණ්ඩුකාරතුමාගේ පවුලේ සියළු දෙනා වෙතත් දන්වා යවන ලෙස ඉතාමත් කරුණාවෙන් ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------------------

ස්තුතියි ගරු ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත් මැතිතුමනි. මීළඟට ශෝක යෝජනාවේ අදහස් ඉදිරිපත් කිරීම සඳහා ගරු මන්ත්‍රී කේ.එල්.රත්නායක මැතිතුමා. එතුමා

සභාවේ නැහැ. මීළඟට ගරු මන්ත්‍රී අජිත් කුමාර මැද්දෙගම මැතිතුමා.

***ගරු මන්ත්‍රී අජිත් කුමාර***
***கௌரவ உறுப்பினர் அஜித் குமார***
*Hon.Member Ajith Kumara*
-----------------------------------------------------------

ගරු සභාපතිතුමනි අපිත් සමග මේ පළාත් සභාවේ කාලයක් අමාත්‍යවරියක් හැටියට කටයුතු කරපු සුරංගනී එල්ලාවල මැතිණියට ශෝක යෝජනාව ගෙන එන අවස්ථාවක කණගාටුවෙන් වුවත් එතුමියගේ ශෝක යෝජනාව ගැන වචන කීපයක් කතා කරන්න ඔබතුමා අවස්ථාව ලබාදීම ගැන ස්තුතිවන්ත වෙනවා. අපිට මතකයි රත්නපුර දිස්ත්‍රික්කයේ දේශපාලනය ගත්තහම එල්ලාවල පවුල කියන එක දේශපාලන කඳවුරක්. එල්ලාවල කෙනෙක් නැති දේශපාලන භූමියක් නැති වෙන්න පුළුවන්. එක පක්ෂයක හරි. රත්නපුර කිව්වහම මතක් වෙන නාමයක් තමයි ශ්‍රීලංකා නිදහස් පක්ෂයත් එක්ක සහ සම්බන්ධ වෙච්චි එල්ලාවල කියන නාමය. අපිට ආශ්‍රය කරන්න කතා කරන්න නන්ද එල්ලාවල මැතිතුමාත් එක්ක ගරු සභාපතිතුමනි අපිට අවස්ථාවක් නැති වුණත් පුද්ගලිකව මට. නාලන්දත් එක්ක බොහොම මිත්‍රශීලීව කටයුතු කළා. නාලන්ද එල්ලාවලගේ අභාවය වෙලාවේ පුද්ගලිකව මට එතෙන්ට සහභාගි වෙන්න ඕනකම තිබුණත් අපේ හිටපු පළාත් සභාවේ අමාත්‍යවරයෙක් වූ ඒ.බී.වීරසේකර මැතිතුමාත් එක්ක මම එතෙන්ට එන්න උත්සාහ කළත් ඒ තිබුණ වාතාවරණයත් එක්ක පොඩි අපහසුතාවයකට පත් වෙන්න සිදු වුණා. ඒ නිසා සහභාගි වෙන්න එතෙන්ට අපි පැමිණියේ නෑ. ඒ බල කඳවුරු දෙකම යම්කිසි විදිහක කටයුතු කළත් සුරංගනී එල්ලාවල මැතිණිය ඉතාම සෞම්‍ය ගති පැවතුම් තිබෙන එතුමියට ඒ අවස්ථාවේදී

ජනතාවගේ කැමැත්තත් එක්ක ආරුඪ කරපු නාමය අම්මා කියන නාමය මේ සබරගමුවේ කාගේත් අම්මා හැටියට රත්නපුරේ කාගේත් අම්මා හැටියට විශ්වාස කරන්න පුළුවන් කාන්තාවක් කියන එක අපි ඉතාම ඕනකමින් ප්‍රකාශ කරන්න ඕනේ. එතුමියගේ දේශපාලනයක් තිබුණේම නෑ. අපි කතා

කළහම එතුමිය මේ පළාත් සභාවේ ඇමතිතුමියක් හැටියට ඉද්දී අපි මොනවා හරි ඉල්ලීමක් කළොත් එතුමිය ඒක කවදාකවත් පැහැර හරින්නේ නෑ. ඒ කාර්යය කරලා ඒ කාර්යය සම්පූර්ණ කරලා අපේ ඉල්ලීම ඉෂ්ඨ කරලා දීලා එතුමියගේ අමාත්‍යාංශයේ ලේකම් කෙනෙක් හෝ නිළධාරියෙක් හරහා ඒ පනිවිඩය නැත්නම් ඒ අවශ්‍ය කරන ලිපි ලේඛණ ටික අපේ අතටම ලබලා දෙන්න තරම් ඒ කාලයේ ප්‍රධාන ඇමතිතුමා කිව්වා වගේ ඉතාම පීඩනයට ලක් වෙච්චි දේශපාලන වශයෙන් පීඩනයට ලක් වෙච්චි කාන්තාවක් වුණත් එතුමිය ඒ කාර්යය අපිට ඉෂ්ඨ කරලා දුන්නා කියන එක ඉතාම ගෞරවයෙන් යුක්තව මේ අවස්ථාවේදී මතක් කර සිටිනවා.

ඒවගේම තමයි එතුමිය ඕනම අවස්ථාවක කතා කරන ඉතාම මටසිළිටු වචන තමයි කතා කළේ. කාටත් මම ඉස්සෙල්ලා කිව්වා වගේ අම්මා කියලා කතා කරන්න පුළුවන් එතුමියගේ පරම්පරාව ගැන හෝ එතුමිය දරණ තාරාන්තර ගැන හෝ එතුමියගේ එක්ක තියෙන සහ සම්බන්ධකම් හෝ එතුමිය කවදාකවත් උඩඟු තත්ත්වයට පත් වුණේ නෑ. ඒක හැබැයි එල්ලාවල පවුලට තියෙන ගතියක්. ඒක කාටවත් නැහැයි කියන්න බෑ. ඒ නිසා අපි බොහොම කැමැත්තෙන් යුක්තව සුරංගනී එල්ලාවල මැතිණියත් එක්ක බොහොම සුහදව ඒ පළාත් සභාවේ ගත කරන කාල පරිච්ජේදයේ ගත කළා. එතුමිය දේශපාලනයට ලොකු කැමැත්තක් තිබුණා කියලා මම විශ්වාස කරන්නේ නෑ. එතුමිය මේකේ ගැට ගැහිලා ඉන්න ඕනේ මම මේ යම්කිසි තනතුරක සිටිය යුතුයි කියන ආසාවක් එතුමිය තුළ තිබුණයි කියන එක ගැන පුද්ගලිකව මම විශ්වාස කරන්නේ. ඒ අවස්ථාවේදී එතුමියට දේශපාලනයෙන් ආරාධනා කළහම එතුමියගේ ස්වාමිපුරුෂයාත් එතුමියගේ දරුවාත් දරපු මතය අනුව එම පක්ෂයේ ඉල්ලීමට එතුමිය මං හිතන්නේ කන් දීලා ඒ අවස්ථාවේ ඒ වගකීම භාර ගත්තා තමන්ගේ පවුලත් එක්ක හිටපු කණ්ඩායම අමතක කරන්නේ නැතුව ඒ අය අනාථ කරන්නේ නැතුව. ඒ යුතුකම තමයි ඒ වෙලාවේ ඉෂ්ඨ කළේ. නැත්නම් දේශපාලන වුවමනාව දේශපාලනික වශයෙන් තමන්ට රැකවරණය බලය කියන එක ලබා ගැනීම සඳහා කියන එක අපි විශ්වාස කරන්නේ නෑ. එතුමිය ඒ තරම් නම්‍යශීලීත්වය ප්‍රකාශ කළා. හැම කෙනෙක් එක්කම සුහදව කතා කළා. සුහදව වැඩ කරලා දෙන්න. සුහදව සම්බන්ධකම් ඇති කර ගන්න. ඒ නිසා අපි වචනයෙන් පරිසමාප්ත අර්ථයෙන්ම එතුමිය අම්මා කෙනෙක්. කාගේත් අම්මා කෙනෙක්. ඒක අපි දැක්කා. එතුමියට යම්කිසි සංවේදී විදිහට කතා කළොත් ඇහේ කඳුළු අපි දැක්කා. එතුමිය කඳුළු හලපු වෙලාවල් අපි දැක්කා සමහර වෙලාවට සභාවේ. ඒ නිසා ගරු සභාපතිතුමනි ඒ නිසා තමයි එතුමියට පළාත් සභාව නියෝජනය කරන්න පුළුවන් වුණේ. උත්තරීතර පාර්ලිමේන්තුව නියෝජනය කරන්න පුළුවන් වුණා. එතුමියගේ අවසන් කාල පරිච්ජේදය වෙන කොට එතුමියට ආණ්ඩුකාර ධූරයක් ලැබිලා ඒ ආණ්ඩුකාර ධූරයෙන් තමන්ට දෙන්න පුළුවන් සේවාවක් තියෙනවා නම් මේ රටේ ජනතාවට ලබලා දෙන්න අවස්ථාවක් උදා කර ගන්න වාසනාවක් එතුමියට ලැබුණා.

ඒ නිසා කෙසේ වෙතත් ගරු සභාපතිතුමනි කවුරුවත් නොහිතන මොහොතවල්වල බලාපොරොත්තු නැති වෙලාවල්වල අනපේක්ෂිත අවසථාලවල මොනවා හරි ක්‍රමයකින් අපිට මේ ලෝකයෙන් අයින් වෙලා යන්න සිද්ධ වෙනවා. අපිට ඕන වෙලාවට එන්නත් බැහැ. ඕන වෙලාවට අපිට යන්නත් බැහැ. කවුරු හරි කෙනෙක්ගේ වුවමනාවට අපි එනවා. කාගේ හරි වුවමනාවකට අපි යනවා. ඒ අවස්ථාව සුරංගනී එල්ලාවල මැතිණියටත් සියළු දෙනා ඥාති හිතමිත්‍ර සියළු දෙනා මේ ලෝකයේ තියලා එතුමියට යන්න අවස්ථාව ලැබුණා.

අපි විශේෂයෙන්ම එතුමියගේ ඒ ගුණාංගත් එක්ක එතුමියට සිහිපත් කරන්නේ අපි ඉතාම හදවතින්ම ලෙන්ගතුභාවයකින් කියන එක ප්‍රකාශ කරන්නට ඕනේ. එහෙම නම් ගරු සභාපතිතුමනි අපේ පළාත් සභාවේ ශෝකය ඒ සුරංගනී එල්ලාවල මැතිණියගේ සිටින සියළු දෙනාට දන්වා යවන ලෙස ඉල්ලා සිටින අතර, එතුමියට නිවන් සුව අත් වේවා යැයි ප්‍රාර්ථනය කරමින් මගේ වචන කීපය හමාර කරනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---

ස්තුතියි ගරු අජිත් කුමාර මැද්දෙගම මැතිතුමාට. මීළගට ගරු අතුල කුමාර රාහුබද්ධ මැතිතුමා.

***ගරු අමාත්‍ය අතුලකුමාර රාහුබද්ධ***
***கௌரவ அமைச்சர் அதுல குமார ராஹுபத்த***
*Hon. Minister Athula Kumara Rahubadda*

---

ගරු සභාපතිතුමනි රත්නපුර දිස්ත්‍රික්කයේ කෘතහස්ත දේශපාලනයේ උරුමයක ඒ පරපුර නියෝජනය කරමින් රත්නපුර ජනතාවගේ අවශ්‍යතාවයට තමයි එදා සිඩ්නි එල්ලාවල මැතිතුමා දේශපාලනය ආරම්භ කරන්නේ. වතු අධිකාරීවරයෙක් හැටියට වෘත්තියෙන් ආරම්භ කරලා ඒ එල්ලාවල පරපුර ආරම්භය තියපු ඒ මහා පතාක යෝධයා අපි මේ ලෝකයට ජාතක වෙන කොට දේශපාලන වශයෙන් රත්නපුර දිස්ත්‍රික්කයට රත්නපුරට අවශ්‍ය වෙලා තිබ්බ්වී අයුක්තිය අසාධාරණයට එරෙහිව ඒ සාධාරණය සඳහා එවැනි අවස්ථා වලට මුහුණ දුන්නු ජනතාවගේ අවශ්‍යතාවය මත බිහි වෙච්චි දේශපාලන සම්පතක්. කොහොම වුණත් ඒ දේශපාලනය පිළිබඳව අපි පාසැල් අවධියේ දැක්කේ අපේ දේශපාලන ජාතික වීරවරයා හැටියට. මා හැමදාම මා ආදරය කරපු දේශපාලන චරිතයක්. අපේ දේශපාලන වීරයෙක් විදිහට මගේ හදවතේ ලියවිලා තිබුණේ අපේ පාසැල් අවධියේ ශාන්ත ලූක් විද්‍යාලයේ අපි දැකලා තිබුණ අයුක්තිය අසාධාරණය වෙනුවෙන් රත්නපුර දිස්ත්‍රික්කය තුළ නගරය පිටතදී සිදු වෙන දේවල් දිහා දැක්කේ ඔහු ඒ කරන දේශපාලන කාර්යය භාරය. ඒ සාධාරණය. ඒ නිසා ඔහු අපේ ජාතික වීරයා බවට පත් වුණා. නමුත් අවාසනාවට අපිට එතුමාත් එක්ක දේශපාලනය කරන්න සම්බන්ධ වෙන්න අවස්ථාවක් නෑ. නමුත් අපිට වාසනාව ලැබුණා. අපේ කාලයේදී අපිට දේශපාලන වශයෙන් මහා හයියක් ලබා දීපු නාලන්ද එල්ලාවල කියන අපේ කාලයේ අපේ වීරයා එක්ක. නමුත් අවාසනාවට මේ දිස්ත්‍රික්කයේ තමන්ගේ පියාගෙන් ගිලිහුණු ඒ දේශපාලන මහා වැඩ බිම වැඩ පිළිවෙල මේ දිස්ත්‍රික්කය

සබරගමු පළාත් සභාවේ ආදරණීය අපේ අම්මා නමින් විරුදාවලිය ලත් අපේ කාලයේ අපිත් එක්ක දේශපාලනය කරන්න අවස්ථාවක් ලැබුණ ඒවගේම මේ උත්තරීතර සභාවේ අමාත්‍යවරියක් හැටියට මේ සබරගමුවට මහා මෙහෙවරක් කරන්න අවස්ථාවක් ලැබිච්ච දේශපාලන කාන්තාවක් පිළිබඳව අපේ මතකය දිව යන්නේ එතුමිය ඒ නියෝජනය කරපු පරපුරත් එක්ක මොකද අපි මේ ලෝකයට ජාතක වෙන කොට තුළ වපුරන්න අරගෙන ආපු යන මොහොතේ ඉතාමත්ම අවාසනාවන්ත විදිහට ඒ දේශපාලන ලෝකයට එහෙම නැත්නම් ඒ රත්නපුර දිස්ත්‍රික්කයට ජනතාවට මේ දේශපාලන නායකයාත් අහිමි වුණා. ඉන් අනතුරුව තමයි ඒ සියළු දේ විඳ දරා ගත්ත මවක් වුණු ඉතා හොඳ බිරිඳක් වුණු මේ දේශපාලන චරිතය සබරගමුවේ ජනතාව වෙනුවෙන් රත්නපුර දිස්ත්‍රික්කය නියෝජනය කරපු විශාල මනාප සංඛ්‍යාවක් ලබා ගෙන පළාත් සභාවට එනවා පළවෙනි වතාවට. ඒ

ආපු අය මේ දිස්ත්‍රික්කයේ ජනතාවගේ අවශ්‍යතාවයන් ටික කරලා මේ කෙටි කාල පරාසයක් තුළ එතුමිය උත්තරීතර පාර්ලිමේන්තුවට යනවා. ජනප්‍රියත්වය ඒවගේම ඒ දේශපාලන වැඩ පිළිවෙලත් එක්ක ඉන් අනතුරුව අපි දකිනවා ඇය මධ්‍යම පළාත් සභාවේ ආණ්ඩුකාරතුමිය විදිහට විශාල කාර්යය භාරයක් කළා. ඒ කාර්යය භාරය කරපු හැම වෙලාවකදිම අපිත් ඔතනින් යන එන කොට එහෙම නැත්නම් එතුමියගේ පුරුද්දක් තිබුණා කාට හරි මාසයකට සැරයක් අපි දැක්කේ නැත්නම් කණ්ඩායම් හිටියා අපිට කතා කරනවා. එහෙම නැත්නම් අපිට හම්බ වෙනවා. ඒ හම්බ වෙන වෙලාවල්වලදී අජිත් කුමාර මන්ත්‍රීතුමා කිව්ව අම්මා වචනය එතුමිය පෝස්ටරයට දා ගත්තේ ඒ වෙලාවේ අවශ්‍යතාවයට නෙමෙයි. සැබවින්ම මාතාවක් හැටියට දයාබරණීය මවක් ඒ මාතාව පිළිබඳව කතා කරන්න පුළුවන් කියලා කියන්නේ ඔබතුමාට අත්දැකීම් නෑ කියලා කිව්වා. නමුත් අපිට ඒ අත්දැකීම තිබුණා. අපි ගෙදරට ගියහම කතා කළේ තමන්ගේ දරුවෙකුට වගේ තමයි. කොහොමද පුතේ දේශපාලනය. දැන් මොනවද කරගෙන යන්නේ. ඒ සඳහා අවශ්‍ය කරන දැනුම එතුමිය ලබා ගත්ත අත්දැකීම. ඒ සියල්ල අපිට එතුමිය ලබා දෙනවා. ලබාදීලා අපේ දේශපාලන ගමනට මහා හයියක් දීපු දේශපාලන කාන්තාවක්. ඒ නිසා එතුමිය පිළිබඳව කතා බහ කරන්න ඒ පරපුර පිළිබඳව මොහාන් එල්ලාවල මැතිතුමා එල්ලාවල පරම්පරාව පිළිබඳව කතා කරන්න

මේ සභාවේ අපි විවිධ අවස්ථා උපයෝගී කර ගත්තා. ඒ නිසා මම මේ සභාවේම ඉන්න සියළු දෙනාට අවස්ථාව ලබා දෙන ගමන් අපේ පුංචි ඉල්ලීමක් තිබුණා රත්නපුර දිස්ත්‍රික්කයේ මහා බලාපොරොත්තුවක්. ඒ බලාපොරොත්තුව නන්ද එල්ලාවල මැතිතුමාගේ ඒ බලාපොරොත්තුව ගිලිහුණා. ඊළඟට මොහාන් එල්ලාවල මැතිතුමාගෙන් ඒ බලාපොරොත්තුව ගිලිහුණා. ඒවගේම නාලන්ද එල්ලාවල මැතිතුමාගෙන් ඒ බලාපොරොත්තුව ගිලිහුණා. ඒ නැති වෙච්චි මහා දේශපාලන හයිය අවාසනාවකට නැති වුණා .ඉන් අනතුරුව දයාබරණීය සුරංගනී එල්ලාවල ඒ දේශපාලන චරිතය තුළ ඒ බලාපොරොත්තු වුණු දේ ඒත් අවාසනාවකට අහිමි වුණා. ඒ නිසා මේ රත්නපුර දිස්ත්‍රික්කයත් රත්නපුර ආසනයත් එල්ලාවල පරපුරෙන් ඈත් කරන්නවත් දේශපාලන වශයෙන් වෙන් කරන්නවත් බෙදන්නවත් කාටවත් පුළුවන්කමක් නෑ. ඒ නිසා අද රත්නපුර දිස්ත්‍රික්කයේ රත්නපුර ආසනයේ ප්‍රධානව මේ පරපුර ඉල්ලනවා. මේ දේශපාලනයට ඉල්ලනවා. ඒ නිසා අපි එදාත් ආරාධනා කළා වගේ එල්ලාවල පරපුරේ තව ඉතුරු වෙලා ඉන්නේ එකම පුරුකයි . ඒ දයාබරණීය මවක් විදිහට ඒවගේම දේශපාලන පරපුරක ඒ දේශපාලන ගමන් මඟට මහා ශක්තියක් වුණු නායිකාවක් විදිහට ඒ නායිකාවගේ දරුවෝ හැටියට අද ඉතුරු වෙලා ඉන්නේ එකම දරුවයි. විශාකා එල්ලාවල කියන ඒ එල්ලාවල පරපුරේ අපි යෝජනාවක් කරනවා තමන්ගේ පියා තමන්ගේ බාප්පා එහෙම නැත්නම් තමන්ගේ සහෝදරයා තමන්ගේ මව මේ දේශපාලනය කළේ තමන්ට අවශ්‍යතාවයට නෙමෙයි ඒ අවශ්‍යතාවය හුදෙක් රත්නපුර දිස්ත්‍රික්කයේ ජනතාවගේ අවශ්‍යතාවය ඕනකම ඒවගේම හිඩස පුරවන්න අපි ආරාධනා කරනවා ඇයටත් මේ දේශපාලන ගමන එතනින් අවසන් නොකර එල්ලාවල පරපුරේ විශේෂයෙන් සිඩ්නි එල්ලාවල මැතිතුමා නාලන්ද එල්ලාවල මැතිතුමා ,සුරංගනී එල්ලාවල මැතිණිය සහ විශාඛා එල්ලාවල

මැතිණියටත් මේ දේශපාලන ගමන් මඟ අරගෙන යන්න කියන ආයාචනයත් කරමින් දීර්ඝ කාලයක් දේශපාලන වශයෙන් කටයුතු කරපු මවක් දේශපාලන කාන්තාවක් වශයෙන් ඉතාම සුපිරිසිදුයි. දේශපාලන චරිතයක් විදිහට අපි ආදරය කරපු සුරංගනී එල්ලාවල මැතිණියට අවසාන වශයෙන් අපි හැමෝම ප්‍රාර්ථනා කරනවා ඇයට අමා මහ නිවන් සුවය අත් වේවා කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
-------------------------------------------------------------

ස්තුතියි ගරු අමාත්‍ය අතුල කුමාර රාහුබද්ධ මැතිතුමාට. මීළඟට ගරු යෙහෙයියා එම්. ඉෆ්ලාර් මැතතුමා.

***ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර්***
***கௌரவ உறுப்பினர் எம்.வை.எம்.இப்லார்***
*Hon.Member M.Y.M.Iflar*
----------------------------------------

ගරු සභාපතිතුමනි රත්නපුර දිස්ත්‍රික්කයේ හිටපු දීප්තිමත්, ඒවගේම ජනතාවට අමතක නොවන පවුලක් වන එල්ලාවල පවුලේ එක පුරුකක් පිළිබඳව ඉතාම ශෝජනීය යෝජනාවක් ගෙනෙන මොහොතක තමයි අපි මේ අවස්ථාවේදී කතා කරන්නේ ගරු සභාපතිතුමනි. අපි කවුරු මොනවා කිව්වත් යමෙක් ඉපදුණා නම් මරණය නියතයි. ඒ කොහොම වුණත් රත්නපුර දිස්ත්‍රික්කයේ ජනතාව දිහා ගත්තහම කිසි දවසක එල්ලාවල පවුල අමතක කරලා එල්ලාවල නාමය අමතක කරලා අපිට යන්න පුළුවන් කමක් ලැබෙන්නේ නෑ. මම එහෙම කියන්න එක හේතුවක් තමයි නන්ද එල්ලාවල, නාලන්ද එල්ලාවල ,සුරංගනී එල්ලාවල කියන නම මේ රත්නපුර මැතිවරණ කොට්ඨාශය තුළ අපි සියළු දෙනාට වගේම ජනතාවට සමීප වෙච්ච ජනතාවට සුවිශාල සේවාවන් රාශියක් ඉෂ්ට කරපු ජනතාවට සෙවනක් ලබා දුන්නු පවුලක් තමයි එල්ලාවල පවුල. අපිට විශේෂයෙන් කතා කරන මට මගේ පියාණන් සමඟ ඉතා දීර්ඝ කාලයක් ඇසුරක් පැවතිච්ච පවුලක් තමයි නන්ද එල්ලාවල අපේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා. ඉන් අනතුරුව අපිට ඉතාමත්ම කෙටි කාලයක් පාසැල් අවධියේ හම්බ වුණු නාලන්ද එල්ලාවල අපේ හිටපු මන්ත්‍රීතුමා ඒවගේම සබරගමු පළාත් සභාව තුළත් 1993 දී අපිත් එක්ක නාමයක් තමයි නාලන්ද එල්ලාවල මැතිතුමා. ඉන් අනතුරුව 1999 දී මේ පළාත් සභාවේ ගරු අමාත්‍යවරයෙක් වශයෙන් හමු වෙච්ච ආදර නාමයෙන් අමතන අම්මා යන නමින් විරුධාවලිය ලබමින් ඒවගේම සියළු දෙනාට අම්මා කෙනෙක් වෙමින් මේ පළාත් සභාවට අමාත්‍යවරයෙක් වශයෙන් තේරී පත් වෙච්ච සුරංගනී එල්ලාවල මැතිණියගේ ශෝක යෝජනාව මේ අදහස් ප්‍රකාශ කරන අවස්ථාව අපි කාටත් ශෝක වුණත් මේ සබරගමුවේ රත්නපුර දිස්ත්‍රික්කයේ ජනතාවට අම්හිරි සේවාවන් රාශියක් ඉෂ්ඨ කරමින් ඒවගේම විශාල සම්බන්ධකම් පවත්වමින් අපිට නොමැකෙන නාමයක් ඉතුරු කරමින් කටයුතු කරපු පවුලක් තමයි මේ එල්ලාවල පවුල. ගරු සභාපතිතුමනි මට විශේෂයෙන් සම්බන්ධකම් රාශියක් පවතිනවා . මොකද දේශපාලනයත් සමඟ අපේ ව්‍යාපාර කටයුත්තත් නන්ද එල්ලාවල, නාලන්ද එල්ලාවල ඒවගේම සුරංගනී එල්ලාවල මැතිණිය අපිට සම්බන්ධයි. ඒවගේම එතුමියගේ වාහන සම්බන්ධයෙන් සහ විවිධ කටයුතු වලදී අපිත් එක්ක නිරන්තරයෙන්ම සම්බන්ධයක් තිබුණා. ඉන් අනතුරුව ශ්‍රී ලංකා නිදහස් පක්ෂ කාර්යාලය තිබුණේ මගේ පියාට අයිති ඉඩමක. මට අද මතක් වෙනවා එතුමිය ගෙදරට ගෙනල්ලා ඒ කිසි ඇල්පෙනෙත්තක දෙයක් බලාපොරොත්තු නොවී සමහර උදවිය දීර්ඝ කාලයක් පදිංචි වී සිටියාම විශාල මුදල් ඉල්ලන අවස්ථාවකදී ඇලපෙනෙත්තක දෙයක් අපෙන් බලාපොරොත්තු නොවී සියල්ල අරගෙන මීට පස්සේ කරන්න කෙනෙක් නෑ. මේකේ කාර්යාලය මෙච්චර කල් දීලා තිබුණා. අපිට දැන් අයිති නෑ ඔයගොල්ලන්ගේ දෙයක් කියලා ගෙදරට ගෙන්න ගෙන එදා අපිත් එක්ක හිටපු මේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා වශයෙන් කටයුතු කරපු මොහාන් සාලිය එල්ලාවල මැතිතුමාත් කැඳවාගෙන එතුමියගේ බටුගෙදර නිවසට

ගෙනල්ලා අපිට ඒ යතුර දීපු අවස්ථාව මතක් වෙනවා. එවැනි ඉතාමත් පටු දේශපාලනයවත් ලාභ ප්‍රයෝජනයක්වත් නොලැබූ එවැනි දෙයක් බලාපොරොත්තු නොවෙච්චි එකම දෙය තමයි සමාජයට මහජනතාවට සේවය කිරීම පමණයි. අද අපි මේ කතා කරන මොහොත එතුමියට වැදගත්. මොකද එතුමිය බලාපොරොතතු වුණේ මෙන්න මේක විතරයි. ජනතාව අපේ පවුල යමක් කළා කියා හිටියොත් ඒක තමයි අපි කවුරුත් බලාපොරොත්තු වෙන්නේ. දේශපාලඥයෙක් කිව්වොත් අද හැමෝම හිතන්නේ කෝටි ප්‍රකෝටි ගාණක් හම්බ කරනවා නමුත් එතුමිය එක පැත්තකින් තමන්ගේ ස්වාමි පුරුෂයා නැති වෙන කොට තමන්ගේ පුත්‍රයා දේශපාලනයට එනවා. දේශපාලනයට ඇවිල්ලා මහ මඟ අපි නොහිතන මොහොතක ඉතාමත්ම අවාසනාවන්ත සිද්ධියකට සම්බන්ධ වෙනවා. ඒක නැති වුණහම ජනතාවගේ ඉල්ලීමට තමයි එතුමිය දේශපාලන කරලියට එන්නේ. ඒ හිඩස අදත් තාමත් බෑ රත්නපුරේ අද මේ එල්ලාවල පවුල ගැන අපි කවුරු කතා කරන්නේ නැතත් රටේ ජනතාව විශාල ප්‍රමාණයක් කතා කරනවා. මොකද සමහර ඉඩම්වල අද ඉන්න කොට නාලන්ද ,නන්ද එල්ලාවල දීපු ඉඩම්. සමහර අයගේ පැති වලට ගිහිල්ලා කතා කරන කොට පාලමක්. බෝක්කුවක්. අද හුහක් දෙනෙකුට මතක නැති වුණත් එදා රක්ෂාවක් දෙන

කොට චිට් එකෙන් තමයි දුන්නේ අද වගේ නෙමෙයි. එවැනි අවස්ථා විශාල ප්‍රමාණයක් මේ දිස්ත්‍රික්කයේ කිසිම භේදයක් බැලුවේ නෑ. මගෙ පියා දිහා බලන කොට 1970,1977 එදා කිසි දෙනෙකුට භාණ්ඩ පිට රටකින් ගෙන්නන්න පුළුවන්කමක් තිබුණේ නෑ. මගේ පියාට දුන්නේ බලපත්‍රයක් පිට රටින් භාණ්ඩ ගෙන්වන්න. ආනයනය කරන්නත් බලපත්‍රය දුන්නේ එදා නන්ද එල්ලාවල. මෙවැනි අය දේශපානය බැලුවේ නෑ. ජාතිය බැලුවේ නෑ. කුලය බැලුවේ නෑ. රටේ සමාජයට තමන්ට කරන්න පුළුවන් උදව්ව උපකාරය මොකක්ද ඒක තමයි එක හෙලාම ඉෂ්ඨ කළේ. නමුත් මම හරිම ආඩම්බරයි. ඒ අවසාන කාලයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හිටියත් වර්තමාන ජනාධිපතිතුමා එතුමියට ගෞරව වශයෙන් මධ්‍යම පළාතේ ආණ්ඩුකාර ධූරය ලබා දුන්නා. එතුමියට ලබාදීපු ස්වල්ප මොහොතකින් මම එතුමියට කතා කරලා සුභ පැතුවා. එතුමිය ආපහු ඇහුවා හිතේ සතුටින් කැමැත්තෙන්ද කියලා ඔබතුමිය මම සුභ පතන්නේ හද පතුලින්ම. ඇයි මම මේ ඔබතුමියට මෙය ලැබීම හරි සතුටුයි කියලා. මොකද අපේ පවුලත් එක්ක තිබිච්ච බද්ධ වෙච්ච ඒ සහෝදරත්වය ඒ බැඳීම අපිට අදත් තාමත් මතකයි. ඒ නිසා එතුමිය මේ කළ සේවාව තුළින් මම දන්නවා කවුරු මොනවා කිව්වත් අද මේ වෙන කොට හොඳ තැනක හොඳ ආත්මයක් ලබන කාන්තාවක්. එතුමිය කරපු සේවාවන් කිසි කෙනෙකුට අමතක කරන්න බෑ. අවසානයේ එතුමිය බෞද්ධ චින්තනයේ ඒවගේම බෞද්ධ ආගම අදහන පවුලක් සහ එතුමියට මම ප්‍රාර්ථනා කරනවා අවරාමර නිවන් සුවය අත් පත් වේවා යැයි ප්‍රාර්ථනය කරමින් ඔබතුමිය මට අවස්ථාව සලසා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙමින් ඒ පවුලේ එතුමියගේ සහ පවුලේ උදවියට අපගේ ශෝකය එළ කර යවන මෙන් ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

-----------------------------------------------------------

ස්තුතියි යෙහෙයියා එම්.ඉෆ්ලාර් ගරු මන්ත්‍රීතුමාට. මීළඟට භාණු මුණිප්‍රිය මැතිතුමා.

***ගරු අමාත්‍ය භාණු මුනිප්‍රිය***
***கௌரவ அமைச்சர் பானு முனிப்பிரிய***
*Hon. Minister Bhanu Munipriya*

-----------------------------------------------------------

ගරු සභාපතිතුමනි අපි මේ මාස එක හමාරක් වැනි කාලයක් තුළ පළාත් සභාව නියෝජනය කරපු ඉතාමත්ම විශිෂ්ඨ ගණයේ දේශපාලන නායකයන් කීප දෙනෙක් ගැන ශෝක පනිවිඩ ගෙනාවා. එයින් පළවෙනියා හැටියට ෆැන්සිස් සියඹලාපිටිය මැතිතුමා. ඊළඟට කුලරත්න මැතිතුමා. අද සුරංගනී එල්ලාවල මැතිණිය. ගරු සභාපතිතුමනි රත්නපුර දිස්ත්‍රික්කයේ දේශපාලනයේ නිරත වෙච්චි කෙනෙක් හැටියට සුරංගනී එල්ලවල මැතිණිය මට මුණ ගැහෙන්නේ බොහොම කාලයකට පස්සේ. හැබැයි දේශපාලනික වශයෙන් එතුමියගේ ආදරණීය ස්වාමිපුරුෂයා නන්ද එල්ලාවල මැතිතුමා 1970 අපි ඉතාම කුඩා දරුවෝ. 77 වෙන කොටත් අපි තුනේ පංතියේ. හයේ පංතියේ තරමේ. හැබැයි රත්නපුර දිස්ත්‍රික්කය නියෝජනය කරන්න තරුණ මන්ත්‍රීවරු තිදෙනෙක් පාර්ලිමේන්තුවට ගියා. එක්කෙනෙක් කලවාන මැතිවරණ කොට්ඨාශයේ සරත් මුත්තෙට්ටුවගම මැතිතුමා කිරිඇල්ල මැතිවරණ කොට්ඨාශයේ වාසුදේව නානායක්කාර මැතිතුමා ,රත්නපුර මැතිවරණ කොට්ඨාශයෙන් නන්ද එල්ලාවල මැතිතුමා. මේ අයගේ දේශපාලනය වමේ දේශපාලනය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය

ලංකා නිදහස් පක්ෂයේ නායකයන් නිසා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට වමට බර අයට වෙන් වෙලා පක්ෂයෙන් වෙන් වෙලා 78 වාමාංශික එක්සත් පෙරමුණෙන් ඡන්ද ව්‍යාපාරයට ආවා. ඒ ඡන්ද වයාපාරයේ එක අපේක්ෂකයෙක් මගේ පියා. එදා හිටපු පළාත් සභා මන්ත්‍රී ඒ.විලියම් මැතිතුමා. බලංගොඩ ආසනයේ. නන්ද එල්ලාවල මැතිවරණ රත්නපුර ආසනයේ වාමාංශික එක්සත් පෙරමුණ. තරුව ලකුණ. කිරිඇල්ලෙන් වාසුදේව නානායක්කාර මැතිතුමා. සරත් මුත්තෙට්ටුවගම මැතිතුමා කලවානෙන්. හැබැයි ඒ මැතිවරණ හැම එකෙකම. එක්සත් ජාතික පක්ෂය දිනුවත් ඔය කියපු ආසන තුනේ දෙවෙනි ස්ථානයට නන්ද එල්ලාවල මැතිතුමාට ඡන්ද ලබා ගන්න පුළුවන්කම ලැබුණා. එතුමාගේ තිබුණ පුද්ගලික නායකත්වය පෙන්නුම් කරමින් සැබෑ දේශපාලන පෞර්ෂය පෙන්නුම් කරමින් මම ඒ නිසා කුඩා කාලයේ බලංගොඩදී හමු වුණ එක් අවස්ථාවක අසූ ගණන්වල මම එතුමාගෙන් දේශපාලන කාරණා ටිකක් විමසුවා. එතුමා කිව්වා මෙයාට දේශපලාන දැනුමක් තිබෙනවා. පස්සේ කතා කරමු. එතකොට කවුද කිව්වා විලියම් සහෝදරයාගේ පුතා කියලා. ඒ මැතිවරණයේ එතුමාට තිබුණා 800 දුඹුරු පාට වැන් එකක්. ඒ මැතිවරණයේදී එතුමාගේ

නියෝජනය කරපු මන්ත්‍රීවරයා වුණේ නන්ද එල්ලාවල මැතිතුමා හැබැයි ආභාසය චීන කොමිනිෂ්ට් පක්ෂ ආභාසය. එතුමාගේ දේශපාලන වේදිකාවේ පදයෙන් පදය වචනයෙන් වචනය කතා කළේ දුක් විදින පෑගෙන ගොවියාගේ කම්කරුවාගේ අයිතිවාසිකම් ගැන කතා කළේ . මේ තිදෙනාට ත්‍රිසූලය කියලා කිව්වා. රත්නපුර ත්‍රිසූලය දෙනෙක් අද ජීවතුන් අතර නෑ.

ගරු සභාපතිතුමනි 78 වෙන කොට සමගි පෙරමුණ ආණ්ඩුව තුනෙන් දෙකේ බලයක් තිබුණ පිලිප් ආර්.ඩී.බණ්ඩාරනායක මුදල් ඇමතිවරයාගේ සහ අත්තනෝමතික ශ්‍රී

වාහනයේ සම්පූර්ණයෙන්ම ගහලා වාහනය කුඩු කරලා තිබුණා. එතුමා මැතිවරණය අවසාන වෙනකන් ඒ වීදුරුව අලුතින් දාන්නේ නැතුව වැස්සේ තෙමී ගෙන අව්වේ වේලීගෙන ඒ වාහනයේත් තමාම ධාවනය කරමින් රියදුරා හැටියට මැතිවරණ ව්‍යාපාරයේ මුළු දිස්ත්‍රික්කයේම ගියේ. දිස්ත්‍රික්කයේ පළවෙනි වතාවට එතුමා අකාලයේ අපිට නැති වුණා. එවැනි දේශපාලන නායකයෝ සත පහක්වත් මැතිවරණයට දේශපාලනයෙන් හම්බ කරපු නැති තම ව්‍යාපාරයෙන් දේශපාලනය කරපු හදවතේ මනුස්සයාට ආදරයක් තිබ්ච්ච නායකයින්ගෙනුත් තිබ්ච්ච රත්නපුර දිස්ත්‍රික්කයේ ඉතාමත් ප්‍රපාතවත් නායකත්වයක් එතුමා විසින් හිමි කරගෙන තිබුණා . දේශපාලනයත් කළා. ඉන් පස්සේ නාලන්ද එල්ලාවල මැතිතුමා කොළඹ විශ්ව

විද්‍යාලයට ඇතුළත් වෙන කොට ගරු සභාපතිතුමනි මම කොළඹ විශ්ව විද්‍යාලයේ දෙවෙනි වසරේ. එතුමා ආර්ථික විද්‍යාව තමාගේ උපාධියට හැදෑරුවේ. එතුමාගේ කාලයේ එතුමායි මමයි ඉතාම ළඟ මිතුරන් බවට පත් වුණා. අපි සමඟ මට වඩා ජ්‍යෙෂ්ඨ අතුල ආටිගල මැතිතුමා අවසාන අවුරුද්දේ ඉගෙන ගත්තේ. එතුමාත් මේ රත්නපුර දිස්ත්‍රික්කයේ අපිට අහිමි වුණා. ඒවගේම වාසුදේව නානායක්කාර මැතිතුමාගේ පුතා සිව නානායක්කාර මැතිතුමා හිටියා අපිත් එක්ක. මනෝරත්න පරණ විතාරන, දයාසිරි ජයසේකර අර පත් කරපු මන්ත්‍රී හිටපු විනිශ්චයකාරවරයා බණ්ඩාර ජනක බණ්ඩාර මෙහේ හිටපු ආණ්ඩුකාරතුමා. අපි එක යුගයේ කට්ටිය. නාලන්ද මැතිතුමා ලිව්වේ වම් අතින්. එතුමා ක්‍රීඩාවට දක්ෂයි. බැට්මින්ටන් ක්‍රීඩාව කළේ වම් අතින්. එතුමා නීති විද්‍යාලයේ ඉගෙන ගන්න කොට නීති විද්‍යාලයේ බැට්මින්ටන් ක්‍රීඩාවේ නායකත්වය දෙන කොට නීති පීටයේ බැට්මින්ටන් කණ්ඩායමේ නායකත්වය දුන්නේ මම. අපි හමු වෙනවා හැමදාම. ක්‍රීඩා වර්ණ උත්සව වලට. ඒවගේම සම්භාසන වල. රාත්‍රී තුන හතර වෙනකන් සිංදු කියන්න. එකට එකතු වෙන සම්භාසන. ඉතාමත්ම හොඳ මිත්‍රයක්. ගරු සභාපතිතුමනි

තැනම හැසුරුණු නිසා. අම්මා වගේ හැසුරුණේ නැත්නම් ඒවට වෙන වචනයක් කියනවා. ඒ නිසා ඇත්තටම ස්වභාවයෙන්ම දරුවන්ට ආදරේ හැම කෙනෙකුටම ආදරයෙන් අම්මා වගේ කතා කරන්න ආදරය දක්වන්න පුළුවන් වුණ නිසා සැබෑ රත්නපුර දිස්ත්‍රික්කයේ ජනතාවගේ අම්මා සුරංගනී එල්ලාවල මැතිණිය අම්මා බවට පත් වුණා. මේ පළාත් සභාවේ පරිවාස හා ළමා රක්ෂක ඇමතිවරයා වශයෙන් ඉන්න කොට මම අයවැය කතා කළා. මම යෝජනා කළා. එතුමිය ඊළඟ අවුරුද්දේ පාර්ලිමේන්තුවට ගියා. ඒ පාර්ලිමේන්තුවට යන කොට ගරු සභාපතිතුමනි අපි දැක්කා අම්මා පාර්ලිමේන්තුවට යනවා කියලා. පසුව ගරු සභාපතිතුමනි තමන්ගේ ආදරණීය පුත්‍රයාට වෙඩි තියලා ඒ ජීවිතය අහිමි කරපු වෙලාවේ එතුමිය සමහර රැස්වීම්වල කිව්වේ මගේ පුතා හා පැටියෙක් වගේ අහිංසකයි මරලා දැම්මා. මම එතුමියගේ වේදිකාවල කතා කළා. එතුමිය රාවය පත්තරයට එතුමියගේ දේශපාලන අවසාන කාලයේ ලියපු ලිපියක් තාම අපේ හදවත් තුළ තියෙනවා ගරු සභාපතිතුමනි. ඒ ලිපියෙන් කියන්නේ මොකක්ද. එතුමිය කියනවා මමත් නන්ද එල්ලාවල මැතිතුමාත්

එතුමා අපිට අහිමි වුණා. එතුමා අපිට අහිමි කරා. ඉන් අනතුරුව මේ රත්නපුර දිස්ත්‍රික්කයේ නිල් දජය වැටෙන්නට නොදී එහි නායකත්වය රත්නපුරට අත්‍යාවශ්‍යයි කියන කොට රත්නපුර මැතිවරණ කොට්ඨාශයෙන්මයි වෙන්න ඕනේ කියන කොට එය අතට ගත්තේ සුරංගනී එල්ලාවල මැතිණිය. එතුමියට අම්මා කියලා කවුරුත් කිව්වා. ගරු සභාපතිතුමනි ශ්‍රීලංකා නිදහස් පක්ෂයේ අම්මා සිරිමාවෝ ආර්.ඩී.බණ්ඩාරනායක මැතිණිය හැබැයි ශ්‍රීලංකා නිදහස් පක්ෂයේ තව කාන්තාවෝ ඉන්නවා. රත්නපුර දිස්ත්‍රික්කයේත් ඉන්නවා. දේශපාලනය කරනවා. ඒ අයට අම්මා කියලා කියන්නේ නෑ. සිරිමාවෝ මැතිණියටයි අපි අම්මා කියලා කිව්වේ. අම්මා වගේ පක්ෂය ආරක්ෂා කළා. සුරංගනී එල්ලාවල මැතිණියට අම්මා කියලා කිව්වේ අම්මා වගේ හැම

රත්නපුර ජීවත් වෙලා ඉන්න කාලයේ මගේ කුඩා පුතා නාලන්ද කුඩා දරුවෙක්ව ඉන්න කාලයේ අපිට හිටියා හම්බන්තොට දිස්ත්‍රික්කයේ දේශපාලනය කරපු ඉතාමත් ප්‍රපාතවත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකයෙක්. එයා නීතිඥවරයෙක්. එතුමාට කොළඹ යන්න අවස්ථාව එන කොට වඩා වැඩි දවස්වල උදේ එන්නේ මගේ නිවසට. උදේ පාන්දර තම වාහනයෙන් ඇවිල්ලා ඒ වාහනයෙන් හෝ නන්ද එල්ලාවල මැතිතුමාගේ වාහනයෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ වැඩ වලට එක වාහනයේ යනවා. ඒ එන අවස්ථාවේ මගේ ස්වාමි පුරුෂයා නන්ද එල්ලාවල ලෑස්ති වෙන කොට ඇඳුම් අඳින කොට මගේ කුඩා පුත්‍රයා ඇඳේ ඉඳන් අඬනවා. ඒ අඬපු ගොඩක් අවස්ථාවල අපේ හම්බන්තොට අපේ මිත්‍රයා නීතිඥ මහත්තයා ඒ කුඩා දරුවාව වඩා ගෙන කොරිඩෝවේ එහාට මෙහාට සක්මන් කරමින් ඒ දරුවාව

නලවනවා අපිට මතකයි. මගේ පුත්‍රයාව කුරුවිට වෙඩි තියලා මරපුවාට පස්සේ ලංකා ඉතිහාසයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් මැරුවාට පස්සේ අද වෙන කොට තත්ත්වය මොකක්ද. ඒකට විත්තියේ හිට ගන්නා මගේ දරුවාගේ මරණයට විත්ති කූඩුවේ හිට ගන්නා මන්ත්‍රීවරු දෙදෙනා අද අපේ ආණ්ඩුවේ ඇමතිවරු. ඒක එකක් පෙන්නුම් කරලා පෙන්වනවා. ඒ තමයි අහිංසක මගේ නාලන්ද පුත්‍රයාගේ අවසානයේ මේ විත්තිකාරයෝ දෙදෙනා නිදහස් වෙන්නට නියමිතයි. අම්මා කෙනෙක් වශයෙන් අහිංසක දරුවෙක්ගේ මරණයට යුක්තිය ඉෂ්ඨ වෙන්නේ නැති ආණ්ඩුවක මට ඉන්න කිසිසේත් ඉඩ දෙන්නේ නෑ. හැබැයි මම ක්‍රියාකාරී දේශපාලනයෙන් ඉවත් වුණත් පක්ෂයෙන් ඉවත් වෙනවා. පක්ෂයේ ක්‍රියාකාරිත්වයෙන් ඉවත් වෙනවා කියලා කිව්වා. මට වඩාත් ප්‍රභූද්ධ අර හම්බන්තොට ඉඳන් අර මගේ කුඩා දරුවා අඬන කොට වඩා ගත්ත නලෝපු ඒ නායකයා තමයි අද අපේ රටේ නායකයා කියලා ලිව්වා.

එම නිසා ගරු සභාපතිතුමනි එක අවස්ථාවක් මේ රත්නපුර පියදාස මුදලාලිගේ ගෙදර මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාත් මමත් තවත් කීප දෙනෙක් ඉන්න වෙලාවේ සුරංගනී එල්ලාවල මැතිණිය බලන්න අපි කට්ටිය එකතු වෙලා ගියා. එතුමියගෙ හදවතේ වේදනාව තිබුණත් ඒ පසුගිය කාරණා සම්බන්ධයෙන් එතුමා ඉතාම සිනා මුසු මුහුණින් අපිව හිටපු ජනාධිපතිතුමාව පිළිගත්තා. ඡායාරූප ගත්තා. අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමයි එතුමියයි මමයි එකට තිබුණ ඡායාරූපය කෙනෙක් මට රාමු කරපු ගෙනල්ලා දුන්නා. ඒක තාම මගේ නිවසේ තියෙනවා ගහලා. ඒ මැද ඉන්න අම්මා කවුද කියලා සමහරු දන්නවා. සමහරු දන්නේ නෑ. සමහරු හිතනවා මගේ අම්මා කියලා . සමහරු හිතනවා මගේ නෝනාගේ අම්මා කියලා. හැබැයි ගරු සභාපතිතුමනි එහෙම වුණත් එතුමිය ඉතා වේදනාවෙන් ශ්‍රීලංකා නිදහස් පක්ෂය හැර ගියේ නෑ. ශ්‍රීලංකා නිදහස් පක්ෂය ආරක්ෂා කර ගන්න හැබැයි ක්‍රියාකාරී දේශපාලනයෙන් ඉවත් වුණා තමාගේ පුතාට වෙච්ච අසාධාරණය පේන කොට. ඒවගේම ඒ විත්තිකාරයෝ නිදහස් වුණා ඒ නඩු වලින්. ඒවගේම පැමිණිල්ලේ සාක්ෂිකාරයන්ට දෝෂාරෝපණය කළා ඒ නඩුවේදී. එම නිසා ගරු සභාපතිතුමනි මේ ශ්‍රීලංකා නිදහස් පක්ෂයේ උන්නතිය , මේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ජයග්‍රහනය තම ජීවිත කැපවීමෙන් ගෙන ගිය පරම්පරාවේ අම්මාට අපේ කාලයේම සිද්ධ වෙච්චි කාරණා අපේ හදවතේ වේදනාවක් තිබුණා. මගේ ළඟ මිත්‍රයෙක් නිසා. එක විත්තිකාරයෙක්ට මගේ බලංගොඩ ආසනයේ මට තරඟ කරන්න වුණා. ඒක ඊහාවට ආපු වේදනාව. මමත් නාලන්ද එල්ලාවල මැතිතුමාගේත් සමහර කාරණා කිව්වහම සුරංගනී එල්ලාවල මැතිණිය බොහොම දයාවෙන් අත අල්ලලා තමාගේ පුතාගේ අත අල්ලලා වගේ අපිට ආදරය කළා. අපි කතාවක් කළොත් කතාවේ වැරදි ඇති. එතුමියට පෙනෙන. ඔබ එක්සත් ජාතික පක්ෂයේද ශ්‍රීලංකා නිදහස් පක්ෂයේද ඒක අදාල නෑ. එතුමිය අපේ හොඳ පමණයි කියන්නේ. මම අහලා තියෙනවා විශාඛා එල්ලාවල මැතිණිය කියනවා අපේ අම්මා කියන්නේ හොඳ විතරයි. එතුමියගේ හදවතේ එන්නේ නෑ වරදක් කියන්න.

එම නිසා ගරු සභාපතිතුමනි ශ්‍රීලංකා නිදහස් පක්ෂ නායක අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා අවසාන වශයෙන් මධ්‍යම පළාතේ ආණ්ඩුකාර ධූරය හොඹවන්නට එතුමියට ආරාධනා කිරීම පක්ෂයේ එතුමියගේ අවසාන කාලයේ එතුමියට සාධාරණය ඉෂ්ඨ කිරීමක් කියලා මම ඉතාමත්ම ගෞරවයෙන් මතක් කරන්නට ඕනේ. එම නිසා එතුමියට තම දේශපාලන ජීවිතය අවසාන මොහොතේදී ගෞරවනීය රජයේ ගෞරව සහිතව ඒ සියළු කටයුතු වලට රජයේ සහභාගී වෙන්නට පුළුවන්කම ලැබුණේ ඒ නිළය ලැබීමෙන්. එම නිසා

කුමන ප්‍රශ්නය තිබුණත් දැන් සමහරු හදන්නේ පක්ෂය කඩන්න. ඊට වඩා ප්‍රශ්න තිබුණත් තම දරුවාගේ වෙච්චි ප්‍රශ්න පෙනි පෙනී දැන් ඇත්තටම නඩුවේ තීන්දුව ගන්න කොට එතුමාට වෙඩි තියලාත් නෑ. මරලාත් නෑ. ඔක්කෝම නිදහස්. හැබයි එහෙම තියාගෙනත් ගරු සභාපතිතුමනි පක්ෂය ආරක්ෂා කරන්න. ක්‍රියාකාරිත්වයෙන් ඉවත් වුණත් පක්ෂය ආරක්ෂා කරගෙන හදවතේ තියාගෙන ජීවත් වුණා. එතුමියට අපි පක්ෂයක් වශයෙන් නොව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඒ ගෞරවනීය කාන්තාව අම්මාට අපි ශෝක පනිවිඩය එතුමියගේම ස්වාමිපුරුෂයාට නන්ද එල්ලාවල මැතිණිය සමග එතුමියගේම දරුවන් වෙලා නාලන්ද එල්ලාවල, විශාකා එල්ලාවල මැතිණියලා එකට ජීවත් වෙන්න පුළුවන් අනාගතයේ අපේ නැවත ඉපදෙන අපිත් ප්‍රාර්ථනා කළේ නැවත ඉපදීම්වල සිද්ධ වෙලා අවසානයේ තමා ප්‍රාර්ථනා කරන බෞද්ධයෙක් හැටියට බෝධීන් වහන්සේ නමක් ඉදිරියේ නිවන් සැප ලැබීමට ප්‍රාර්ථනය කරමින් ඒ ශෝක පනිවිඩයේ පිටපත් ඒ ආදරණීය භාර්යාව, දියණිය ඇතුළු පවුලේ සැමට ලබා දෙන මෙන් ඉල්ලමින් ඔබතුමාට මගේ ස්තුතිය ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා බොහොම ස්තූතියි.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

-------------------------------------------------------------

ස්තුතියි ! ගරු භානු මුණිප්‍රිය ඇමතිතුමනි. මීළඟට සමිත ආටිගල ගරු මන්ත්‍රීතුමා.

***ගරු මන්ත්‍රී සමිත ආටිගල***
***கௌரவ உறுப்பினர் சமித ஆடிகல***
*Hon.Member Samitha Atigala*

--------------------------------------------

ගරු සභාපතිතුමනි, සුරංගනී එල්ලාවල මැතිණිය එල්ලාවල පරපුර නියෝජනය කරමින් එතුමිය ඇතුළු ඒ පරපුරේ උදවිය රත්නපුර මේ මැතිවරණ කොට්ඨාශය නියෝජනය කරමින් තමයි දේශපාලන කටයුතුවල නිරත වුනේ. ඒ වගේම එල්ලාවල පරපුර ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරමින් දේශපාලනය කරනකොට මේ රත්නපුරේ මැතිවරණ කොට්ඨාශයේ ආටිගල පරපුරේ උදවියට එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් විරුද්ධ දේශපාලන පක්ෂ දෙකක ඉඳගෙන තමයි දේශපාලන කටයුතුවල නිරත වෙන්න සිදුවුනේ. නමුත් අපි සඳහන් කරන්න කැමතියි ඒ එල්ලාවල පරපුරේ උදවියට වගේම ආටිගල පරපුරේ අයටත් මේ මැතිවරණ කොට්ඨාශය තුළ රත්නපුරේ සහයෝගයෙන් මිත්‍රත්වයෙන් ඒ වගේම අන්‍යෝන්‍ය අවබෝධයෙන් යුක්තව දේශපාලනය කරන්න හැකියාව ලැබුණා. අපට අතීතය මේ වෙලාවේ සිහිපත් වෙනවා. 65 – 70 කාලයේ රත්නපුර දිස්ත්‍රික්කය නියෝජනය කරමින් දේශපාලනය කළේ මගේ පියාත් ධනපාල ආටිගල මැතිතුමා. එතුමා වරකාතොට පාළම මුල්ගල තියන්න කටයුතු කළා. ඒ වැඩ කටයුතු කරගෙන යනකොට එතුමා අභාවයට පත් වුනා. ඒ වගේම දේශපාලනයත් ඒ වගේම වෙනස් වෙලා සමගි පෙරමුණ රජය, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ රජයක් ඒ පාළමේ වැඩ කටයුතු අවසන් වෙනකොට තිබුනේ. ඒ වගේම සඳහන් කරන්න ඕන වරකාතොට පාළම කියන්නේ සභාපතිතුමනි, රත්නපුර නගරය පහුවෙන කොටම පැල්මඩුල්ල පැත්තට යනකොට හම්බ වෙන ප්‍රධාන පාළම. ඉතින් අන්න ඒ පාළම විවෘත කරන වෙලාවේ දී නන්ද එල්ලාවල මැතිතුමා තමයි රත්නපුර පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා හැටියට හිටියේ. ඉතින් ඒ වෙනකොට මගේ පියා මිය ගිහිල්ලා.

ඒ පාළම විවෘත කරන උත්සවයට මගේ මවට ආරාධනා කරන්න තරම් එතුමා කෘතවේදී වුනා කියන එක සිහිපත් කරන්න ඕන. ඒ වගේම නන්ද එල්ලාවල මැතිතුමාගෙන් පස්සේ ආටිගල පරපුරේ උදවිය, එල්ලාවල පරපුරත් එක්ක සහයෝගයෙන් වැඩ කළා. ඒ වගේම අතීත සිද්ධියක් මතක් කරනවා නම් අතුල ආටිගල මන්ත්‍රීතුමා රත්නපුරේ මන්ත්‍රීවරයා හැටියට කටයුතු කරන වෙලාවේ දී ඒ වෙනකොට නන්ද එල්ලාවල මැතිතුමා පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙක් හැටියට කටයුතු කරලා මිය ගිහින් හිටියේ. 1990 හෝ 91 වෙන්න පුළුවන් ඒ කාලය. ඒ වගේම නාලන්ද එල්ලාවල මැතිතුමාත්, සුරංගනී එල්ලාවල මැතිණියත් දේශපාලනයට ඇවිල්ලා හිටියේ නෑ. අන්න ඒ වෙලාවේ දී ඉල්ලාර් මන්ත්‍රීතුමා මතක් කරපු විදිහට ශ්‍රී ලංකා නිදහස් පක්ෂ නන්ද එල්ලාවල මැතිතුමාගේ කාර්යාලය රත්නපුරේ පල්ලිය පාරේ තිබුනේ. ඒ පල්ලිය පාරේ තිබුණ කාර්යාලයේ සම්පූර්ණයෙන්ම දෙර වැහෙන්නම අතුල ආටිගල මන්ත්‍රීතුමාගේ පෝස්ටර් අලවලා තිබිලා තියනවා. ඒ වෙලාවේ

සුරංගනී එල්ලාවල මැතිණිය අතුල ආටිගල මැතිතුමාට කථා කරලා මේ සිද්ධිය කිව්වාම අතුල ආටිගල මැතිතුමා කියලා තියනවා ඒක සිද්ධ වෙන්න පුළුවන් දෙයක් නෙමෙයි කියලා කිව්වාම නෑ, සිද්ධ වෙන්න පුළුවන් දෙයක් නෙමෙයි වුනාට එහෙම දෙයක් තමයි සිද්ධ වෙලා තියෙන්නේ කියලා සුරංගනී එල්ලාවල මැතිණිය කිව්වාම එහෙම නම් මම කාර්යාලය ගාවට එන්නම් කියලා අතුල ආටිගල මැතිතුමා ඒ පල්ලිය පාරේ නන්ද එල්ලාවල මැතිතුමාගේ කාර්යාලයට ඇවිල්ලා තියනවා. ආවාම සිද්ධිය ඇත්ත. සම්පූර්ණයෙන් දොරවල් ටික වැහෙන්නම කාර්යාලයේ දොරවල් අරින්න බැරි වෙන විදිහට පෝස්ටර් අළවලා තමයි තිබිලා තියෙන්නේ. ඒ වෙලාවේ දී එතනදීම අතුල ආටිගල මැතිතුමා එක්ක ආපු අය ලව්වා පෝස්ටර් ටික ඉරලා දාලා, අතුල ආටිගල මන්ත්‍රීතුමා කියලා තියනවා මීට පස්සේ මේ වගේ සිද්ධියක් අනාගතයේ වෙන්න ඉඩ තියන්නෙ නෑ කියලා එතුමියගෙන් සමාව අරගෙන තිබුණා. ඉතින් අන්න එතනදී සුරංගනී එල්ලාවල මැතිණියත් ඉතාමත්ම හැඟීම්බර විදිහට කටයුතු කළා කියලා තමයි අපට දැන ගන්න ලැබෙන්නේ. ඉතින් අන්න ඒ විදිහට සුරංගනී එල්ලාවල මැතිණියත් සමඟ, ඒ වගේම සුරංගනී එල්ලාවල මැතිණිය දේශපාලනයට ආවාට පස්සේ, දේශපාලනයෙන් කාලයක් ඈත් වෙලා ඉන්නැද්දිත් ආටිගල පරපුරේ උදවියත් එක්ක, අපිත් සමඟ ඉතාමත්ම සහයෝගයෙන් වැඩ කටයුතු කරන්න හැකියාව ලැබුණා. එකම මැතිවරණ කොට්ඨාශයේ විරුද්ධ දේශපාලන පක්ෂවල හිටියත් අපට එල්ලාවල පරම්පරාවේ සුරංගනී එල්ලාවල මැතිණිය විතරක් නෙමෙයි නාලන්ද එල්ලාවල මන්ත්‍රීතුමා, ඒ වගේම නන්ද එල්ලාවල මන්ත්‍රීතුමාත් සමඟ සහයෝගයෙන් වැඩ කටයුතු කරන්න හැකියාව ලැබුණා. ඒ සඳහා විශාල දායකත්වයක්, මගපෙන්වීමක් සුරංගනී එල්ලාවල මැතිණියගෙන් ලැබෙන්න ඇති කියලා අපි විශ්වාස කරනවා. නන්ද එල්ලාවල මැතිතුමාගේ බිරිඳ හැටියට, ඒ වගේම නාලන්ද එල්ලාවල මැතිතුමාගේ මව

හැටියට ඒ සියළුම දේශපාලන නායකයන් සමඟ මග පෙන්වීමක් ලැබෙන්න ඇති කියන විශ්වාසය තිබෙනවා. ඉතින් අපි අගය කරනවා ඇත්තටම එතුමියලාත් සමඟ, අපි සතුටු වෙනවා සුරංගනී එල්ලාවල මැතිණියලාත් සමඟ මේ මැතිවරණ කොට්ඨාශය තුළ දේශපාලනය කරන්න හැකියාව ලැබීම පිළිබඳව. ඒ වගේම සුරංගනී එල්ලාවල මැතිණියත් සමඟ මිත්‍රශීලී විදිහට කටයුතු කළා කියන එක සඳහන් කරමින්, එතුමියට අමාමහ නිවන් සුව ලැබේවා ! කියා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---

ස්තුතියි ! ගරු සමිත ආටිගල මන්ත්‍රීතුමාට. මීළඟට සභානායක ගරු අසෝක ජයවර්ධන මැතිතුමා. ඔබතුමාට නිරෝගීමත්

සුභම සුභ වාසනාවන්ත උපන්දිනයක් වේවා ! කියලා සභාවේ සියළුම දෙනා වෙනුවෙන් සුභ පැතුම් ප්‍රාර්ථනා කරනවා. ඔබතුමාට අවස්ථාව.

***ගරු සභානායක අසෝක ජයවර්ධන මැතිතුමා.***
***கௌரவ அ.கட்சி அமைப்பாளர் அசோக ஜயவர்தன***
*Hon.Gov.Whip Asoka Jayawardane*

---

බොහොම ස්තුතියි ! සභාපතිතුමනි. මම අද වගේ විශේෂ දවසක සුරංගනී එල්ලාවල මැතිණිය පිළිබඳ ශෝකය ප්‍රකාශ කරන්නටත්, එතුමියගේ දේශපාලන සේවය වගේම සමාජ සේවය පිළිබඳව කථා කරන්නත් ලැබීම ගැන මම ඇත්ත වශයෙන්ම එතුමියගේ ඇසුරේ දේශපාලනයට ආපු කෙනෙක් හැටියට මම අවංකවම සතුටු වෙනවා. සුරංගනී එල්ලාවල අවධියක්. නන්ද එල්ලාවල මන්ත්‍රීතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සංවිධායකවරයා හැටියට රත්නපුර ආසනයට පත්වෙලා ඒ සියළුම වාමාංශික පක්ෂ සමඟ ඉතාම මිත්‍රත්වයෙන්, ඉතාම සහෝදරත්වයෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සංවිධාන කටයුතු කරනකොට සුරංගනී මැතිණියත් එතුමා සමඟ ඒ සංවිධාන කටයුතුවල එක හා සමානව නියැලී කටයුතු කළා. මේ දෙපළගේම විශේෂත්වයක් තිබුණා. ඒ තමයි නන්ද එල්ලාවල මැතිතුමාත්, සුරංගනී එල්ලාවල මැතිණියත් විශේෂ විශ්වාසයක්, හිතවත් කමක් රාජ්‍ය නිළධාරීන් සමඟ තැබුවා. මා ඒ කාලයේ රාජ්‍ය නිළධාරියෙක් හැටියට එතුමාගේ සංවිධානවල නියැලුනු රාජ්‍ය නිළධාරීන් කිහිප පොළක්ම තෝරාගෙන මේ දිස්ත්‍රික්කයේ සංවිධාන කටයුතු ආසන අටකට බෙදලා ඒ ආසන අටටම රාජ්‍ය නිළධාරීන් පත් කළා සංවිධානය කරන්නට. ඒ නිසා මම දන්නවා බොහෝ කලකට පස්සේ දේශපාලනයේ කාලයකට

මැතිණිය දේශපාලන තනතුරුවලට පත්වෙන්න පෙර සිටම විශාල සමාජ සේවාවක් ඉටු කරපු ගෞරවනීය කාන්තාවක් හැටියට අපට සඳහන් කරන්න පුළුවන්. එතුමිය පාසල් අවධියේ දී ඉතාම දක්ෂ සිසුවියක් හැටියට කටයුතු කරලා, පසුව නන්ද එල්ලාවල මැතිතුමා සමඟ විවාහයෙන් පස්සේ එතුමා දේශපාලනයට පිවිසෙනකොට එතුමාට ආශිර්වාදයක් ලෙස එතුමාගේ පෞද්ගලික ලේකම්වරිය හැටියට සුරංගනී එල්ලාවල මැතිණිය විශාල සේවාවක් ඉෂ්ඨ කළා. අද පවතින ළදරු පාසල් ඒ කාලයේ සීමා වෙලා තිබුනේ නගරවලට පමණයි. විශේෂයෙන්ම කොළඹ නගරයට සහ ආසන්න නගරවලට පමණයි. මෙතුමිය ළදරු උයන් නමින් ඒ ළදරු පාසල් පළමුවෙන්ම රත්නපුර ආසනයේ ආරම්භ කළා කියලා අපි දන්නවා. ඒවා ඉතාම සාර්ථක ලෙස පවත්වාගෙන ගියා කියලත් අපි දන්නවා. ඒ වගේම නන්ද එල්ලාවල මන්ත්‍රීතුමා බලයට පත් වෙනකොට, සංවිධායක තනතුරට පත් වෙනකොට ලංකා සම සමාජ පක්ෂය, ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂය ඉතාම ඉහළ තළයක රත්නපුර දිස්ත්‍රික්කයේ දේශපාලනය තිබුණ පස්සේ රත්නපුර ආසනයේ සංවිධානාත්මක දේශපාලනයක් ඇති වුනේ නන්ද එල්ලාවල, සුරංගනී එල්ලාවල මැතිතුමාගෙත්, මැතිණියගෙත් කාලයේ කියන එක මා සඳහන් කරනවා. පසු කායක ඇති වුන නිල් බලකාය එදා රත්නපුර ආසනයේ ඇති වුනා. පස්සේ මෑත කාලයක දී ශ්‍රී ලංකාවේ ඇති වෙච්ච නිල් බලකාය හා සමාන නිල් බලකායක් රත්නපුර ආසනයේ එදා ඇති වුනා. ඒ වගේම කාන්තා බලකායක් එදා රත්නපුර ආසනයේ ඇති කළා. ඒ වගේම තරුණ බලකායක් රත්නපුර ආසනයේ ඇති කළා. අද මේ වෙනකොට දේශපාලඥයින් ආදර්ශයට ගන්නේ අන්න ඒ සංවිධාන කියන එකත් අපි සඳහන් කරන්නේ සුරංගනී එල්ලාවල මැතිණියටත්, නන්ද එල්ලාවල මැතිතුමාටත් ගෞරවයක් වශයෙන් කියන එක මා සඳහන් කරන්න ඕන. එතුමිය මේ පළාත් සභාවේ අමාත්‍යතුමියත් හැටියට සේවය කරපු කාලය තුළ විපක්ෂයෙන් පවා ආශිර්වාද ලබමින් ඒ කටයුතු ඉතාම ඉහළින් ඉටු කළා. එතුමිය පාර්ලිමේන්තු මැතිවරණයට ඉදිරිපත් වෙලා පාර්ලිමේන්තු මන්ත්‍රීවරියක් ලෙස පත් වෙනකොට එතුමියට තිබුණා පාර්ලිමේන්තුවට නොගොස් පළාත් සභාවේ

නැවතී සිටියා නම් එතුමියට පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය තනතුර පවා ලබාගන්න තිබුණා. නමුත් එතුමිය මීට වඩා පුළුල් ජාතික සේවයක් කරන්නට පාර්ලිමේන්තුව තෝරා ගත්තා. එයින් පස්සේ එතුමිය පාර්ලිමේන්තුවෙන් පසුව දේශපාලනයේ කටයුතුවල තදින්ම නොයෙදී සිටියත් එතුමියගේ දේශපාලන දැනුම, කෘතහස්ථ සංවිධායක දැනුම දැනගෙන සිටපු නිසා රජය පත් වුනාට පස්සේ එතුමියට ආණ්ඩුකාර පදවියක් ලබාදුන්නා. එම ආණ්ඩුකාර පදවියේ කිසිම කෙනෙකුට නොනැමී, සෘජුව කටයුතු කරමින් ඉතාම ඉහළ තත්ත්වයකින් කටයුතු කළා කියන එක, රත්නපුරට ගෞරවයක් වෙන පරිදි කටයුතු කළා කියන එකත් අපි සඳහන් කරන්න ඕන. එතුමිය ආසනයේ සංවිධායක තනතුර භාරගත්තේ නාලන්ද එල්ලාවල මන්ත්‍රීතුමාගෙන් පස්සේ. ඊට ඉස්සෙල්ලා

එතුමියට භාරගන්න තිබුණා නන්ද එල්ලාවල මැතිතුමාගේ අභාවයෙන් පස්සේ එතුමියට රත්නපුර ආසනයේ සංවිධායක තනතුර භාරගන්න තිබුණා. එතුමිය එසේ කළේ නෑ. එතුමිය තම පුත්‍රයා, නාලන්ද එල්ලාවල මැතිතුමාට, තරුණ මන්ත්‍රීතුමාට භාරදුන්නා ආසනය. මේ පරම්පරාව ගැනම කථා කරනකොට එල්ලාවල පරපුර විශාල සේවාවක් රත්නපුරට විතරක් නෙමෙයි මුළු රත්නපුර දිස්ත්‍රික්කයටම සිදුකර තිබෙනවා කියන එක අපි සඳහන් කරන්න ඕන. ඒ පවුලේ දීප්තිමත් කාන්තාවක් ලෙස සුරංගනී එල්ලාවල මැතිණිය කටයුතු කළා කියන එක අපි දන්නවා. ඒ වගේම මුළු ආසනය පුරාම සංවිධානවල හිටපු හැම කෙනෙකුටම නමින් කථා කරන්න පුළුවන් තරම් සමීප සබඳතාවයක් එතුමිය තුළ තිබුණා. එය අද දේශපාලඥයන්ටත් ආදර්ශයක් කියන එක අපි සඳහන් කරන්න ඕන. අන්න ඒ නිසා ඒ කාලය අපට ආදර්ශයක්. මම ඉතාම ආඩම්බරයෙන් සඳහන් කරන්න ඕන නිකම්ම නිකම් දේශපාලනය නෙමෙයි. දේශපාලන දැනුම පොතපත පරිහරණයෙන්, ඒ වගේම අතීත සිදුවීම් ඇසුරෙන් දේශපාලනය හොඳින් හදාරලා, දේශපාලනය සංවිධානය කරපු අය හැටියට නන්ද එල්ලාවල මැතිතුමාත් අපේ සුරංගනී එල්ලාවල මැතිණියත් අපි

ගෞරවයෙන් සිහිපත් කරනවා. ඒ වගේම අපි බලාපොරොත්තු වුනා එතුමියගේ දේශපාලනය ඉදිරියට ගෙනියන්නට එතුමියගේ දියණිය අපි දන්නවා ඒ වගේම දක්ෂතා තියන විශාඛා එල්ලාවල මැතිණිය ඉදිරිපත් වෙයි කියලා. මොන හේතුවෙන් හරි එතුමිය ඉදිරිපත් නොවුනත් එතුමිය ජාතික දේශපාලනයේ කටයුතු කරපු බව මුළු ලංකාවම දන්නවා. අපේ ඇමතිවරු මා සමඟ කියලා තියනවා එතුමියගේ සංවිධාන කටයුතු, නන්දගේ දේශපාලන කටයුතු, සුරංගනීගේ දේශපාලන කටයුතු වගේම සංවිධානාත්මක දේශපාලන කටයුතු කියලා මා සමඟ කියලා තියනවා. ඒ නිසා අද අපි ඉතාම ගෞරවයෙන් සිහිපත් කරන සුරංගනී එල්ලාවල මැතිණියගේ අභාවය අපේ දේශපාලනයටත්, රත්නපුර ආසනයටත් විශාල පාඩුවක් කියන එක

සඳහන් කරමින් එතුමාගේ අභාවය පිළිබඳව අපගේ දැඩි ශෝකය, එතුමිය ඇසුරු කරපු සියළුදෙනාගේ ශෝකය, දේශපාලනය කරපු අප සියළුදෙනාගේ ශෝකය ඇය වෙත දන්වා යවන ලෙස ඉල්ලා සිටිමින් එතුමියට නිවන් සුව අත්වේවා ! කියා මා ප්‍රාර්ථනා කරනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

----------------------------------------------------------

ස්තුතියි ! ගරු සභානායක අසෝක ජයවර්ධන මැතිතුමාට. මීළඟට ගරු ප්‍රභාත් මහේෂ් ද අල්විස් මැතිතුමා.

***ගරු මන්ත්‍රී ප්‍රභාත් මහේෂ් ද අල්විස්***
***கௌரவ உறுப்பினர் பிரபாத் மஹேஷ த அல்விஸ்***
*Hon.Member Prabath Mahesha de Alwis*

------------------------------------------

ගරු සභාපතිතුමනි, අද දින අපි ශෝකය ප්‍රකාශ කරන්නේ රත්නපුර දිස්ත්‍රික්කයේ නොමැකෙන දේශපාලන නාමයක් සටහන් කළ එල්ලාවල පරපුරේ නන්ද එල්ලාවල මැතිතුමන්ට විශාල ශක්තියක් වෙමින්, නන්ද එල්ලාවල මැතිතුමන් එතුමාගේ දේශපාලන ගමන් මග තුළ ගෙනිච්ච, ඒ වගේම තම පුතනුවන් නාලන්ද එල්ලාවල මැතිතුමන් දේශපාලනයට දායාද කරලා දේශපාලනය තුළ තමන්ගේ පුත නුවන් අහිමි කරගත්ත, මේ රත්නපුර දිස්ත්‍රික්කයට විශාල සේවාවක් කළ සුරංගනී එල්ලාවල මැතිණිය සම්බන්ධවයි. විශේෂයෙන් තරුණ දේශපාලඥයෙකු හැටියට මම රත්නපුර දේශපාලනයට පිවිසීමත් එක්ක හැටියට කටයුතු කළා. ඊට පස්සේ රත්නපුර දිස්ත්‍රික්කය නියෝජනය කරමින් පාර්ලිමේන්තුව නියෝජනය කළා. නමුත් 2002 න් පසු එතුමියගේ දීර්ඝ දේශපාලන නිහැඬියාවක් රත්නපුර දිස්ත්‍රික්කයේ ජනතාව දැක්කා. මේ සෙද්ශපාලන නිහැඬියාව ඒ විදිහට තිබුණත් එල්ලාවල පවුල ගැන, නන්ද එල්ලාවල මැතිතුමා ගැන, නාලන්ද එල්ලාවල මැතිතුමා ගැන, සුරංගනී එල්ලාවල මැතිණිය ගැන කථා නොකරන අවස්ථා ඉතාම අඩුයි. සෑම තැනකම මේ දේශපාලන කටයුතුවලට ගිහාම විශේෂයෙන් අපේ ආසනය, රත්නපුර

එතුමිය දුරකථනයෙන් කථා කරලා දවසක් කිව්වා, මේ රත්නපුර දේශපාලනය පිළිබඳ දියයුතු උපදෙස් ගොඩාක් තියනවා කියලා. මම ගිහිල්ලා එතුමියගේ නිවසේ විශාල වෙලාවක් කථා කර කර හිටියා. ඒ අවස්ථාවේ තමයි දැන ගන්න ලැබුනේ කොයි තරම් දැනුම් සම්භාරයක් මේ සුරංගනී එල්ලාවල මැතිණිය සතුව තිබුණා ද කියලා. මේ රත්නපුර දේශපාලනයේ අර අපේ අසෝක ජයවර්ධන මැතිතුමා කිව්වා වගේ අහවල් ගමේ ඉන්නේ අහවලා. අහවල් තැන පාළම හදපු හැටි. අහවල් තැන සංවර්ධනය කරපු හැටි. පාර කපපු හැටි. මේ ප්‍රදේශ පිළිබඳ මහා පුදුමාකාර දැනුමක් එතුමිය සතුව තිබුණා. එතුමා ඒ දැනුම ඊළඟ පරපුරත් එක්ක බෙදා ගන්න ඕන කියන විශ්වාසයෙන් ජීවත් වෙච්ච, මේ රත්නපුර දිස්ත්‍රික්කයේ ජනතාව වෙනුවෙන් කළහැකි හැම දෙයක්ම කළයුතුයි කියන විශ්වාසය තිබ්ච්ච, මහා දැවැන්ත ආත්ම ශක්තියක්, ධෛර්යයක් තිබ්ච්ච කාන්තාවක් හැටියට අපි සිහිපත් කරන්න ඕන. විශේෂයෙන් තම ස්වාමි පුරුෂයා අහිමි වෙලා, තම පුතනුවන් මේ දේශපාලන ක්‍රමය තුළ අහිමි වෙලා, ඉතාම කෲර ලෙස ඝාතනයට ලක් වෙලා, මේ තරම් කැප කිරීමක් දේශපාලනය තුළ කරලා එතුමිය සබරගමුව පළාත් සභාවට 1998 පත්වෙලා, රත්නපුර දිස්ත්‍රික්කයේ පළවෙනි තැනට ඇවිල්ලා, සබරගමුව පළාත් සභාවේ සමාජ සේවා, සමූපකාර, සමාජ සුභ සාධන ඇමතිවරිය ආසනය ගැන අපි යන සෑම තැනකම අපි දැක්කා මේ පවුලට පුදුම හිතවත්කමක්, කිට්ටු බවක්, බැදියාවක් මේ ප්‍රදේශවල ජනතාව ගාව තිබුණා. ඒක කෘත්‍රිමව හැදිච්ච දෙයක් නෙමෙයි. ඒත ස්වභාවිකව මේ දිස්ත්‍රික්කයේ ජනතාවට, මේ ප්‍රදේශයේ ජනතාවට වැඩ කරලා, ඒ අයගේ දුක දැකලා , ඒ අයගේ ප්‍රශ්නවලට ඇහුම්කන් දීලා, ඒවාට උත්තර හොයලා නිර්මාණය කරගත්ත සැබෑ ආදරයක්. ඒ ආදරය අදටත් ඒ විදිහටම ඒ පවුලට මේ දිස්ත්‍රික්කයේ ජනතාව තුළ තිබෙන බව අපි දන්නවා. ඒ ආදරය, ගෞරවය මේ සියල්ලත් එක්ක කැටි වෙලා ඒ තිබ්ච්ච දීර්ඝ දේශපාලන නිහැඬියාව අවසන් කරමින් අපි බොහොම සතුටු වෙන කාරණාවක් තමයි 2015 මධ්‍යම පළාත් සභාවේ ආණ්ඩුකාරවරිය හැටියට එතුමිය පත්වීම ලබපු දවස. එදා දවසේම මමත් දුරකථනයෙන් කථා කරලා එතුමියට සුභ පතලා විශේෂයෙන් එතුමියට දීර්ඝායු ප්‍රාර්ථනා කළා. එතුමියට සුභ පැතුවා. එතුමියට හිමිවිය යුතුව තිබ්ච්ච තැනක් එතුමියගෙන් එල්ලාවල පවුලෙන් මේ දිස්ත්‍රික්කයට, මේ රටේ ජනතාවට සිදුවෙච්ච සේවාව වෙනුවෙන් ලැබිය යුතු ගෞරවයක් ඒ මොහොතේ ලැබුණා කියලා අපි විශ්වාස කළා. ඒ වගේම අපි විශ්වාස කරපු ගොඩාක් වෙලාවට මේ දේශපාලන දැනුම, දැවැන්ත එතුමිය සතුව තිබ්ච්ච අත්දැකීම් එල්ලාවල පවුලේ තමන්ගේ ස්වාමි පුරුෂයා, ඒ

වගේම පුතා සමඟ කරලා තිබ්ච්ච ඒ පරිනතබවත් එක්ක අපට මතකයි මධ්‍යම පළාත් සභාවේ ප්‍රධාන ඇමතිවරයාට විරුද්ධව විශ්වාසභංග යෝජනාව ගෙනාපු වෙලාවේ ඉතාමත්ම විධිමත්ව ඒ ප්‍රශ්නයට නායකත්වය දීලා ඒ ප්‍රශ්නය ඉතාමත්ම හොඳින් කළමනාකරණය කරගන්න එතුමියට හැකියාව ලැබුණා. ඒ වෙලාවෙත් ඒ ප්‍රශ්නය කළමනාකරණය කළා කියන්නේ ඒ වෙලාවේ තිබ්ච්ච දේශපාලන වාතාවරණයත් එක්ක, රටේ තිබ්ච්ච දේශපාලන තත්ත්වයත් එක්ක එතුමිය අර ගිරයට අහුවුන පුවක් ගෙඩිය වගේ අමාරු තැනක හිටියේ. මම ඒක දන්නවා. මම ඒ වෙලාවෙත් එතුමියට දුරකථනයෙන් කතා කළා. බොහොම හිතවත්ම, එතුමියට

තිබුණ ගෞරවයත් එක්ක කොහොමද ඔබතුමිය මේ ප්‍රශ්නය කළමනාකරණය කරගන්නේ. එතුමිය කියපු දේවල් අපේ ජීවිතයට මහා විශාල අත්දැකීමක් එකතු කළා. ඒ විදිහට විශ්වාසභංග යෝජනාව කළමනාකරණය කරගෙන, ඒ ප්‍රශ්නය විසඳාගෙන එතුමියගේ ජීවිතයේ අවසාන කාලය තුළත් ඒ ලබපු අත්දැකීම්, ඒ තිබුණ පරිනතබව, ඒ තිබුණ දේශපාලන දැනුම මැනවින් මේ රත්නපුර දිස්ත්‍රික්කයේ, සබරගමුව පළාතේ ජනතාවට විතරක් නෙමෙයි මධ්‍යම පළාතේ ජනතාවටත් එතුමිය හොඳින් පෙන්නලා දුන්නා කියන එක අපි ගෞරවයෙන් සිහිපත් කරන්න ඕන. අද මෙවන් දේශපාලන පවුලක විශාල සේවාවක් මේ ප්‍රදේශයට රටට කරපු නන්ද එල්ලාවල මැතිතුමා, නාලන්ද එල්ලාවල මැතිතුමා මේ සියළුදෙනා අහිමි කරගෙන, මේ දේශපාලනය තුළ නිරතවෙලා මේ ප්‍රදේශවල ජනතාවට ආදරය කරපු, හිතවත්ව ජීවත් වෙච්ච මේ ප්‍රදේශයේ ජනතාවගේ ගෞරවය අදටත් දිනාගෙන ඉන්න සුරංගනී එල්ලාවල මැතිණිය අප අතරින් වෙන්වී යාම ශෝකයට කාරණාවක් කියන එක මම හිතන්නේ මම නැවත නැවත කිවයුතු වෙන්නේ නෑ.

ඒ නිසා අද විශාඛා එල්ලාවල මැතිණිය ඇතුළු පවුලේ ඥාතීන් මේ අවස්ථාවට සම්බන්ධ වෙනවා. අපි සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ ජනතාව වෙනුවෙන්, සබරගමුව පළාත් සභාව වෙනුවෙන් ඒ වගේම අපේ පෞද්ගලික ශෝකය ඒ පවුලේ විශාඛා එල්ලාවල මැතිණිය ඇතුළු ඥාතීන්ට ඉතාමත්ම ගෞරවයෙන් ශෝකය පළ කරමින් සුරංගනී එල්ලාවල මැතිණියට එතුමිය ප්‍රාර්ථනා කරන බෝධියකින් අමාමහ නිවන් සම්පත්තිය අයිති වේවා ! කියලා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

-----------------------------------------------------------

ස්තුතියි ! ගරු ප්‍රභාත් මහේෂ ද අල්විස් ගරු මන්ත්‍රීතුමාට. මීළඟට ගරු සලිත කරුණාරත්න මන්ත්‍රීතුමා.

***ගරු මන්ත්‍රී සලිත කරුණාරත්න***
***கௌரவ உறுப்பினர் சலித கருணாரத்ன***
*Hon.Member Salitha Karunaratne*

---------------------------------------------------

ගරු සභාපතිතුමනි, 2008 වසරේ මෙම ගරු සභාව නියෝජනය කළ, සමාජ සේවා අමාත්‍යවරිය හැටියට කටයුතු කළ සුරංගනී එල්ලාවල මැතිණිය පිළිබඳ වන ශෝක යෝජනාවට අපි ද බොහොම හෘදයාංගමව එකතු වෙනවා. 1965 සුවිශේෂී අවුරුද්දක්. පෞද්ගලිකව මටත්. මගේ තාත්තා එල්ලාවල ගම් සභාවේ මහජන නියෝජිතයෙක් විදිහට පත්වුන අවුරුද්ද. ඒ අවුරුද්දේම තවමයි රත්නපුර මහ සභාවේ මන්ත්‍රීවරයෙක් හැටියට නන්ද සිඩ්නි එල්ලාවල මැතිතුමා පත් වෙන්නේ. මගේ තාත්තාත් වාමාංශික

දේශපාලනය කළේ. නන්ද, සරත්, වාසු කියන අයත් එක්ක. නන්ද එල්ලාවල මැතිතුමා මගේ තාත්තාගේ සමීප හිතවතෙක් විදිහට රත්නපුරේ දේශපාලනයට දැවැන්ත නායකත්වයක් දුන්නා. රත්නපුරේ වාමාංශික දේශපාලනයේ ජනතාවාදී ප්‍රතාපවත් නායකයා නන්ද එල්ලාවල මැතිතුමා. එතුමාගේ ආදරණීය බිරිඳ සුරංගනී එල්ලාවල මැතිණිය. ඒ වගේම රත්නපුරේ වාමාංශික ජනතාවාදී දේශපාලනයේ දැවැන්තම බලාපොරොත්තුව නාලන්ද එල්ලාවල මැතිතුමා. එතුමාගේ ආදරණීය අම්මා සුරංගනී එල්ලාවල මැතිණිය

තමන්ගේ ආදරණීය පියතුමන්, තමන්ගේ ආදරණීය මව්තුමිය, තමන්ගේ ආදරණීය එකකුස උපන් සහෝදරයා කියන තුන්දෙනාම මේ ලෝකයෙන් සදහටම සමු අරගෙන තිබියදී ඒ සියළු දේවල් හිතේ දරාගෙන ඉතා මිත්‍රශීලීව, සුහදව සමාජයත් එක්ක ගණුදෙණු කරන විශාඛා එල්ලාවල සහෝදරියගේ ආදරණීය අම්මා සුරංගනී එල්ලාවල මැතිණිය. ඒ එක්කම ඒ රත්නපුරේ එල්ලාවල දේශපාලන පරපුරේ වර්තමාන ජීවමාන මහජන නියෝජිතයා අකිල එල්ලාවල මැතිතුමාගේ ආදරණීය ලොකු අම්මා සුරංගනී එල්ලාවල මැතිණිය. එතුමිය තමයි අපෙන් සමු අරගෙන තියෙන්නේ සදහටම. නන්ද එල්ලාවල මැතිතුමාගේ යුග මෙහෙවර නාලන්ද එල්ලාවල මැතිතුමාට භාර වෙනකොට නාලන්ද එල්ලාවල මැතිතුමා කුරුවිට මහා නගරය මැද්දේ මහා දවාලේ අමු අමුවේ මරා දානකොට ඒ යුග මෙහෙවර හා වාමාංශික දේශපාලනයේ උවමනාව ඉෂ්ඨ කරන්න ජනතාවගේ ඉල්ලීම මත ආදරණීය අම්මා කෙනෙක් විදිහට සුරංගනී එල්ලාවල මැතිණිය මේ දේශපාලනයට සම්ප්‍රාප්ත වෙනවා. හැබැයි මා දැඩි සේ විශ්වාස කරන දෙයක් තමයි සුරංගනී එල්ලාවල මාතාව වගේ අය මේ දූෂිත දේශපාලනයට ගැලපෙන්නේ නෑ. එතුමිය හැබැවටම රත්නපුරේ ජනතාවට ආදරණීය අම්මා කෙනෙක් වුනා. මානව හිතවාදීකම, ජනතාවාදීකම උපරිමයෙන් රැක්ක ජනතා නායිකාවක් ඇය. ඇය සමාජ සේවා අමාත්‍යවරිය හැටියට මේ සබරගමුවේ කරන ලද සේවාව මට වඩා ඒ කාලයේ මේ සමාජයේ නියෝජනය කළ ගරු මන්ත්‍රීවරු දන්නවා. ඒ නිසාම තමයි ජනතාවගේ උවමනාව මත එතුමිය ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව නියෝජනය කරමින් 2000 දී පාර්ලිමේන්තුවට යන්නේ. හැබැයි මෙතනදී කියවුණා වගේ මේ දූෂිත ජරාජීර්ණ දේශපාලනයට නොගැලපෙනවා වගේම දේශපාලනයෙන් සමුගන්නා සුරංගනී එල්ලාවල මැතිණිය 2015 දී මධ්‍යම පළාතේ ආණ්ඩුකාරධූරයෙන් පිදුම් ලබනවා. කොහොම

නමුත් 2016 වසරේ දී ඇය අර මම කලින් කිව්වා වගේ නන්ද එල්ලාවල මැතිතුමන්, නාලන්ද එල්ලාවල මැතිතුමන් ගිය මගම යමින් අපෙන් සදහටම සමුගන්නවා. ඇයගේ අභාවය පිළිබඳව ශෝක වෙන, කණගාටු වෙන අය රත්නපුරේ වාමාංශික අය විතරක් නෙමෙයි පක්ෂ භේදයෙන් තොර සුවහසක් ජනතාව සමඟ අපි ද හෘදයාංගමව එක්වන බව ප්‍රකාශ කරමින් එතුමියගේ අභාවය වෙනුවෙන් සබරගමුව පළාත් සභාව ප්‍රකාශයට පත් කළ සහරාවේ වේදනාවෙන් වෛද්‍ය අජිත් කළ්‍යාණ අමරසිංහ ලියූ එක කවියකින් මම මගේ කථාව අවසන් කරනවා.

පහණ ගෙන අතින් දැවෙනා රිදුම් දිදී
පවණ රළු වුවත් සුරතින් රැකුම් දිදී
නැගෙන අලුත් පරපුරකට දිරිය දිදී
හිමි හා පුතු ලහම සිටියා සිසිල දිදී

නයන උතුරවා උණු කඳුලැල් පිරුනී
සවණ කළඹවා සෝ සුසුමන් ඇසුනී
තැළෙනදනන්වෙනුවෙන්මෙහෙකළ බැවිනී
නිවන ඔබට දුර නැත ගරු මැතිණියනී

ස්තූතියි !

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
------------------------------------------------------------

ස්තුතියි ! ගරු සලිත කරුණාරත්න මන්ත්‍රීතුමාට. මීළඟට විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායක සිරිපාල කිරිඇල්ල මැතිතුමා.

***ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල***
***கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல***
*Hon.Opposition Whip Siripala Kiriella*
----------------------------------------------------------

ගරු සභාපතිතුමනි, සුරංගනී එල්ලාවල මැතිණිය අපට මතකයි අපේ ඉස්සෙල්ලා පළාත් සභාව තිබුනේ අපේ දිස්ත්‍රික් කාර්යාලයේ. ඒකේ ඉන්නකොට තමයි එතුමිය පළාත් සභා මන්ත්‍රීවරියක් විදිහට කටයුතු කළේ. ඒ කාලයේ පවිත්‍රා වන්නිආරච්චිත් හිටියා අපිත් එක්ක. ඒ කාලයේ ඇත්තටම කියනවා නම් මම නව සම සමාජ පක්ෂයෙන් තමයි මන්ත්‍රීවරයා වෙලා හිටියේ. ඕන්න ඕක අත ඇරලා අපිත් එක්ක එන්න කිව්වා. මම කිව්වා කොහේ ගියත් ශ්‍රී ලංකා එකට නම් යන්නේ නෑ කියලා. ඒක අපට හරියන්නේ නැති පක්ෂයක්. එදා සුරංගනී එල්ලාවල මැතිණිය මගේ පුටුවට පුටු දෙකකට එහා තමයි හිටියේ. එතුමිය කිව්වා මෙහෙම ඉදලා හරියන්නේ නෑ පාර්ලිමේන්තුවට යන්න ඕන කියලා. පාර්ලිමේන්තුවට ගියා. එතුමිය ආණ්ඩුකාර පදවිය දක්වා ගියා. එතුමියගේ පින. එතුමියගේ ශක්තිය. එතුමිය එදා බලාපොරොත්තු ඉටුකර ගනිමින් ආණ්ඩුකාර ධූරයෙත් ඉදලා ආණ්ඩුකාරවරියක් වශයෙන් තමයි අභාවප්‍රාප්ත වුනේ. එතුමිය ගත්තාම ඉතිහාසගත වෙනවා. නන්ද එල්ලාවල මහත්මයා, ඒ වගේම නාලන්ද එල්ලාවල මහත්මයා ඒ දෙන්නාටම වැඩිය තනතුරු ලබාගෙන මෙලොවින් අභාවප්‍රාප්ත වුනා. එතුමිය ඇත්ත වශයෙන්ම කියනවා නම් ඒ දෙන්නාටම පිහිටියේ එතුමියගේ ස්ටාර් එක කියලා මම කියනවා ඒ කාලයේ. අපට හුඟාක් දේවල් තියනවා අපි දන්න කියන දේවල් එතුමියගේ. ඉවසනවා කිව්වාම සබරගමුව පළාතේ ඒ වගේ ඉවසන කෙනෙක් නෑ. එහෙම නම් වැඩි අවස්ථාවක් ගන්නේ නෑ මම. අපේ හිතමිත්‍ර සුරංගනී එල්ලාවල මැතිණියට, හිටපු ආණ්ඩුකාරතුමියට නිවන් සුව අත්වේවා !

කියා ප්‍රාර්ථනා කරමින් මගේ මේ කෙටි වචන ස්වල්පය අවසන් කරනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
------------------------------------------------------------

ස්තුතියි ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායක සිරිපාල කිරිඇල්ල මැතිතුමාට. මීළඟට ගරු විපක්ෂනායක ඩබ්ලිව්.සෝමදාස මැතිතුමා.

***ගරු විපක්ෂ නායක ඩබ්ලිව්.සෝමදාස***
***கௌரவ எதிர்க் கட்சித் தலைவர் டபிள்யு சோமதாச***
*Hon.Opposition Leader W.Somadasa*
------------------------------------------------------------

ගරු සභාපතිතුමනි, අද දවසේ ශෝක ප්‍රකාශයේ හැටියට සුරංගනී එල්ලාවල මැතිණියගේ අභාවය ගැන ශෝකය ප්‍රකාශ කරන්න අපට අවස්ථාවක් ලැබිලා තියනවා. මේ ශෝකය ප්‍රකාශ කරනකොට සුරංගනී එල්ලාවල මැතිණිය පළාත් සභාවට තේරී පත්වූ අවස්ථාවේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරියක්, ආණ්ඩු පක්ෂයේ ඇමතිවරියක් හැටියට කටයුතු කරනකොට අපි විපක්ෂයේ මන්ත්‍රීවරු. අපි

විපක්ෂයේ වුවත් සුරංගනී එල්ලාවල මැතිණිය කිසිම භේදයක් නැතුව දෙන්න පුළුවන් සහයෝගය අපි හටත් ආණ්ඩු පක්ෂය වගේම විපක්ෂයටත් සමානව දෙන්න කටයුතු කළා කියන එක අපි සිහිපත් කරන්න ඕන. ඒ වගේම එතුමිය සුහදශීලී දේශපාලඥවරියක් හැටියට සුහදශීලීව අපි සමඟ ඇසුරු කළා කියන එකත් අපි සිහිපත් කළයුතුයි.

ඒ එක්කම අපි එල්ලාවල පරපුර ගැන කථා කරනකොට අපි දන්නවා රත්නපුර දිස්ත්‍රික්කයේ එල්ලාවල කියන පරම්පරාව විශේෂයෙන්ම දේශපාලනයේ නියැලුන රටට සමාජයට ජනතාවට සේවය කරන පවුලක් හැටියට ප්‍රසිද්ධියක් ලබන එල්ලාවල පරම්පරාවේ කියන එක අපි කවුරුත් දන්නා කාරණයක්. එල්ලාවල පවුලට විපතක් කරදරයක් වෙනකොට රත්නපුර දිස්ත්‍රික්කයේ විතරක් නෙමෙයි කෑගලු දිස්ත්‍රික්කය පුරා ඉතා වේගයෙන්, ඉතා ඉක්මණින් ඒ විපත සහ කරදරය යම් දෙයක් වුනා නම් ජනතාව දැනුවත් වෙන්න ප්‍රසිද්ධියක් වෙනවා. ඒ ප්‍රසිද්ධිය වෙන්නේ කෑගලු දිස්ත්‍රික්කයේ ජනතාව අතරත් මේ එල්ලාවල පරම්පරාව ගැන ජනප්‍රියතාවයක් තිබෙන බව සඳහන් කළයුතුයි.

එහෙම නම් අපට සුරංගනී එල්ලාවල මැතිණියගේ ශෝකය ගැන කථා කරනකොට අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ විපක්ෂයේ හැම මන්ත්‍රීවරයෙක්ම ශෝක වෙන අවස්ථාවක් වුනා සුරංගනී එල්ලාවල මැතිණියගේ අභාවය ගැන එදා. ඒ ශෝකය ප්‍රකාශ කරන අවස්ථාවේ සියළුදෙනාගෙන් අනුමත වුනා සුරංගනී එල්ලාවල මැතිණිය නිහතමානී දේශපාලනයක් කරපු ආදරණී නායිකාවක් හැටියට අපට පිළිගන්න පුළුවන් කියන එක විපක්ෂයේ මන්ත්‍රිවරුන්ගෙන් ප්‍රකාශ වුනා. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා අපේ මේ ශෝක ප්‍රකාශය සුරංගනී එල්ලාවල මැතිණියගේ දරුවන්ටත්, ඥාතීන්ටත් අපේ ශෝක ප්‍රකාශය සඳහන් කරලා දැනුවත් කරන්න කියලා ඉල්ලමින් සුරංගනී එල්ලාවල මැතිණියට නිවන් සුවය ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---

ස්තුතියි ! ගරු විපක්ෂනායක ඩබ්ලිව්.සෝමදාස මැතිතුමාට. මීළඟට ගරු මන්ත්‍රී නමින්ද අනුරප්‍රිය ගරු මන්තීතුමා. එතුමා සභාවේ නෑ. මීළඟට ගරු අමාත්‍ය රංජිත් බණ්ඩාර මැතිතුමා.

***ගරු අමාත්‍ය රංජිත් බණ්ඩාර මැතිතුමා.***
***கௌரவ அமைச்சர் ரஞ்ஜித் பண்டார***
*Hon. Minister Ranjith Bandara*

---

ස්තුතියි ගරු සභාපතිතුමනි, ඔබතුමාට. සුරංගනී එල්ලාවල හිටපු ගරු ආණ්ඩුකාරතුමිය, එතුමියගේ අභාවය වෙනුවෙන් පළාත් සභාවට මෙම යෝජනාව ඉදිරිපත් කිරීම සම්බන්ධව අපි ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. සුරංගනී එල්ලාවල ගරු ආණ්ඩුකාරතුමිය ගැන කථා කරනකොට නන්ද එල්ලාවල, නාලන්ද එල්ලාවල ගැන කථා නොකර අපට අදහස් ප්‍රකාශ කිරීමට කිසිම අවස්ථාවක හිත නැමෙන්නේ නෑ. මේ රත්නපුර දිස්ත්‍රික්කයේ විශේෂයෙන්ම රත්නපුර මැතිවරණ කොට්ඨාශයේ එල්ලාවල නාමය අදටත් අපේ රත්නපුර දිස්ත්‍රික්කයේ ජනතාවගේ හදවතේ නොමැකෙන සටහන් තබපු පවුලක්. ඒ වගේම තමයි රත්නපුර දිස්ත්‍රික්කයට විශාල සේවයක් කරන්න හිටපු නන්ද සිඩ්නි එල්ලාවල, නාලන්ද

සම්පත් එල්ලාවල, ඒ වගේම සුරංගනී එල්ලාවල, ඒ වගේම අතුල ආටිගල වැන්නවුන් අපට අහිමි වීම මම හිතන්නේ රත්නපුර දිස්ත්‍රික්කයේ අපි යම්කිසි මොකක් හෝ පාප කර්මයක් කරලා තියනවා ඒ අයගේ සේවාව රත්නපුර දිස්ත්‍රික්කයට ලබාගන්න නොහැකි වීම සම්බන්ධයෙන්. උපරිම සේවාව. මට මතකයි නන්ද එල්ලාවල මැතිතුමා මම පුංචි කාලයේ මගේ තාත්තා එක්ක අරගෙන ගිහිල්ලා මාව ගල්කිස්සේ ගුරුතලාව ශාන්ත තෝමස් විද්‍යාලයට ඇතුළත් වෙච්ච අවධිය. මොනවාවත් තේරෙන්නේ නෑ. ඉංග්‍රීසි වචනයක් කථා කරන්න බෑ. කිසි කෙනෙක් එක්ක කථා කරන්න අපට විශාල සබකෝලයක් ඇති වෙච්ච මොහොතක එහෙම තිබුණ මොහොතක මගේ පියා ව්‍යාපාරිකයෙක් හැටියට, ව්‍යාපාරයේ නැයැලුනත් අපට අධ්‍යාපනයක් ලබාදෙන්න ඕන කියන ඒ මුල් බීජය අපේ පියාගේ හිත තුළ ඇති කළේ නන්ද එල්ලාවල මැතිතුමා. එතුමාම ගිහිල්ලා, එතුමාම විදුහල්පතිතුමාට කථා කරලා, මාව ඒ පාසලට ඇතුළත් කරලා අපට ඒ ලබාදුන්නා වූ ඒ අධ්‍යාපනය, කිසිසේත්ම නන්ද එල්ලාවල මැතිතුමා අපේ හදවතින් අයින් කරන්න බෑ. ඒ ලබාගත්ත අධ්‍යාපනයත් එක්ක අපි නිතැතින් බැඳුනා මේ එල්ලාවල පරපුර වෙනුවෙන් අපගේ කාර්ය භාරය කරන්න. මම පාසල් ජීවිතය හැරගිය අවස්ථාවක පල්ලිය පාරේ අපේ පියාට අයිති ව්‍යාපාරික ස්ථානයක් තිබුණා. ඒ වගේම නන්ද එල්ලාවල මන්ත්‍රීතුමාගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ කාර්යාලය තිබුනෙත් පල්ලිය පාරේ. එතකොට පාසල් ජීවිතය නිමා කරලා අපි පල්ලිය පාරේ ව්‍යාපාරික කටයුතුවලට එනකොට නිරන්තරයෙන්ම මුණ ගැසුන ප්‍රතාපවත් චරිතයක් තමයි නන්ද එල්ලාවල කියන චරිතය. අපේ පියා දේශපාලනයේ නියැලුනත් අපි දේශපාලනයේ නියැලෙන්න අපට යම්කිසි ආභාෂයක් ලැබුනේ නන්ද එල්ලාවල මන්ත්‍රීතුමාගෙන්. එතුමාගේ ප්‍රතාපවත්භාවය, ඍජුභාවය , ඒ වගේම තීරණ ගැනීමේ ශක්තිය තුළ අපි නිතැතින්ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රතිපත්ති කියෙව්වේ නැති වුනත් අපට මේ පුද්ගලයා එක්ක යන්න කිසිම බියක් ඇති වුනේ නෑ. එතුමාත් එක්ක කරපු පළවෙනි මැතිවරණය තමයි කලගෙඩි, ලාම්පු මැතිවරණය. ජේ.ආර්.ජයවර්ධන මහත්මයාගේ ආණ්ඩුව කාලේ. අපි පරාජයට පත් වුනත් ඒ මුල් මැතිවරණයේ දී එතුමා ඒ විදහා පාපු අභීත සෙන්පතියෙකුගේ නියමුවා හැටියට අපට විශාල ශක්තියක් එතුමා ලබාදුන්නා. ඉන් අනතුරුව පැවති අතුරු මැතිවරණය මම හිතන්නේ ඉතාමත්ම භීෂණය වපුරපු මැතිවරණයක් ඒ කාලයේ හැටියට. ඒ මැතිවරණයේ දී ඉදිරිපත් වූ ප්‍රති අපේක්ෂකයා සමඟ තරඟ කිරීමේ දී මම හිතන්නේ රත්නපුර ජනතාව විසින් එතුමාව ඉදිරියට ගෙනල්ලා තිබ්බා. ඒක මොනවාට ඔප්පු වුනා පාර්ලිමේන්තුවේ දී දිවංගත ගාමිණී දිසානායක මැතිතුමා සඳහන් කළා, නන්ද එල්ලාවල මැතිතුමා පාර්ලිමේන්තු ගිය පළවෙනි දවසේම කිව්වා මම දැනගෙන හිටියා නන්ද ඉහළින් ජයග්‍රහණය කරනවා කියලා. මොකද ජනතාවගේ ප්‍රතිචාරය තිබුනේ නන්ද එල්ලාවල කියන සුවිශාල චරිතය සම්බන්ධයෙන්. ඉන් අනතුරුව අපි නොහිතන මොහොතක අපි අතරින් නන්ද එල්ලාවල මැතිතුමා වෙන් වී ගියා. ඉන් අනතුරුව නාලන්ද සම්පත් එල්ලාවල රත්නපුරේ දේශපාලනය අතට ගන්න කියන ඒ ඉල්ලීම වටින් ගොඩින් හැම තැනින්ම එනකොට එතුමා පළාත් සභාවට ඉදිරිපත් වුනා 93. ඒ වර්ෂයේ තමයි පවිත්‍රා දේවි වන්නිආරච්චි, ඒ වගේම කොලොන්න මැතිවරණ කොට්ඨාශයේ ජයතිස්ස රණවීර, වැනි අය මේ දේශපාලනයට ආවේ. ඉන් අනතුරුව ඇතිවෙච්ච පාර්ලිමේන්තු මැතිවරණය 94 මම හිතන්නේ මේ හැරවුම් ලක්ෂයකට විශාල දායකත්වයක් දෙන්න රත්නපුරේ නාලන්ද සම්පත් එල්ලාවලට හැකියාව ලැබුණා. ඒ දායකත්වයත් එක්ක එතුමා රත්නපුර මැතිවරණ කොට්ඨාශයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සංවිධායක හැටියට පස්

අවුරුදු සැළැස්මක් හැදුවා මේ රත්නපුර දිස්ත්‍රික්කය කොහොමද දියුණු කරන්නේ කියලා. ජනතාවගේ අවශ්‍යතාවයන් කොහොමද ඉෂ්ඨ කරන්නේ කියලා පස් අවුරුදු සැළැස්මක් හදලා ඒකේ පිටිපස්සේ හිටපු කෙනා තමයි සුරංගනී එල්ලාවල අපෙන් සමුගත්තා. එතකොට මේ නන්ද, නාලන්ද, සුරංගනී කියන අපට සේවයක් කරපු මේ තුන්දෙනාම අපි බලාපොරොත්තු නොවුන අවස්ථාවක , අපි

ආණ්ඩුකාරතුමිය. මේ නන්ද එල්ලාවලත්, ඒ වගේම නාලන්ද එල්ලාවලත් කියන යුගපුරුෂයන්ගේ පසුබිමේ හිටියේ, මේ සෑම සාර්ථක කටයුත්තක් පිටිපස්සේම හිටියේ සුරංගනී එල්ලාවල මේ අද අපි කථා කරන ආණ්ඩුකාරතුමිය. එතකොට නාලන්ද එල්ලාවල අපෙන් උදුරා ගත්තා. ඉන් අනතුරුව තිබුණ පළාත් සභා මැතිවරණයේ රත්නපුර දිස්ත්‍රික්කයේ ඉහළම මනාපයක් ලබාගෙන පළාත් සභාවට මන්ත්‍රීවරියක්, ඇමතිවරියක් හැටියට පත්වෙලා අවුරුද්දක් තුළ අපට රත්නපුරට හා සබරගමුව පළාතට සේවයක් කරලා ඉන් අනතුරුව එතුමිය පාර්ලිමේන්තු මැතිවරණයට තරඟ කරනකොට අපි ඇහුවා පළාත් සභාවේ මහ ඇමතිකම දරන්නට ඕනෑම සුදුසුකමක් තියන අවස්ථාවක ඇයි පාර්ලිමේන්තුවට තරඟ කරන්නේ ? මට කිව්වේ පුතා, නන්ද පාර්ලිමේන්තුවේ හිටියා. නාලන්ද පාර්ලිමේන්තුවේ හිටියා. මටත් පාර්ලිමේන්තුවට ගිහිල්ලා මේ රත්නපුර දිස්ත්‍රික්කයේ සහ මේ ජාතික දේශපාලනයට ඇතුළත් වෙන්න බොහොම ආසයි. මගේ කැමැත්තක් තියනවා. ඒ නිසා ඉදිරිපත් වෙන්නේ. එතුමිය පාර්ලිමේන්තු ගියා. ගිහිල්ලා රත්නපුර දිස්ත්‍රික්කයේ, රත්නපුර මැතිවරණ කොට්ඨාශයේ ජනතාවට සේවය කළා. ඉන් අනතුරුව ඇති වෙච්ච තත්ත්වයන් පිළිබඳව අපි සියළුදෙනාම දන්නවා. යම් යම් කාරණාත් එක්ක, යම් යම් සිද්ධීන් එක්ක එතුමිය කලකිරීමට පත් වුනා, මේ දේශපාලනයේ යම් යම් සිද්ධීන් නිසා. නමුත් අපි නැවත වතාවක් සතුටු වුනා මධ්‍යම පළාතේ ආණ්ඩුකාරවරිය බවට පත් වුනාම අපි නැවතත් සතුටු වුනා. අපේ හදවත් දිනාගත්ත එල්ලාවල පරපුරේ ඒ සුරංගනී එල්ලාවල මාතාව නැවත අපිත් එක්ක මේ දේශපාලන කරලියට පිවිසියා කියලා. නමුත් අවාසනාවන්ත ලෙස එතුමියත් බලාපොරොත්තු නොවුන කාලයක, විශාල දායකත්වයක් මේ රටට දෙන්න පුළුවන් වුන කාලයක තමයි මේ අය අපට අහිමි වුනේ.

ඒ නිසා අපි අදටත් කණගාටු වෙනවා මේ එල්ලාවල පරම්පරාවට, ඒ අය බලාපොරොත්තු වුන සේවාව මේ මැතිවරණ කොට්ඨාශයට සහ විශේෂයෙන්ම රත්නපුර දිස්ත්‍රික්කයට ඒ අයට කරන්න බැරි වීම සම්බන්ධයෙන්. මට මතකයි 99 පළාත් සභාවට මට ඉදිරිපත් වෙන්න කියලා සුරංගනී එල්ලාවල මැතිණිය මට ආරාධනා කරනකොට මම ව්‍යාපාර කටයුතු කරගෙන හිටියේ. මම ජීවිතේටවත් හිතුවේ නෑ පළාත් සභාවටවත්, ප්‍රාදේශීය සභාවටවත්, නගර සභාවටවත් ඉදිරිපත් වෙන්න. නමුත් මට කිව්වා නාම යෝජනා අත්සන් කරන්න එන්න පුතා කියලා ටෙලිෆෝන් කෝල් එකක් දුන්නා මහවැලි කේන්ද්‍රයේ ඉදලා. මම කිව්වා මට මේකට ඉදිරිපත් වෙන්න තරම් එහෙම දේශපාලන පසුබිමකුත් නෑ. හඳුනන පිරිසකුත් නෑ කියලා. හරි මම ඒ වගකීම භාරගන්නම්. අත්සන් කරන්න කියලා කිව්වා. ඒ ගිහිල්ලා අත්සන් කරලා ඉන් අනතුරුව මැතිවරණය අවසන් වෙනතුරු සෑම මැතිවරණයකටම පුතෙක් වගේ එක්කගෙන ගිහිල්ලා මට සහයෝගය ලබාදුන්නා. එදා බෝනස් මන්ත්‍රීවරයෙක් හැටියට 99 පත් වෙච්ච මම, මට පුළුවන් වුනා අද එතුමිය හොබවපු මේ සමාජ සේවා අමාත්‍යාංශයම අද මට හොබවන්න. ඒක දෛවයේ සරදමක් හැටියට අපි හිතනවා ඒවා සිද්ධ වෙන දේවල්. ඒ නිසා අපට මම හිතන්නේ මේ නන්ද එල්ලාවල මැතිතුමා ගැන, නාලන්ද එල්ලාවල මැතිතුමා ගැන, සුරංගනී එල්ලාවල මැතිණිය ගැන ඒ පවුල ගැන මම

හිතන්නේ දවස් ගණන් කථා කරන්න අපට පුළුවන්. නමුත් මේ අවස්ථාවේ තිබෙන්නා වූ කාලය සම්බන්ධයෙන් අපට තවත් කාරණාවලට යන්න තියන වැදගත්කම නිසා

අපි ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා ඒ පවුලේ අද අපිත් එක්ක ඉන්න විශාඛා සහෝදරිය, ඒ වගේම මොහාන් සාලිය එල්ලාවල අපේ හිටපු ආණ්ඩුකාරතුමා ඒ වගේම සේනක එල්ලාවල අපේ නන්ද එල්ලාවල මැතිතුමාගේ සහෝදරයා ඒ පවුලේ සියළුදෙනාටම මේ පළාත් සභාවේ අපේ ශෝක යෝජනාව, අපේ ශෝකය ප්‍රකාශ කරන්න කියලා ඉල්ලා සිටිමින් සුරංගනී එල්ලාවල මන්ත්‍රීතුමිය, ආණ්ඩුකාරතුමිය, අපේ මාතාව, අපේ අම්මා බලාපොරොත්තු වෙන බෝධියකින් එතුමියට නිවන් සැප අත්වේවා ! කියලා ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසන් කරනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---

ස්තූතියි ! රංජිත් බණ්ඩාර ඇමතිතුමාට. මීළඟට දිවංගත හිටපු ආණ්ඩුකාරතුමිය, සුරංගනී එල්ලාවල මැතිණියගේ ඥාති පුත්‍රයා, මේ පළාත් සභාව නියෝජනය කරන අකිල සාලිය එල්ලාවල මැතිතුමාට ආරාධනා කරනවා.

***ගරු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා.***
***கௌரவ உறுப்பினர் அகில எல்லாவல***
*Hon. Member Akila Ellawala*

---

ගරු සභාපතිතුමනි, මේ අවස්ථාවේ දී සබරගමුව පළාත් සභාවේ හිටපු සමාජ සේවා අමාත්‍යවරිය හැටියට කටයුතු කරපු දිවංගත සුරංගනී එල්ලාවල මැතිණිය, එහෙම නැත්නම්

මගේ ඥාතිවරිය වශයෙන් ලොකු අම්මා ගැන ශෝක ප්‍රකාශය කරන අවස්ථාවේ දී මම ඇත්තටම මෙම අවස්ථාවට එක්වෙන්නෙ ස්තූතියක් කරන්නයි මේ සභාව නියෝජනය කරන ඥාති පුත්‍රයෙක් හැටියට එතුමිය වෙනුවෙන්, එතුමියගේ කාල සීමාවේ දී කරපු ජනතා මෙහෙවර, ඒ වගේම නන්ද එල්ලාවල මගේ ලොකු තාත්තා, දිවංගල නාලන්ද එල්ලාවල මගේ සහෝදරයා, මේ සියළුමදෙනා වෙනුවෙන් අද කරපු ගුණානුස්මරණ කථාවන් වෙනුවෙන් සියළුදෙනාටම මගේ ස්තූතිය ප්‍රකාශ කරන්න තමයි අද මේ අවස්ථාවට මම එකතු වෙන්නේ. එසේ කියමින් ඔබතුමාට විශේෂ ස්තූතියක් කරනවා එතුමියගේ අභාවයෙන් පස්සේ දිගු කාලයක් යන්නට පෙර මේ අවස්ථාව මෙම සභාවට යෝජනාවක් හැටියට ගෙන ඒම පිළිබඳව. ඔබතුමාටත්, ලේකම්තුමාටත්, ඒ වගේම කාර්යය මණ්ඩලයටත් ස්තූතිය ප්‍රදානය කරන අතර, අප පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය ධූරය දරන මහීපාල හේරත් ගරු ප්‍රධාන ඇමතිතුමාට, ඒ වගේම අපේ රංජිත් බණ්ඩාර ඇමතිතුමාට, අතුල කුමාර රාහුබද්ධ ඇමතිතුමාට, භාණු මුණිප්‍රිය ඇමතිතුමාට, ශ්‍රීලාල් වික්‍රමසිංහ ඇමතිතුමාට ඒ වගේම විපක්ෂනායකතුමා ඇතුළු පක්ෂ විපක්ෂ සියළුම මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමිය ඇතුළු සියළුදෙනාටම හදවතින්ම මම ස්තූතිවන්ත වෙනවා. අපේ පවුලේ ඥාතීන් වෙනුවෙනුත්, විශාඛා එල්ලාවල මැතිණිය වෙනුවෙනුත්. ගරු සභාපතිතුමනි, ඒ වගේම මම මේ අවස්ථාවේ දී සිහිපත් කරන්න ඕන සුරංගනී එල්ලාවල මැතිණිය අභාවප්‍රාප්ත වුන අවස්ථාවේ දී එතුමියගේ අවමඟුල් උත්සවය වර්ණවත් කරන්න අපේ ගරු සලිත කරුණාරත්න මන්ත්‍රීතුමාත්, ඒ වගේම මේ පළාත් සභාවේ වෛද්‍යවරයෙකු වශයෙන් කටයුතු කරන අජිත් කල්‍යාණ අමරසිංහ

වෛද්‍යාතුමාත් එකතු වෙලා එතුමියගේ චරිතාපදානයක් ඉදිරිපත් කළා ප්‍රධාන ඇමතිතුමාගේ අනුමැතිය ඇතුව. ඒ සඳහා රංජිත් බණ්ඩාර ගරු ඇමතිතුමාත් විශාල සහයෝගයක් දුන්නා. ඒ නිසා

මම මේක අවස්ථාවක් කරගන්නවා ගරු මන්ත්‍රීතුමාටත්, අපේ වෛද්‍යාතුමාටත් මේ පොත් පිංච එළිදැක්වීම පිළිබඳ විශේෂ ස්තුතියක් කරන්න. ඒ වගේම මේ අවස්ථාවේ දී මම සිහිපත් කරනවා සුරංගනී එල්ලාවල මැතිණිය 1999 සබරගමුව පළාත් සභාවට තේරී පත්වුන අවස්ථාවේ දී එතුමියට අමාත්‍යධූරය ලබාදුන්න, එවකට හිටපු ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග ජනාධිපතිනියටත්, ඒ වගේම එතුමියගේ අවසාන කාලයේ දී එතුමියට ආණ්ඩුකාරධූරය ලබාදුන්න වර්තමාන ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන ගරු ජනාධිපතිතුමාටත් ඒ වගේම අපට අමතක කරන්න බෑ මගේ ලොකු තාත්තා නන්ද එල්ලාවල මැතිතුමා එතුමාගේ දේශපාලන ජීවිතයේ දී එතුමාට පල්ලිය පාරේ කාර්යාලය ලබාදුන්න අපේ ඉෆ්ලාර් ගරු මන්ත්‍රීතුමාගේ පියතුමා තමයි ඒ ගොඩනැගිල්ල ලබාදුන්නේ. අවුරුදු ගාණක් ඉතාමත් සුළු මුදලකට, සුළු කුලියකට එතුමාගේ දේශපාලනය කරන්නත්, ඒ වගේම නාලන්ද සහෝදරයාගේ දේශපාලනය කරන්නත් ඒ ලබාදුන්න ගොඩනැගිල්ල වෙනුවෙන් මම ගරු ඉෆ්ලාර් මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා, එතුමාගේ පියතුමා අද ජීවතුන් අතර නැති වුනත්.

එසේ කියමින් මේ අවස්ථාවේ දී ඔබ සියළුමදෙනා වෙත විශාඛා එල්ලාවල මැතිණිය වෙනුවෙනුත්, මගේ මව්තුමිය, මගේ නැන්දලා වෙනුවෙනුත්, මමත් පෞද්ගලික ඔබ සියළුදෙනා වෙත හදවතින්ම ස්තුතිවන්ත වෙමින් මා නවතිනවා. ස්තුතියි !

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

-----------------------------------------------------------

ස්තුතියි ! ගරු අකිල එල්ලාවල මන්ත්‍රීතුමනි. අද දින මෙම ගරු සභාවේ සාකච්ඡාවට භාජනය වුන දිවංගත හිටපු මධ්‍යම පළාත් ආණ්ඩුකාරතුමිය , ඒ වගේම ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරියක් හැටියට වගේම මෙම සබරගමුව පළාත් සභාව නියෝජනය කරපු අමාත්‍යවරියක් හැටියට අද මෙම ගරු උත්තරීතර සභාවේ පක්ෂ විපක්ෂ සියළුම මැති ඇමතිතුමන්ලා විසින් එතුමන්ලාගේ මුවින් ප්‍රකාශ වුනේ ගරු සුරංගනී එල්ලාවල මැතිණිය, ඒ වගේම ගරු නන්ද එල්ලාවල මැතිතුමා, ඒ වගේම ගරු නාලන්ද එල්ලාවල මැතිතුමා සහ එම පවුලේ ඒ මැති ඇමතිතුමන්ලා විසින් මේ සමාජයට, රත්නපුර දිස්ත්‍රික්කයට, ඒ වගේම මේ රටට කරන ලද්දා වූ සේවය පිළිබඳවයි. ඉතින් මම හිතන්නේ හැම කෙනෙකුගේම මුවින් පිටවුනා වගේ ඒක වචනයෙන් කියලා නිම කරන්න පුළුවන් මට්ටමක නෑ. අදත් මේ ඉතිහාසය තුළ මේ නම් සියල්ලම රන් අකුරින් ලියවිලා, මොනම අවස්ථාවක දී වුවත්, මොනම කාරණාවක දී වුවත් නිරන්තරයෙන් සිහියට නැගෙමින්, නිරන්තරයෙන් සිහිපත් කරමින් කටයුතු කරන නම් බවට මේ නම් පත්වෙලා තියනවා. ඉතින් ඒ නිසා මේ අවස්ථාවේ දී අපගේ ආරාධනාව පරිදි මේ සබරගමුව පළාත් සභාවේ හිටපු දිවංගත ආණ්ඩුකාරතුමිය, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමිය, හිටපු අමාත්‍යතුමියගේ ශෝක ප්‍රකාශ යෝජනාව මේ ගරු සභාවේ දී සාකච්ඡා වෙන අවස්ථාවේ දී මේ අවස්ථාවට සහභාගී වුන විශාඛා එල්ලාවල මැතිණිය, ඒ වගේම රාණි ඇල්ලෙපොල මැතිණිය, ඒ වගේම එරන්දනී

එල්ලාවල මැතිණිය, ඒ වගේම චන්දනී එල්ලාවල මැතිණිය ඇතුළු ඒ පවුලේ සියළුම ඥාතීන්ට අපේ ගෞරවනීය ප්‍රනාමය, ස්තුතිය මෙම ගරු සභාව විසින් ඉදිරිපත් කරමින් , විශේෂයෙන් මේ ගරු සභාවේ සියළුම මැති ඇමතිතුමන්ලා විසින් ඉදිරිපත් කරන ලද සියළුම ශෝක ප්‍රකාශ යෝජනා සියල්ලම ඔබතුමන්ලා වෙත ලැබීමට කටයුතු සළස්වන අතර, එතුමියට නැවතත් අප අතරම ඉපදීමට හැකියාව, ශක්තිය, ධෛර්යය ලැබේවා. අවසානයේ නිවන් සුව ප්‍රාර්ථනා කරමින් එතුමියට අපි මෙම ගරු සභාවේ ශෝක ප්‍රකාශය අපි මෙයින් අවසන් කරනවා. සියළුදෙනාටම ස්තුතියි !

**පොදු කටයුතු ආරම්භයේ දී දැනුම් දීමක් අවශ්‍ය නොවන යෝජනා : නැත**

**පොදු කටයුතු ආරම්භයේ දී දැනුම් දීමක් අවශ්‍ය යෝජනා :**

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
----------------------------------------------------------

මේ යටතේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා රුවන්වැල්ල පොදු සුසාන භූමිය පවත්වාගෙන යාම පිළිබඳව, ඒ වගේම දැරණියගල ප්‍රාදේශීය සභාවේ සති පොළ විධිමත්ව පවත්වාගෙන යාම පිළිබඳව, ඒ වගේම ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ මහජන පුස්තකාලය විධිමත් කිරීම හා පාලනය කිරීම පිළිබඳ, අතුරු ව්‍යවස්ථා ඉදිරිපත් කිරීමේ අවස්ථාව.

***ගරු ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත්***
***கௌரவ பிரதான அமைச்சர்***
*Hon.Chief Minister Mahipala Herath*
----------------------------------------------

ගරු සභාපතිතුමනි, මෙම ප්‍රාදේශීය සභා තුනේ රුවන්වැල්ල, දැරණියගල, ඉඹුල්පේ ප්‍රාදේශීය සභා සඳහා වූ අතුරු ව්‍යවස්ථා ගරු සභාවට ඉදිරිපත් කරනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
----------------------------------------------------------

ස්තුතියි ! ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද අතුරු ව්‍යවස්ථාවන් තුන ප්‍රධාන අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාව සඳහා යොමු කිරීමට කටයුතු කරනවා.

**පළාත් සභාවේ පොදු කටයුතු : නැත**

**පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු :**

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
----------------------------------------------------------

ගරු විපක්ෂනායක ඩබ්ලිව්.සෝමදාම මැතිතුමා විසින් ඉදිරිපත් කර ඇති යෝජනා

අංක 6/1/2016/12 දරණ යෝජනාව ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබාදෙනවා.

***ගරු විපක්ෂ නායක ඩබ්ලිව්.සෝමදාස***

***கௌரவ எதிர்க் கட்சித் தலைவர் டபிள்யு சோமதாச***

*Hon.Opposition Leader W.Somadasa*

------------------------------------------------------------

ගරු සභාපතිතුමනි, ඔබතුමාට ස්තුතියි ! සබරගමුව පළාතේ මාර්ගස්ථ ප්‍රවාහන අධිකාරියේ සේවකයින් අසූ දෙනෙක් පමණ සේවය කරයි. 2015 රජයේ සේවකයින්ට වැටුප් වැඩිවීමේ ප්‍රවනතාවය මත මෙම සේවකයින්ට රුපියල් 10,000 ක ජීවන වියදම් දීමනාව මෙතෙක් ලබාදී නොමැති බව මා වෙත දැන ගන්න ලැබී ඇත. සබරගමුව පළාත් සභාවේ එක් එක් ශ්‍රේණිධාරීන් සඳහා ලබාදෙන වැටුප් හා වියදම් හා අනෙකුත් දීමනාවලට සමාන්තරව මඟී ප්‍රවාහන අධිකාරියේ සියළුම සේවකයින් සඳහා රු.10,000 ක දීමනාව ද, හිඟ මුදල ද සමඟ ගෙවීම සුදුසු බවට ගරු සභාවට මම යෝජනා කරමි.

ගරු සභාපතිතුමනි, මම මේ යෝජනාව ඉදිරිපත් කරනකොට මම සබරගමුව පළාත් සභාවේ මාර්ගස්ථ ප්‍රවාහන අධිකාරියේ සාමාන්‍යාධිකාරීතුමාගෙන් ඉල්ලා සිටියා සේවකයින් ප්‍රමාණය සහ ඒ වගේම වියදම් කොපමණ ප්‍රමාණයක් වෙනවාද කියන එක. එතුමා මට ලබාදෙන්න කටයුතු කළා. සේවකයින් 82 ක් සහ සේවය කරන අතර 2015 වැටුප් වැඩිවීම අනුව රු.10,000 ක වැටුප් වැඩිවීමක් අවශ්‍ය බව යෝජනා කර ඇති, අධිකාරියේ දත්ත විශ්ලේෂණය කිරීමේ දී රු.6,000 ක වැටුප් වැඩිවීමක් ලබාදී ඇති බව මා වෙත ප්‍රවාහන අධිකාරියේ සාමාන්‍යාධිකාරී විසින් ලබාදුන්න වාර්තාවේ සඳහන් වෙනවා. ඒ අනුව ඉතිරි 4,000 ක වැටුප් වැඩිවීම මේ

සේවකයින්ට ලබාදීමට සුදුසු බව ගරු සභාවට මම යෝජනා කළේ. මෙම වාර්තාවේ සඳහන් ආකාරයට මාසික වැටුප් ගෙවීම ලක්ෂ 36 ක මුදලක් ද, අර්ථ සාධක අරමුදල සඳහා 447,000 ක මුදලක් ද , සේවක භාරකාර අරමුදල සඳහා 111,00 ක පමණ මුදලක් ද වැය වෙන බව වාර්තාවේ සඳහන් කරලා තියනවා. ගරු සභාපතිතුමනි, මෙහි ආදායම් ලැබෙන ආකාරය සඳහන් වෙලා නෑ. ඒ නොවීම නිසා නිවැරදි විශ්ලේෂණයක් කිරීමට හැකියාවක් අපට නෑ. ඒ නිසා මම මාර්ගස්ථ මඟී ප්‍රවාහන අධිකාරියට ලැබෙන ආදායම ගැන කොපමණක් ද යන්න පහත සඳහන් පරිදි විධිමත්ව ලබාදෙන ලෙස ගරු විෂයය භාර අමාත්‍ය, ප්‍රධාන අමාත්‍යතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා.

1. සබරගමුව පළාත් සභාවේ ලියාපදිංචි මාර්ග බලපත්‍ර ප්‍රමාණය ?
2. එහි මාසික ආදායම ?
3. බස්රථ පිවිසුම් බලපත්‍ර ආදායම?
4. ලොග්ෂීට් බලපත්‍ර ගාස්තු ආදායම ?
5. විශේෂ මාර්ග බලපත්‍ර ආදායම?
6. තාවකාලික බලපත්‍ර අවසර ආදායම ?
7. මාර්ග පරීක්ෂකයන් තුළින් ලැබෙන දඩ මුදල් ආදායම ?
8. ප්‍රවාහන අධිකාරිය සතු බස් නැවතුම්පළ කඩබඳු ආදායම ?
9. නව බස්රථ නැවතුම්පළ ඉදිකිරීමේ ක්‍රියාවලිය තුළින් වෙළඳසැල් ටෙන්ඩර් කිරීමෙන් ලැබෙන ආදායම ?
10. ප්‍රවාහන අධිකාරිය සතු ස්ථාවර තැන්පත් ඇති මුදල හා පොලී ආදායම ?
11. සුභ සාධක ගිණුමේ ශේෂය හා පොලී ආදායම ?

ගරු ඇමතිතුමා මෙතුමන්ලාගේ අනිත් කථිකයෝ කතා කරන්නේ නැහැයි කියනවා.

මෙම සභාවට ඉදිරිපත් කරන ලෙස මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. ඒ එක්කම සේවකයින්ට වැටුප් වැඩි කිරීමට නොහැකි බව පවසමින් වැඩි නොකරන අලුත් සේවකයන් අපට මේ ඉල්ලීම කරද්දී සේවකයන්ට වැටුප් වැඩි කිරීමට නොහැකි බව ප්‍රකාශ කළා. ඒ අනුව අපට ප්‍රශ්නයක් තියනවා. ඒ වැටුප් වැඩි කිරීමට බැරි බව ප්‍රකාශ කරලා සේවකයින් අලුතෙන් බඳවාගෙන තියනවා. එහෙම නම් වැටුප් ගෙවන්න බැරි නම් අලුතෙන් සේවකයින් බඳවා ගන්නේ කෙසේද කියන එකත් අපට ප්‍රශ්නයක් වෙලා තියනවා. ඒ එක්කම ගරු සභාපතිතුමනි, ප්‍රවාහන අධිකාරියේ තවමත් වංචාව, දූෂණය සිදුවෙන බව සේවකයින් ප්‍රකාශ කරනවා. ඒ අනුව සේවකයින් පෙන්වා දෙනවා මේ වංචාව, දූෂණය නැත්නම් අපට මේ දීමනාව ලබාදෙන්න පුළුවන්කමක් තියනවා. ආදායමක් ලැබෙනවා. මේ ගැන ගරු සභාවට යොමු කරන්න කියලා ඉල්ලීමක් කරනවා. ඒ ඉල්ලීම අනුව තමයි අද මෙම මේ ගරු සභාවට මේ ඉල්ලීම කළේ. මම බලාපොරොත්තු වෙනවා මම මේ කියපු ආකාරයට විෂයය භාර අමාත්‍යතුමාගෙන් මට මේ තොරතුරු ලබාදෙන්න කියලා ඉල්ලනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
------------------------------------------------------------

ස්තූතියි , ගරු ප්‍රධාන අමාත්‍යතුමා තප්පරයක් ඉන්න. දැන් මේ යෝජනාව සඳහා තවත් කතා කරන්න කියලා අජිත් කුමාර මැද්දෙගම මැතිතුමාත්, සිරිල් පල්ලේගම මැතිතුමාත් ,විපක්ෂයේ ප්‍රධාන සංවිධායක සිරිපාල කිරිඇල්ල මැතිතුමාත් වෙලාව ඉල්ලලා තියෙනවා. කතා කරන්න අවශ්‍යද. නැත්නම් මෙතුමා කතා කරන්නද, හොඳයි විපක්ෂනායකතුමා ඉදිරිපත් කරපු යෝජනාව සම්බන්ධයෙන් කතා කරන්න අවස්ථාව ඔබතුමාට තියෙනවා.

***ගරු ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත්***
***கௌரவ பிரதான அமைச்சர்***
*Hon.Chief Minister Mahipala Herath*
------------------------------------------

ගරු සභාපතිතුමනි මම අපේ ගරු විපක්ෂනායක සෝමදාස මැතිතුමාට ස්තුතිවන්ත වෙනවා මොකද මේ සේවකයන්ගේ වැටුප් වැඩි කර ලබාදීමටත් ඒවගේම මේ ආයතනයේ ආදායම් තත්ත්වයන් පිළිබඳ විස්තරත් ඉල්ලමින් කතා කිරීම ගැන.

ඒත් එක්කම මම කණගාටු වෙනවා මේ ප්‍රවාහන අධිකාරියක් බොහොම හොඳ ඉතිහාසයක් තියෙන එකක් මේක වර්තමානයට ගෙනල්ලා තියෙන තත්ත්වයට දූෂණ හා වංචා අපි අවම කරමින් කටයුතු කරමින් තිබියදී සමහර විට ඒවා තියෙනවා කියන චෝදනාවත් එක්ක ඉදිරිපත් කිරීම ගැන.

ගරු සභාපතිතුමනි මම මේ ප්‍රවාහන අමාත්‍යාංශය භාර ගන්න අවස්ථාව වෙන කොට වැටුප් තිබුණේ රු 7800/- ට ඉතාමත් දීමනා රහිත දීමනාවක්. මේක රු.12000/- ට අධික වැටුපක් දීමනාත් සමඟ අපි ඇති කළා. එතන ඉඳලා මේ දක්වා අද වෙන කොට කෙටියෙන් කතා කරන්නේ ගරු සභාපතිතුමනි. ප්‍රවාහන අධිකාරියේ අන්තිම සේවකයා ගන්න වැටුප රු.20000/- කට වැඩි

මුදලක් අද ලබා ගන්න ආයතනයක් බවට මේ ආයතනය පත් කරලා තියෙනවා. මේ

ආය ආයතනයේ නිළධාරීන් සේවකයන් 182 ක් සඳහා මේ ආයතනයේ පැවැත්මට බස් රථ වලින් ලබා ගන්නා වූ විවිධ බලපත්‍ර සහ අනිකුත් ගාස්තුන් පමණක්ම අපි ප්‍රයෝජනයට ගන්නේ නම් මේ වැටුප් ගෙවා ගන්නවත් ආදායමක් නොලබන ආයතනයක් හැටියට තමයි ප්‍රවාහන අධිකාරිය මේ පළාත් සභාව තුළ පමණක් නොව පළාත් නවයේම අද මේ තත්ත්වයට පත් වෙමින් පවතින බව අතිගරු ජනාධිපතිතුමා සමඟ කරන ලද සාකච්ඡාවේදී විශේෂයෙන්ම මධ්‍යම පළාතේ අපේ ප්‍රවාහන අමාත්‍යතුමා මේ වැටුප් ගෙවීම සඳහා භාණ්ඩාගාරයෙන් හැම පළාතටම මුදල් ප්‍රමාණයක් ලංකා ගමනා ගමන මණ්ඩලයට මෙන් ලබා දෙන ලෙසත් ඉල්ලන්නට අද මේ පළාත් සභාවල ප්‍රවාහන අධිකාරිය පවත්වාගෙන යාමේදී අද අපිට ඇති වෙලා තියෙන සිද්ධාන්තයක්. ඒ අතරතුර ඒ කටයුතු කෙසේ වෙතත් මෙම නිළධාරීන් සහ සේවකයිනුත් මනුස්සයන් ලෙස ජීවත්වීම සඳහා අනුමත වැටුප් ප්‍රමාණයක් ලබාදීම සඳහා අපි වරින්වර වැටුප් වැඩි කරමින් තමයි මේ අවම වැටුප රු.20000/- කට ආසන්න මුදලකට ගෙනල්ලා තියෙන්නේ. දැන් එතුමා කියන රු.4000/- ලබාදීම සඳහා මේ ආකාරයට ආදායම් අපිට ලබා ගන්නට හැකි ද නැද්ද යන්න මං හිතන්නේ විගණන වාර්තාව බලන්නේ නම් මේ විස්තර නොඉල්ලුවත් අපේ ගරු විපක්ෂනායක තුමාට මේ ආයතනයේ තත්ත්වය හොඳාකාරවම අවබෝධ කර ගන්නට පුළුවන් ඒක කියවන්නට පුළුවන් නම් . ඒකේ තියෙනවා මේ විස්තර ඔක්කෝම මේ විගණන වාර්තාවත් වාර්ෂිකව ලබා දෙන්නේ විගණනයෙන් පසුවයි. ඒකේ තියෙනවා. ඒ නොතිබුණත් නොකිය වුවත් එතුමා කරන ලද ඉල්ලීම් මම එතුමාගේ ඉල්ලීම අනුව සභාවට ලබා දෙන්නට ඕනම අවස්ථාවක සූදානම් මෙහි සැඟවිය යුතු කිසි දෙයක් නැත.

ගරු සභාපතිතුමනි මම මේ අමාත්‍යාංශය භාර ගන්නා අවස්ථාව වෙන කොට මේ දැනත් දූෂණ,වංචා නැතෙයි කියන්නේ නෑ මම. මොකද මේ බස් නැවතුම් පොළවල ඉන්න එතන ධාවන සටහන්කරුවන් එහෙමත් නැත්නම් ස්ථාන භාර නිළධාරීන් විවිධාකාරයේ දූෂණ ක්‍රියාවලියේ යෙදෙනවා. ඒවා මීට පෙර තිබුණ ප්‍රමාණයටත් වඩා අධික නිසා මම මේ පළාත් සභාවේ ප්‍රවාහන අමාත්‍යාංශයේ හිටපු නිළධාරීන් ගණනාවක් ඉවත් කරලා අද අපේ පළාත් සභාවේ රාජ්‍ය පළාත් නිළධාරියෙක් තමයි මෙහි සාමාන්‍යාධිකාරීතුමා හැටියට පත් කරලා තියෙන්නේ. අද මෙහි සභාපති අද නීතිඥ වෘත්තියේ යෙදෙන තරුණ උගත් නීතිඥ මහත්මයෙක්. එවැනි තත්ත්වයකට යම් ආකාරයක මේ ආයතනය උසස් තත්ත්වයකට ගෙන ඒම සඳහා ඒ පැරණි තිබුණ තත්ත්වයන් වලින් මඟ හරවා ගනිමින් බස් රථ බලපත්‍රයක් දෙන කොට ලක්ෂ තුනේ ඉඳලා පහ, දහය දක්වා ගත්ත මුදල් ප්‍රමාණයන් ඒවා සියල්ල අපි සුණු විසුණු කරලා දාලා අද බස් රථ ප්‍රමාණය බලපත්‍ර නොදෙන තත්ත්වයට ගෙනල්ලා තියෙනවා. හැමදාම බදාදා දවසට අඟහරුවාදා දවසට මගෙන් බලපත්‍ර ඉල්ලන්න විශාල ප්‍රමාණයක් එනවා ගරු සභාපතිතුමනි. අපිට මුදල් හම්බ කිරීමේ චේතනාවෙන් සහ දූෂණ කටයුතු කිරීමේ චේතනාවෙන් මේ ආයතනය පවත්වාගෙන යනවා නම් මං හිතන්නේ ඕන තරම් ඒ පසුගිය කාලවල්වල වගේ වැඩ කරන්නට තිබුණා. ඒවා සියල්ල නවත්තලා අද පුළුවන් නම් අපි එහෙම කෙනෙකුට ඔප්පු කරලා පෙන්වන්න කටයුතු සිදු නොවන ආයතනයක් බවට අද මේ ආයතනය ගෙනල්ලා තියෙනවා. ඒක නිසාම තමයි අපිට පුළුවන් වුණේ මේ සේවක නිළධාරීන් සඳහා මෙවන් වැටුප් ප්‍රමාණවයක් වැඩි කරන්නට. ඒ නිසා මම අපේ ගරු විපක්ෂනාකතුමාට ඉතා ඕනෑකමින් මම කියනවා ඒ තොරතුරු වාර්තා මම දෙනවා. ඒ එක්කම ඔබතුමන්ලාට පුළුවන් නම් අපිට

රජයෙන් අපිට භාණ්ඩාගාරයෙන් යම් මුදලක් ලබා දෙන්න. එතකොට ගරු සභාපතිතුමනි අපිට මේ වැඩි කරන ලද රු.10000/- දීමනාවේ ඉතුරු රු.4000/- දෙන්නට පුළුවන්. අපි මේ මුදල දෙන්නට කැමතියි. හැබැයි මේ මුදල අපි දෙන්නේ මේ උපයා ගන්නා මුදල් වලින් නොව මගේ කාලයේ මේ දිස්ත්‍රික්ක දෙකේම බස් නැවතුම් පොළවල් වෙළඳ සංකීර්ණත් සමඟ ගොඩ නගලා ඒ වෙළඳ සංකීර්ණ වලින් ලබා ගන්නා මුදල් ස්ථිර තැන්පතුවල දමලා ඒවායෙන් ලබා ගන්නා පොළී ප්‍රතිශතයන් වලින් තමයි සභාපතිතුමනි අපි අද මෙවැනි වැටුප් ලබා දෙන්නත් කටයුතු කරලා තියෙන්නේ. මේක යම්කිසි සැලැස්මක් ඇතුව ඉදිරි ගමනක් තුළ ඕන කෙනෙකුට භාර අරගෙන කටයුතු කරන්න පුළුවන් පිරිසිදු ආයතනයක් බවට අද මගී ප්‍රවාහන අධිකාරිය අද පත් කරමින් යනවා. මේ මෑතකදී අතිගරු ජනාධිපතිතුමා අපිට කැඳවලා සභාපතිවරු කැඳවලා මේ බස් නැවතුම් පොළවල්වල ඇති වෙන දූෂණ ක්‍රියා පිළිබඳව කතා කළා.

එවැනි මට්ටමකට අද රජය ජනාධිපතිතුමා අපිව මෙහෙයවමින් කටයුතු කරපු කාල වකවානුවක්.

ඒවගේම ඒ තුළින් ඇති විය යුතු විනිවිද පෙනෙන සුළු ස්වභාවයක් තුළ ගෙන යාම සඳහා හැම අවස්ථාවකම ගරු සභාපතිතුමනි මේ ආයතනය අපි කිසිම බලපෑමකින් තොරව කටයුතු කර ගැනීම සඳහා අපි කටයුතු කරලා තියෙනවා. එම නිසා ඔබතුමා වැටුප් වැඩි කරන්න කියන එක ගැන මම සතුටු වෙනවා. නමුත් ඒ සඳහා මුදල් ප්‍රතිපාදන සොයා ගැනීමේදී මේ ආයතනය අපිට පවත්වාගෙන යන්නට නොහැකි තත්ත්වයක් තුළ සේවක සංඛ්‍යාව සියල්ල අඩු කරමින් අපිට වැටුප් වැඩි කරන්නට තමයි සිද්ධ කරන්නට ලැබෙන්නේ. නමුත් හැම කෙනෙක්ම ජීවත් වෙන්න තමයි මේ රැකියාවක් සොයා ගෙන එන්නේ. ඒ නිසා කාගේවත් රැකියාවල් අපි කොයි මොහොතකවත් අපි ඒ අය ඉන්න ස්ථාන වලින් ඉවත් කිරීමට අපි සූදානම් වෙලා නෑ. අපි බලන්නේ ඒ අයගේ ස්ථිර තමන්ගේ ජීවන තත්ත්වය සඳහා රැකියාව ආරක්ෂා කර දෙන්නට තමයි. දැනටත් මම බලාපොරොත්තු වෙනවා කලවාන බස් නැවතුම් පොළ එදිනෙදා අපි බලාපොරොත්තු වුණා පල්ලේබැද්ද ඒක අපිට අපහසුතාවයට පත් වුණා ජනතා විරෝධයක් ඇවිල්ලා එතන සුදුසු නෑ කියලා. නමුත් කලවාන බස් නැවතුම් පොළ සංකීර්ණයක් හැටියට මාවනැල්ල පැල්මඩුල්ල වැනි නගර වලත් අපි මෙවැනි දේවල් ඉදි කරලා මේ තුළින් ලැබෙන ආදායම අපි විශේෂයෙන්ම මේ සේවක නඩත්තුව නිළධාරී නඩත්තුව සඳහා මේ ආයතනයේ පැවැත්මට ඉදිරියට ගෙන යාමට ඉදිරියටත් කටයුතු කරන බව ප්‍රකාශ කරමින් මම ඉතාමත් ඕනෑකමින් නැවත වරක් අපිට අද සිද්ධ වෙලා තියෙනවා මේ ආයතනත් ලංකා ගමනා ගමන මණ්ඩලය වගේ පවත්වාගෙන යාමට ජනතා සේවයක් නිසා අපිට රජයේ සහයෝගයත් ලබා දෙන්නට කටයුතු කරන්නට කියලා අපි විශේෂයෙන් විපක්ෂනායකතුමාගෙන් ඉල්ලා සිටිමින් ගරු සභාපතිතුමනි මේ අවස්ථාව ලබාදීම ගැන ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසාන් කරනවා.

ගරු ***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

------------------------------------------------------------

ස්තුතියි ගරු මහීපාල හේරත් මැතිතුමාට. ගරු ඩබ්.සෝමදාස විපක්ෂනාකතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවට අදාල අවශ්‍ය සියළු තොරතුරු

එතුමාටත් එතුමාගේ අමාත්‍යාංශයේ ලේකම්තුමාටත් යැවීමට අපි කටයුතු කරනවා.

**සභාව කල් තැබීමේ යෝජනාව :**

***ගරු සභානායක අසෝක ජයවර්ධන මැතිතුමා.***
***கௌரவ அ.கட்சி அமைப்பாளர் அசோக ஜயவர்தன***
*Hon.Gov.Whip Asoka Jayawardane*
------------------------------------------------------------

ගරු සභාපතිතුමනි, මෙම ගරු සභාව 2016 ඔක්තෝබර් 11 වෙනි දින දක්වා කල් තබන ලෙස මම යෝජනා කරනවා.

**සභාව කල් තබන අවස්ථාවේ යෝජනා :**

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
------------------------------------------------------------

ගරු සලිත කරුණාරත්න මන්ත්‍රීතුමාට අවස්ථාව.

***ගරු මන්ත්‍රී සලිත කරුණාරත්න***
***கௌரவ உறுப்பினர் சலித கருணாரத்ன***
*Hon.Member Salitha Karunaratne*
------------------------------------------------------------

ගරු සභාපතිතුමනි, මගේ යෝජනාව කුරුවිට කුඩා නගර ජල සම්පාදන ක්‍රමය පිළිබඳව. කුරුවිට නගර ආශ්‍රිතව පවුල් 2000 කට පමණ ජලය ලබාදෙන්නේ කුරුවිට කුඩා නගර ජල සම්පාදන ක්‍රමයෙන්. මේක කුරුවිට කුඩා නගර ජල ව්‍යාපෘතිය කියලා තිබිලා මම සභාපතිවරයා වශයෙන් ඉන්න කාලයේ දී මේක ප්‍රාදේශීය සභාවට පවරාගෙන ඉතා විධිමත්ව ප්‍රදේශවාසීන්ට ජලය ලබාදුන්නා කිසිම ගැටළුවකින් තොරව සහ ජලය දියහැකි ධාරිතාවයේ ප්‍රමාණයට තමයි අපි ජලය ලබාදුන්නේ. හැබැයි පසුකාලීනව දියහැකි 1500 අභිබවා දෙදහස් ගාණකට ජලය දෙන්න ගිහිල්ලා සහ ජලය ලබාදීම සඳහා අවශ්‍ය කරන යන්ත්‍ර සූත්‍ර මිළදී ගන්න ගිහිල්ලා අද ඉතාමත් අවුල්සහගත තත්ත්වයකට පත්වෙලා තියනවා. ඒ අනුව අද වෙනකොට කුරුවිට නගර ආශ්‍රිතව දෙදහසකට පමණ බරපතල ජල ගැටළුවකට මුහුණ දෙන්න සිද්ධ වෙලා තියනවා. විශේෂයෙන් මේ පායන කාලයේ එතකොට තමුන්ගේ ගෙවල්වල තියන ලිංවල වතුර ඇත්තේම නෑ. අනෙක් එක ජල සම්පාදනයෙන් ජලය දීපු හින්දා මිනිස්සු පරිභෝජනය කළේ, බොන්න ගත්තේ, අනෙක් දේවල් කළේ ඒ ජල සම්පාදනයෙන් ලබාදීපු වතුර වලින්. අද වෙනකොට ඒ වතුර නොලැබෙන හින්දා අද කුරුවිට ප්‍රදේශයේ බරපතල පානීය ජලය ගැටළුවකට පත්වෙලා තියනවා.

ගරු සභාපතිතුමනි, එතකොට ඒ තිබුණ අවුල්සහගත තත්ත්වය හින්දා මේක ජල සම්පාදන මණ්ඩලයට පවරා ගන්න කියලා යෝජනාවක් ඇවිල්ලා තියනවා. ඒකට ගැටළුවක් නෑ. හැබැයි ඒ ජල සම්පාදන මණ්ඩලයට පවරා ගන්න කල් අතර කාලයේ දී මේ පායන කාලයේ දී කුරුවිට මිනිස්සුන්ගේ වතුර ප්‍රශ්නයට උත්තරයක් ඕන. ඒ හින්දා ගරු සභාපතිතුමනි, ඒ වැරදි කරපු මිනිස්සුන්ට, ඒ නිළධාරීන්ට හරි ඒ අදාළ අයට දඩුවම් දෙන එක කළාට ගැටළුවක් නෑ. ඒවා කරන ගමන් කුරුවිට මිනිස්සුන්ගේ ජල ප්‍රශ්නය විසඳාගන්න විශේෂයෙන් පියවර ගන්න ඕන. ඒ හින්දා ගරු සභාපතිතුමනි, ඉතාමත් ඕනෑ කමින් ඉල්ලා

සිටිනවා කඩිනමින් කුරුවිට ජල සම්පාදන ක්‍රමයේ නිළධාරීන්, පළාත් පාලන ආයතනයේ නිළධාරීන් කැඳවලා සාකච්ඡාවක් කරලා කඩිනමින්ම ඒ මිළදී ගැනීම් කරලා හරි කමක් නෑ අවශ්‍ය උපකරණ අරගෙන කඩිනමින් කුරුවිට මිනිස්සුන්ගේ වතුර ප්‍රශ්නය විසඳා ගන්න ක්‍රියා මාර්ග ගන්න ඕන කියන යෝජනාව කරනවා. බොහොම ස්තුතියි !

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------------------

ස්තුතියි ! ගරු සලිත කරුණාරත්න මන්ත්‍රීතුමාට. ඔබතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව අදාළ අය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරමින්, ඒ සඳහා අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරනවා.

මීළඟට ගරු මන්ත්‍රී ආරියවංශ බාලසූරිය මැතිතුමා.

***ගරු මන්ත්‍රී බී.ආරියවංශ***
***கௌரவ உறுப்பினர் பீ.ஆரியவங்ஷ***
*Hon.Member B.Ariyawansha*
--------------------------------------------

ගරු සභාපතිතුමනි, සභාව කල් තබන අවස්ථාවේ දී යෝජනා වශයෙන් යෝජනා කීපයක් මේ අවස්ථාවේ දී යෝජනා කරනවා. ගරු සභාපතිතුමනි, මේ දිනවල පවතින අධික නියඟයත් සමඟ සෑම මැතිවරණ කොට්ඨාශයකම විශාල ජල හිඟයක් පවතිනවා. ඒ නිසා මම නියෝජනය කරනා කොලොන්න මැතිවරණ කොට්ඨාශය තුළ මේ වෙනකොට කිලෝ මීටර් දෙක තුන ගිහිල්ලා තමයි ජලය සපයා ගන්නේ. පානීය ජලය ඒ වගේම තමන්ට අවශ්‍ය කරන ජලය සපයා ගන්න විශාල වෙහෙස මහන්සියක් දරනවා. මේ වෙනකොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් යම් ප්‍රමාණයකට ජලය බෙදා හරින්න බවුසර් මඟින් කටයුතු කළත් මේ වෙනකොට ප්‍රමාණවත් නෑ. විශාල ගම්මාන රාශියකට මේ ජල හිඟය පවතින නිසා අද දිය උල්පත් සියල්ලක්ම සිඳී ගිහින් විනාශභාවයට පත්වෙලා තියනවා. එමනිසා මම මේ අවස්ථාවේ දී ඒ ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් ජලය ලබාදීම සඳහා යම් වැඩ පිළිවෙලක් මේ වැස්ස වසිනතුරා හෝ ලබාදෙන්න කියලා මම මේ අවස්ථාවේ යෝජනා කරනවා.

ඒ වගේම තමයි මේ අධික නියඟයත් සමඟ අපි ගියා ගම්වලට. අපි දැක්කා ඒ ප්‍රදේශයේ තියන කුරුඳු, ගම්මිරිස්, ඒ වගේම තේ අක්කර ගණන් මේ වෙනකොට වේලිලා ගිහිල්ලා, මැරිලා විනාශ වෙලා ගිහිල්ලා තියනවා. එමනිසා ඒ ප්‍රදේශයේ ජනතාවගේ තියන එකම ආදායම තමයි තමන්ගේ වත්තේ හිටවාගෙන තියන කුරුඳු ටික, ගම්මිරිස් ටික, ඒ සුළු අපනයන භෝග, තේ පැල. මේවායෙන් තමයි තමන්ගේ ජීවිතය ගැටගහගෙන යන්නේ. එමනිසා ගරු සභාපතිතුමනි, මම මේ අවස්ථාවේ දී යෝජනා කරනවා මේ අයට මේ තමන්ගේ වගා විනාශ වෙන වගාවන් සඳහා යම් ආධාර මුදලක් අපි පළාත් සභාව මඟින් හෝ ඒ ආයතන මඟින් ලබාදීම සඳහා අවශ්‍ය කටයුතු සළස්වා දෙන්න කියලා මම මේ අවස්ථාවේ දී යෝජනා කරනවා.

ඒ වගේම තමයි ගරු සභාපතිතුමනි, මම තව යෝජනාවක් ඉදිරිපත් කරනවා. ඇඹිලිපිටිය කඳුරුගස්ආර හන්දියේ සිට කඩදාසි කම්හල හන්දිය හරහා කුට්ටිගල, තෝරගල කියන ටික විශාල පිරිසක් ගමන් කරනවා. මේ

වෙනකොට බස් රථයකුත් ඒ මාර්ගයේ ගමන් කරනවා. මේ මාර්ගය ඉතාම අබලන් මාර්ගයක් බවට පත්වෙලා තියෙන්නේ. ප්‍රදේශයේ ජනතාවට තමන්ගේ එදිනෙදා කටයුතුවලට මෙම මාර්ගය භාවිතා කිරීමේ දී විශාල ප්‍රශ්න රාශියකට මුහුණ දෙනවා. මේ දවල්වල ඒ මාර්ගයේ යන්න බෑ , දූවිල්ල, වළවල්. ඒ වගේම වහිනකොට විශාල මඩවගුරු බවට මේ මාර්ග පත්වෙනවා. එමනිසා ගරු සභාපතිතුමනි, මේ මාර්ගය මේ වෙනකොට ප්‍රාදේශීය සභා මාර්ගයක් බවට තමයි තිබෙන්නේ. එමනිසා මේ සබරගමුව පළාත් සභාවට මේ මාර්ගය පවරාගෙන එහි සංවර්ධන කටයුතු ඉදිරියේ දී කරදෙන මෙන් මම මේ අවස්ථාවේ දී යෝජනාවක් වශයෙන් ඉදිරිපත් කරනවා. ස්තුතියි !

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

-----------------------------------------------------------

ස්තුතියි ! ගරු ආරියවංශ බාලසූරිය මැතිතුමනි. මීළඟට රංජිත් පොල්ගම්පල ගරු මන්ත්‍රීතුමා.

***ගරු මන්ත්‍රී රංජිත් පොල්ගම්පොල***
***கௌரவ உறுப்பினர் ரஞ்சித் பொல்கம்பொல***
*Hon.Member Ranjith Pollgampola*

-----------------------------------------------------------

ගරු සභාපතිතුමනි, දැරණියගල ප්‍රාදේශීය සභාවේ පොදු වැසිකිලි සම්බන්ධව ගැටළුවක් ඇති වුනා. ඒ වෙලාවේ අපේ විෂයය භාර ඇමතිතුමාවත් නොදැන දැරණියගල ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමිය ජලයයි, විදුලියයි විසන්ධි කරලා දැරණියගල ජනතාව විශාල අසරණ තත්ත්වයකට පත්වුනා. නමුත් අද දින ප්‍රධාන ඇමතිතුමාට ඒ බව දැන්වූවාට පස්සේ ප්‍රධාන ඇමතිතුමා වහාම ඒ ජලය සහ විදුලිය ලබාදීලා ඒ ප්‍රශ්නය විසඳීම සම්බන්ධයෙන් දැරණියගල ජනතාව වෙනුවෙන් ප්‍රධාන ඇමතිතුමාට අපේ ගෞරවනීය ප්‍රනාමය මේ අවස්ථාවේ දී පුද කරනවා. ස්තුතියි !

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

-----------------------------------------------------------

ස්තුතියි ! ගරු රංජිත් පොල්ගම්පල මැතිතුමාට. ඔබතුමා ඒ අවශ්‍ය තොරතුරු ලබාදෙන්න ප්‍රධාන ඇමතිතුමාට. ඒ අනුව ඒ අවශ්‍ය පිළිතුරු ලැබෙයි.

දැන් වේලාව මධ්‍යාහ්න 12.54 යි. අද දිනට මෙම ගරු සභාවේ වැඩ කටයුතු අවසන් කරනවා. මෙම ගරු සභාව 2016 ක් වූ ඔක්තෝබර් මස 11 වෙනි දින පෙරවරු 10.00 දක්වා කල් තබනවා.

අත්/කළේ :

කංචන ජයරත්න,
සභාපති,
සබරගමුව පළාත් සභාව.

පාලිත නානායක්කාර,
සභා ලේකම්,
සබරගමුව පළාත් සභාව.

2016 ක් වූ ඔක්තෝබර් මස 20 වෙනි දින,
සභා ලේකම් කාර්යාලයේ දීය.